ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 මැයි 24 වන බදාදා
3 කාණ්ඩය 25 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක් නොමිලේ

## එපා දරුවන් මඟ දමා යන්නට, ගීතා කවුළුවක් හදන්න යයි

## හස්බන්ඩ්ගෙ මූණත් නැන්දම්මාගෙ මූණ වගේම නිසා ලේලිට වහ කන්න හිතිලා

## නෝටි ෆෝටි වලට කිට්ටු වෙද්දී ගැහැණු බලා ඉද්දී හැඬ වෙන්නේ ඇයි?



පෙම්ණි අසංශා ජයලත්

ඡායාරූප
ප්‍රදීප් දඹරගේ

# කවි යාය

සංස්කරණය **ලිහිණි මධුෂිකා**

## මේවා ඇත්තද?

ගස් තිබුණත් හැම ගහේම මල් පිපෙන්නෙ නැත
මල් පිපුණත් හැම මලකම සුවඳ ඇත්තෙ නැත
සුහද සිතැති මනුස්සයෝ අපට නැත්තෙ නැත
ඇසුරින් පමණයි අඳුනාගත හැකි ඒ සිත

සිනා මුහුණ පෙන්වා බස් දෙඩනා අය ඇත
ඒ බස්වල රැඳුන රසය හැමවිට සුබ නැත
රස කර කර කියන කතා ඕනතරම් ඇත
ඒ රස තුළ ඇතැම් විටෙ තිත්ත රසත් ඇත

අරය එහෙම කිව්වත් එහි ඇත්තක් නෑ නේද
ඒ වෙලාවෙ කිසිවකු එය දැකලත් නෑ නේද
නොදැකපු දේ රස කර කවි කීමත් හොඳ නේද
කවියකුගේ කවි පදයට දිරියක් එය නේද

කවිකම හැම හදවතකම පිහිටන්නේ නැත
කුරිරු හදක් තුළ රස කවි උපදින්නේ නැත
උපත ලදත් ඒ කවියේ ජීවය දිග නැත
සුළඟ වගේ ඒ කවි කිසි සිතක රැඳෙන් නැත

කවියෝ කිසිදු වයසට යන්නේ නම් නැතිලූ
වයස මෝරලා යන විට කවිය තරුණ වේලූ
තරුණ සිතේ ජනිත කවේ රස වැහෙනවාලූ
ඒ රසයේ රස කීමට කිසිවකු දන්නැතිලූ

**ඩී.පෙරේරා**
**වෙන්දේසි වත්ත**
**රාගම**

## හිඩස

සරදමට මෙන් එද ඔබ
පන්තියේදී දමා ගැසූ
කොළගුලියේ තිබූ
කවියේ විලසට
දිනන්නම් සරසවි පෙළ
තරණය කරන්නම් හන්තාන
අත් අල්ලාගෙන වෙන්නම්
ඔබෙ පෙම්බර බිරිඳ
උයා පිහා දෙන්නම්
බත්පත
සෝදා වියලා දෙන්නම්
රෙදිපිළි
මිහිපිට ඇත්තක් වුණේ කෙලෙසද
ඒ කවිය
කුඩුම්බිය අපේ රක්ෂා කිරීමට
ඔබ විදි දුක් කරදරවල
හැඩතල
විහිදී පෙනේ සිතුවමක් සේ
ඔබෙ උවග මත
අප හඬන කල
අප දිරිමත් කළ
අපේ කඳුළු පිස දැමූ ඔබ
අද කඳුළු වරුසාවක් සේ
ඔබ නිසල ගත තෙත් කරද්දී
ඇයි ඔබ නිහඬ
සොඳුරිය කෙලෙස මම
වියපත්ව ඉතිරි කාලය
ඔබ නොමැතිව ගෙවා දමන්නේ

**එම්.එම්.එස්.ගුරුසිංහ**
**බියගම පාර**
**කැලණිය**



## මවුනි සුපින්බර

කහමල් ඉත්තක - රුව සිහි ගන්වන
ඒ මල් සුවඳින් - සොම්ගුණ වස්සන
පින්බිම සරසන - සඳ සුපින්බර
ගරුතර මෙහෙණින් - දසුනකි ලස්සන

ගිනිගත් හදවත් - සිසිලෙන් නාවා
ගිලන් සිතට - දිව ඔසුවක් වූවා
සිත් සනහාලන - බුදු රුව ගාවා
සත වෙත ලොව්තුරු - සුව ගෙන ආවා

තරු පිරිවර මැද - පුන්සඳ වැන්නේ
මවුනි ඔබේ - මුදු වත බබළන්නේ
අරමෙහි කිතුගොස - දසත නැගෙන්නේ
මවුනි, ඔබෙනි - පන්නරය ලබන්නේ

සිත් සනහාලන - සමිඳු බෙලෙන්
ජයසිරි මහ බෝ - සමිඳු බලෙන්
සුමන සමන් දෙවි - රැකවරණෙන්
මවුනි දිනේවා - ඔබ නිදුකින්

**බී. සෝමරත්න**
**ගිනිගත්හේන**

## වසන්තයක්

වසන්තයක්
යළි ආවොත්
මම නාවත්
මට පුළුවන්
මගේ හැඟුම් ඔබට දෙන්න

වසන්තයෙන්
ඔබ අහන්න
අපි දෙන්නට වැරදුණ තැන්

එතැන ඉඳන්
ආයෙත් එමු
අලුත්වෙලා අපි දෙන්නම

ඒ එන මග පෙරදු මෙන්
වෙන්ව යන්න
සිදුවූවොත්

ගිව්සාගමු කිසිමදක
පෙම්වතුන් වෙලා
හමු නොවන්න

**සමන් සුරවීරආරච්චි**
**රඹුක්කන**



## ආවර්ජනා

සඳඑළිය වැටෙනවිට
දෙර කවුළු වැසෙනකොට
මගේ සිත නිදි නැතිව
සොයනවා අපෙ මතක

සිතුවම්පට ලෙසින්
සිත මවයි රූ රටා
අතීතය වෙත ගොසින්
නැවත නැවතත් සිතමි
වැරදුණේ කොතැනකද

සොඳුරු තැන් අපෙ ලොවේ
එකිනෙකට පරයමින්
නැගෙයි මා මනස තුළ
උතුර උතුරා ගලන
දිය උල්පතක් සේ

තනිව ඉන්නා විටදි
නිදියහනෙ සැතපිලා
මා දමා නුඹ ගියද
ඉතිරි කර මතකපොත

ඔහුගේ ආදර ලොවේ
රජින වී නුඹ සිටී
ආදරේ කළ පවට
තනිකඩව මා සිටී

**කුමාරි ලියනගේ**
**වතුරකුඹුර**

## පොඩි හාමුදුරුවනේ

බෝලෙට පින්තට සමුදී
සෙල්ලම් බඩු අඬයි රිදී
වැලි පොල්කටු පේළි සැදී
සැම දෙන දැන් ඔබට වඳී

සොම්නස උතුරය ගලා පොදී
මගෙ හද තුළ නමට වදී
කුමටද තණ්හා හිතේ රැදී
ආශා හැඟුමන් සැම විහිදී
තිබුණත් මොනවා සැමට දිදී
සැනසූ හැටි උණුසුමට රැදී
මතකයි ඇත දැන් කඳුළු සිදී
කහවත පොරවා වටිනා විටදී
මඟමොක් සුව සොයමින් නමදී
දෝතින් දෝතට සාදු දිදී

**සාම විනිසුරු**
**කුසුමා දිසානායක**
**කරන්දෙණිය**

## තරහවෙන්න එපා කිටී

| | |
|---|---|
| රැවුල් මුහුණ බුම්මාගෙන නුඹ ඉන්නා | හැටී |
| නුඹටත් මට මෙන් තනිකම දැනෙනවාද | කිටී |
| දරුවන් සමඟින් මගෙ නුඹ සෙල්ලම් කළ | හැටී |
| මතක් වෙලා මටත් හොරෙන් අඬනවාද | කිටී |
| දුකට සැපට හැමදේටම නුඹ මා ළඟ | තියා |
| වියතුන් වෙන්නට දුරු රට මගෙ දරුවන් | ගියා |
| 'ෆ්‍රයිඩ් රයිස්' වෙනුවට අද 'සාල බතක්' | උයා |
| කන්නට දෙන්නම් රස කර කාපන් ඇස් | පියා |
| තරහවෙන්න එපා නුඹට අකුරු කියල දෙන්නේ | නෑ |
| ළඟ තිබුණත් ඉස්කෝලෙට නුඹ යවන්නෙ | නෑ |
| පංති යවලා අමතර තව උගන්වන්නෙ | නෑ |
| එහෙම කළොත් මං තනිවෙයි නුඹත් ඉන්නෙ | නෑ |

**දයා දිසානායක**
**ලෙනදොර**

## පෙම්වතින් වෙමු අප හෙටත්

දුක හිතෙන පෙම් කතාවට අපේ
තිබේ දුර ඉතිහාසයක්
හිමි නොවුවද සුහද ඔබ මට
නැත කිසිත් අමනාපයක්
එද විඳ හුරු පුරුදු සුවඳක්
ගතේ දැවටී ඇත අදත්
එක් නොවුවද එකට ඉන්නට
පෙම්වතුන් වෙමු අප හෙටත්

**සුමේධා රමණී ගුණවර්ධන**
**පස්සර**

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

**බස් හෝල්ට්වල, කෝච්චි පෙට්ටිවල දමා ගිය බිලිඳුන් ගැන අසන්නට ලැබෙන්නේ අදක ඊයෙක සිට නොවේ. පසුගියදා අනාවරණය වුයේ එසේ අතහැර යන දරුවන්ගෙන් තුනෙන් එකක්ම වයස අවුරුදු හතරට අඩු දරුවන් බවයි. ඒ කාරණය හේතුකරගෙන රාජ්‍ය ඇමතිනී ගීතා කුමාරසිංහ මහත්මියගේ මූලිකත්වයෙන් යුතුව රජය අලුත් වැඩපිළිවෙලකට අතගසා තිබේ. ඒ විවිධ හේතුන් මත මෙලෙස දමා යන දරුවන් තබායෑම සඳහා රජයේ රෝහල් හා පළාත් පරිවාස දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වන කවුළු රට පුරා ස්ථාපනය කිරීමටයි. මේ, ඒ පිළිබඳව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ රාජ්‍ය ඇමතිනී ගීතා කුමාරසිංහ මහත්මිය සමඟ කළ කතාබහක් ඇසුරින් සකස්කරන ලද ලිපියකි.**

# අම්මේ... දරුවා එපා නම් කවුළුවෙන් තියලා යන්න



## රාජ්‍ය ඇමතිනී ගීතා කුමාරසිංහ



**දරුවන්ව එපා අම්මලාට ඒ දරුවෝ තියලා යන්න ලංකාව පුරා කවුළු ස්ථාපනය කරන්න යන බවක් දැනගන්න ලැබුණා. ඒ කතාව මොකක්ද?**

ඒ කතාව ඇත්ත. මං දැක්කා පහුගිය කාලය පුරාවටම පුංචි දරුවෝ මහමග තැන් තැන්වල දලා යනවා. පාරවල් අයිනේ, බෝක්කු යට, පන්සල් පල්ලිවල, වාහනවල, වැසිකිළි ඇතුළේ එහෙම දරුවෝ දලා යන එක හරි කණගාටුදයක තත්ත්වයක්. අනික දරුවන්ගේ පැත්තෙන් ඒක හරි අනාරක්ෂිතයි. ඉතින් එහෙම අම්මලාට දරුවව ආරක්ෂිතව පරිස්සම් ඇති විදියට දලා යන්න තමයි මෙහෙම වැඩක් කරන්න හිතුවේ.

**මේ කවුළු හදන්න යන්නේ කොයි වගේ තැන්වලද?**

මුලින් විවිධ යෝජනා ආවත් අවසානේ අපි තීරණය කළා හැමපැත්තක් ගැනම හිතලා දිස්ත්‍රික් රෝහල්වල මේ විදියට කවුළු ස්ථාපනය කරන්න. මොකද රටේ හැම දිස්ත්‍රික්කයක්ම ආවරණය වෙන විදියට දිස්ත්‍රික් රෝහල් තියෙනවා. ඒ හැම රෝහලකම විසිහතර පැයේම වෛද්‍යවරු, නර්ස්ලා ඉන්නවා. ඉතින් ඒ පහසුකම් ගැනත් හිතලයි අපි දිස්ත්‍රික් රෝහල්වල කවුළු ස්ථාපනය කරන්න තීරණය කළේ.

**එහෙම තියලා යන දරුවන්ට වයස් සීමාවක් පනවලා තියෙනවද?**

දැනට අපි එහෙම වයස් සීමාවක් නම් පනවලා නෑ. කොහොමත් ගොඩාක් වෙලාවට ඔය වගේ සිදුවීම්වලට මුහුණදෙන්නේ වයස අවුරුදු තුනට අඩු දරුවෝ තමයි.

**එතකොට කවුරු හරි අම්මෙක්ට තමන්ගේ දරුවෙක් ඔය කවුළුවකින් තියලා යන්න උවමනාවක් තියෙනවා නම් ඇය ඒක කළ යුත්තේ කොහොමද?**

> **හැමදේම කරන්නේ රහසිගතව. ගන්න විස්තර කිසිම දෙයක් කිසිම වෙලාවක එළියට දෙන්නේ නෑ**

කරන්න තියෙන්නේ ඉතින් ළඟම දිස්ත්‍රික් රෝහලේ තියෙන කවුළුවට දරුවව බාරදෙන එක තමයි.

**මෙතැනදි දරුවන්ව තියලා යන අම්මලාගේ අනන්‍යතාවය හෙළිවීමක් වෙනවද?**

අම්මෙක් දරුවව අරන් කවුළුවට ආපු ගමන් දරුවා තියලා අම්මට එකපාරටම යන්න කියන්න බෑ. එතැනදි අම්මගෙන් ලියවිල්ලක් ගන්න ඕන දරුවව අහවල් රෝහලේ තිබුණු කවුළුවට බාරදුන්නා කියලා. නැත්නම් ඒක ප්‍රශ්නයක්නේ. ඊළඟට අපි අම්මගෙන් දරුවගේ උපන්දිනය, ඉපදුණු තැන, ඉපදුණු පළාත, ඉපදුණු දිස්ත්‍රික්කය වගේ පොඩි පොඩි විස්තර ටිකක් ගන්නවා. එහෙම ගන්නේ දරුවට උප්පැන්නයක් නැත්නම් ඒක හදන්න ඕන නිසා. හැබැයි ඒ හැමදේම කරන්නේ රහසිගතව. ඒ ගන්න විස්තර කිසිම දෙයක් කිසිම වෙලාවක එළියට දෙන්නේ නෑ.

**කවුරුහරි අම්මෙක් තමන්ගේ අනන්‍යතාවය හෙළිකරන්න අකමැති වුණොත් ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?**

එහෙම අකමැති වුණොත් ඒ බවක් සඳහන් කරලා දරුවා අහවල් රෝහලේ කවුළුවට බාරදුන්නා කියලා ලියවිල්ලක් ගන්නවා.

**එතකොට ඔය කවුළු අධීක්ෂණය කරන්නේ කවුද? ඒක සිද්ධකරන්නේ කොයි විදියටද?**

පරිවාස දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ මැදිහත්වීමෙන් ඒක කරන්නේ. ඒ වගේම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයටත්, ළමා රක්ෂණ අධිකාරියටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයටත් මෙතැනදි ලොකු වගකීම් කොටසක් පැවරෙනවා. මොකද දරුවා කවුළුවෙන් බාරගත්තට පස්සේ දරුවගේ හැම පැත්තක් ගැනම අවධානයෙන් බලන එක කළ යුතුම දෙයක්. ඒ අතරිනුත් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය, සෞඛ්‍යය සහ අධ්‍යාපනය ගැන විශේෂයෙන්ම අපි බලන්න ඕනේ.

**මේ විදියට කවුළුවට එන දරුවන් එතැනින් යන්නේ කොතැනටද?**

ඔවුන්ව සතියක් ඒ රෝහලේ තියාගෙන වෛද්‍ය පරීක්ෂණ සිදුකරනවා. මොකද ඒ දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය අපි දන්නේ නෑනේ. ඒ කරලා ඊටපස්සේ දරුවා පරිවාස බාරයට යොමුකරලා උසාවි මාර්ගයෙන් ඔවුන්ව ළමා නිවාසයකට බාරදෙනවා. එතැනදි දරුවෝ හදාගන්න ඉල්ලන දෙමාපියන්ට ඒ දරුවන්ව අරන් හදාගන්න අවස්ථාව තියෙනවා.

**එහෙම දරුවෙක් හදාගන්න ගන්න එකත් ලේසි නෑ. ඒ සම්බන්ධව දැනට පවතින නීති ලිහිල් කරන්න යන කතාව ඇත්තක්ද?**

අනවශ්‍ය විදියට ලිහිල් කරන්නේ නෑ. මොකද දරුවන්ගේ සුරක්ෂිතතාව අංක එකට බලලයි දරුවෙක් එහෙම වෙනත් දෙමාපියන් යුවලකට දෙන්නේ.

**අපේ රටේ දැනට මහමග හෝ රෝහල් තුළ දමා යන දරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කෙරෙන්නේ කොයි විදියටද?**

දැනට වෙන්නේ පරිවාස බාරයට අරන් උසාවි මාර්ගයෙන් අදාළ දරුවන්ව ළමා නිවාසවලට බාරදෙන එක.

**ආයෙත් අපි අපේ මාතෘකාවට ආවොත් කවුළුවලින් තියලා යන දරුවෝ පස්සේ කාලේ ඒ අම්මලාටම ගන්න පුළුවන්කමක් තියෙනවද?**

අර රෝහලේ තියාගන්න සතිය ඇතුළත ඕන නම් ආයෙමත් දරුවව අරගන්න පුළුවන්. ඊටපස්සේ ඉතින් ගන්න ලේසිවෙන්නේ නෑ. එහෙම ගන්න එයි කියලා මං නම් හිතන්නෙත් නෑ. මොකද කොච්චර නැතිබැරිකම් තිබුණත් ඇත්ත අම්මෙක්ට බෑ තමන්ගේ ලෙයින් උපද්දවපු දරුවෙක්ව දලා යන්න.

**එතකොට මේ වැඩේ කොයි කාලේ වගේ වෙනකොට පටන්ගනීවිද?**

දැනටමත් අපි මේක කැබිනට් අනුමැතියට යොමුකරලා තියෙන්නේ. මං හිතනවා ජනාධිපතිතුමාගේ ඉඳන් හැමෝම මේ වැඩේට කැමතිවෙයි කියලා. එහෙම වුණොත් අපි පුළුවන් ඉක්මනට වැඩේ පටන්ගන්නවා. කොහොමත් ජනාධිපති මේ වගේ වැඩවලට කැමතියි. එතුමා දැනටමත් දරුවන්ව හිංසනයට ලක්කරන පුද්ගලයින් සඳහා දැනට තියෙන නීති සංශෝධනයක් හරහා දැඩි කරන්න ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

**ඔබත් හිතනවද මේ වැඩේ සාර්ථක වෙයි කියලා?**

ඔව් 100% ක්ම සාර්ථක වෙයි කියලා හිතනවා. මං හිතනවා මේ වැඩේ පටන්ගත්තම ආයෙත් පුංචි උන් තැන තැන දලා යන ප්‍රවෘත්ති ලංකාවේ අහන්න දකින්න නැතිවෙයි කියලා. අන්තිමට මං රටේ සමස්ත කාන්තාවන්ගෙන්ම ඉල්ලීමක් කරන්න කැමතියි. ඒ තමයි මොකක්ම හරි හේතුවක් නිසා ඔබට ඔබේ දරුවා හදාගන්න බැරි නම් ඒ පුංචි එකාව අනාරක්ෂිතව තැන් තැන්වල දලා යන්න එපා. මේ කවුළු ස්ථාපනය කරපු වහාම එතැනට ගෙනැත් බාරදෙන්න. අපි ඒ දරුවව ආදරෙන් බාරගන්නම්.

■ රුවන් එස්.සෙනවිරත්න



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

# මාව මරන්න ආපු එක සහසිකයෙක්වත් කලුතර දුවව මරපු එකාගැන වචනෙකින් විරුද්ධ වුණේ නැහැ



**දුවලගෙ ගෞරවය ගැන අපි ලියපු ලිපිවලට 'ධරණී' පත්තරයත් මාවත් මරා දමන්න තරම් සාහසික වූ එක් පුද්ගලයෙක්වත් දුවකට මරු කැඳ වූ සියලුදෙනාට විරුද්ධව මොකක්වත් ලියලා නැහැ. ඒ අය හිතන්නේ ඒ තරුණයා ජාතික වීරයෙක් කියලා වෙන්න ඇති**

ගිය සතියේ මට කොළඹ නුගේගොඩ ප්‍රදේශයේ අම්මා කෙනෙක් කතා කළා. ඒ අම්මා තනි කරලා දරුවන්ගේ තාත්තා තවත් කෙනෙක් එක්ක ගිහිල්ලා. ඉතින් නුගේගොඩට බොහෝ ඈත ගම්පහ ප්‍රදේශයේ ජීවත් වූ මේ අම්මා සැමියා හැර ගිය පසු මුදල් පොලියට දෙන ව්‍යාපාරයකට එකතු වෙලා. හැබැයි වෙනත් පොලීකාරයන් වගේ ඇගේ මුදල් පොලියට දීම අසාධාරණ වුණේ නැහැ. හැම මාසයකම ගණුදෙනුකරුවා ගෙවන මුදලින් පොලී මුදලත් මුල් මුදලත් දෙපාර්ශවයටම අවාසි නොවෙන විදියට අඩු වෙනවා. ඒ ක්‍රමයෙන් ඇගේ ව්‍යාපාරයත් ලාභයත් ක්‍රමයෙන් වැඩිවෙන්න පටන්ගත්තා.

සැමියා මත්පැන්වලට ඇබ්බැහි වූ කෙනෙකු නිසා දුවටත් එබඳු කෙනෙකු හමු නොවීමට සුදුසු ක්‍රමයක් ගැන ඇය කල්පනා කළා. අතමිට යහමින් මුදල් තිබූ නිසා නුගේගොඩ ප්‍රදේශයෙන් නිවසක් මිලයට ගත් ඇය තම දියණියව ජාත්‍යන්තර පාසලකටත් ඇතුළත් කළා.

ඊටපස්සේ තමන් කුඩා අවදියේ දුක් වින්ද හැටි ඇය නිතර දුවට කියන්න පටන්ගත්තා. ඇගේ තාත්තා නොබැලූ නිසා ආප්ප විකුණූ හැටි, ඒවා රැගෙන වෙළඳපොළට ගොස් විකුණා ජීවත් වූ සැටි ඇය දුවට ටිකෙන් ටික කියාදුන්නා. ගමෙන් නගරයට ආපු මුල් කාලෙ දුව අම්මගේ දුක්බර කතා ඉතාම ආසාවෙන් අහගෙන උන්නා. හැබැයි ඉන්ටර්නැෂනල් ස්කූල් එකට ගිහින් ටික දවසකට පස්සේ ඇයට අම්මාගේ මේ කතා කරදරයක් විදියට දැනෙන්න පටන්ගත්තා.

**"අම්මගෙ ඔය අතීතයෙන් මට ඇති වැඩක් නැහැ. අම්මේ අපි අයිති ඊයේ ලෝකෙට නෙවෙයි හෙට ලෝකෙට."** මෙහෙම කියලා අම්මගේ අතීත කතා විත්ති කීම නවතා දමන්න දුවට වැඩි දවසක් ගතවුණේ නැහැ. ගේ ඇතුළේ සිද්ධවෙන මේ වෙනස්කම් ගැන අම්මා කාටවත් කිව්වෙත් නැහැ. හැබැයි පහුගිය සතියේ අර කලුතර ප්‍රදේශයේ දුවගේ ක්‍රියාවත් එක්ක මේ අම්මා කලබල වුණා. 'ධරණී' පත්තරේ දලා තිබුණු මගේ අංකයට අම්මා කතා කළේ ඊටපස්සේ. අම්මා බයේ වෙව්ලනවා. ඒකට හේතුව මේ දුවත් පොතපතට කිසි ඇල්මක් නැතිව දුරකතනයට වී නිතර කල්ගෙවන නිසාම නෙවෙයි.

ඇයට අම්මා තම අතීතය ගැන කිව්වේ ඒවා අහලා දුව හොඳින් ඉගෙනගනීවී කියලා හිතලා... **"අම්මේ අම්මා මොකටද ආප්ප පුච්චලා දුක් වින්දේ? අම්මට සල්ලි හොයන්න ඕනනම් විවාහයක් කරගන්න තිබ්බනේ හොඳ තැනකින්."** දුව නිසා විවාහයට නොගිය තමන්ට දුවගෙන්ම එල්ලවන වාග් ප්‍රහාර අම්මට නීරස වුණා. මේ දුව අම්මට කියනවලු **"අම්මට වඩා තාත්තා හොඳයි. එයා ජීවිතය හොයාගෙන ගියා. අම්මා බොරුවට විඳවනවා. මම නම් අම්මා වගේ ජීවිතය විඳවන්නේ නැහැ."** තත්ත්වය තවත් බරපතළ වෙන්න අරන් තියෙන්නේ මේ දුව ඇගේ යෙහෙළියන් එක්ක රාත්‍රී සමාජ ශාලාවලට යන්න පටන්ගත්තට පස්සේ. අම්මා ඇය ගැන කියූ බොහෝ දේ මම ලිපියට ඇතුළත් කරන්නේ නැහැ.

ඉතින් අම්මගෙන් බලෙන් මුදල් ඉල්ලාගෙන දිවා රැය නොබලා එහෙ මෙහෙ යන දුව ගැන අම්මා මට කතා කරේ ඔන්න ඔය කලුතර සිද්ධියෙන් පස්සේ. **"අම්මේ අම්මගේ දුවව ගොඩගන්න පුළුවන් මට්ටමක අම්මවත් මමවත් අපි කවුරුවත් නැහැ. ඒ දුව අයිති අපි ගරු කරපු අතීත සංස්කෘතියට නෙවෙයි. ඒ දුව යන මාවත අගය කරන වෙනම සංස්කෘතියක් සමාජයේ තියෙනවා. අම්මයි මමයි එකඟ වුණත් නැතත් ඒ අයගේ මාර්ගය අපි කැමති විදියට වෙනස් කරන්න අපි කාටවත් බැහැ."** ගමට වඩා නගරය හොඳයි කියලා ගමෙන් නගරයට ආපු අම්මට වුණේ ගමටත් නැති නගරයටත් නැති දියණියක සමාජගත කරන්නයි. ඉතින් කලුතර දුව වැනි දුවලාගේ පරම්පරාවේ කතාව තව තවත් ඉදිරියට ගලාගෙන යාවි. ඒ වගේ අපේ දූලා අකාලයේ මියයාවි.

ලංකාවේ ගොඩක් නිවෙස්වල අම්මලා ළඟ දුවලා පුතාලා තනි කරලා තාත්තලා ලෝකය හොයාගෙන යනවා. අම්මලා දූලව පුතාලව හදන්නේ රියැදුරෙක් නියමුවෙක් නැති රථයක් අතින් තල්ලු කරනවා වගේ. ඉතින් පිරිමි පෞරුෂය අහිමි නිවසෙක දුවට හරි හමන් අප්පෙක් නැහැ. එහෙම හැදෙන දුව 'ස්වාධීන' ජීවන මාර්ග සොයා යනවා. ඉතින් අපි දූලට බනිනවා. මේක දුවලගෙ අම්මලගෙ වරද නෙවෙයි. සම්මත විවාහය පුපුරා නිවෙසින් පලාගිය පිරිමි පෞරුෂය. ඉතින් මගේ දුව හෙට ඔයා ඊළඟ හෝටලයේ තාප්පයෙන් බිමට පනියි. මේ බව තේරුම්ගෙන දුවේ ඔයාම නැගිටින්න. ඔයාට අත දෙන්න කෙනෙක් මේ සමාජයේ නැහැ. හැමෝම දුවට බනියි. ඔබ නොකී දේ පතුරුවයි. සියල්ලෝ සුදනෝ වෙයි. ඔබ මියයයි. හෙට තවත් කෙනෙක් ඒ තැන ගන්න එතැනට එයි.

ඉතින් දුවේ මං අර මෝඩ පරම්පරාවේ අපේ දූලගේ ගෞරවය වෙනුවෙන් තාම දුක්වෙන පරණ තාත්තා කෙනෙක්. මං කැමතියි මට වගේම හොඳ දුවෙක් හැම ගෙදරකම වැදගත් ලෙස ජීවත්වෙනවා දකින්න.

දුවලගෙ ගෞරවය ගැන අපි ලියපු ලිපිවලට 'ධරණී' පත්තරයත් මාවත් මරා දමන්න තරම් සාහසික වූ එක් පුද්ගලයෙක්වත් දුවකට මරු කැඳ වූ සියලුදෙනාට විරුද්ධව මොකක්වත් ලියලා නැහැ. ඒ අය හිතන්නේ ඒ තරුණයා ජාතික වීරයෙක් කියලා වෙන්න ඇති. ජීවිතයෙන් පැනලා ගිය ඒ දුව මෝඩ දැරියක කියලා වෙන්න ඇති.

ඒත් 'ධරණී' හැමදාම එදා වගේම අදටත් හෙටත් දුවලගේ පැත්තේ. විවාහ වීමට පෙර කාමරයට යන්න එපා කිව්වේ ඇයි කියලා දැන් පේනවා ඇති නේද මගෙ දුවේ.

අත්තනායක එම්. හේරත්


DIAMOND
පරපුරෙන් පරපුරට ශ්‍රී ලාංකේය මව්වරුන්ගේ විශ්වාසය දිනූ
විශ්වාසය පෝෂණය කරන යහගුණය
DIAMOND
DIAMOND BEST FOODS
Full Cream
Milk
Powder
ONLY FROM NEW ZEALAND
100% ක්ම නවසීලන්තයේ සාරවත් තණබිම් වලින් පමණක් පෝෂණය වන
නීරෝගී එළදෙනුන්ගෙන් දොවාගත් නැවුම් කිරි, පෝෂණ ගුණය
සුරැකෙන ලෙස සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ලෙසින් ඔබ දෝතට.
100% PURE NEW ZEALAND MILK
100% GRASS FED
nzmp
Made with NZMP dairy from New Zealand. grass-fed cows
nzmp.com
www.dbf.lk
@DBFKitchen
විමසීම්: 072 222 2244
400g - රු. 1100/-
ගෙන්වා බෙදාහැරීම
ඩයමන්ඩ් බෙස්ට් ෆුඩ්ස්, 288, දුටුගැමුණු මාවත, පෑලියගොඩ.
DIAMOND BEST FOODS






# දැනට ලංකාවේ අය විතරක් වුණාට ඉස්සරහට එංගලන්තේ අයත් නටයි

උඩරට, පහතරට, සබරගමු කියන අපේ රටේ ප්‍රසිද්ධ නැටුම් සම්ප්‍රදායන් තුන අතරින් උඩරට නැටුමට ලැබෙන්නේ ප්‍රධාන තැනක්නේ. ඒ නැටුමේ උත්පත්තිය ගැන තියෙන්නෙත් හරි රහ කතාවක්. ඒ වෙනකොට රටේ රජකම් කරලා තියෙන්නේ පඬුවස්දෙව් රජතුමා. ඔය රජතුමා රජවෙලා දෙතුන් දවසක් යද්දී නින්දෙන් භයානක හීනයක් පෙනිලා තියෙනවා. ඒ අඳුන් දිවියෙක් තමන්ගේ ඇඟට කඩාගෙන පනිනවා. ඒක දැකපු වෙලාවේ ඉඳන් රජතුමා හිතුවේ තමන්ට කලින් රටේ රජකම් කරපු විජයට කුවේණිය කරපු ශාපය තමන්ටත් බලපාලා කියලලු. මොකද එදා විජය රජ්ජුරුවෝ කුවේණියව රජ මාලිගාවෙන් පන්නලා දැම්ම වෙලාවේ කුවේණි විජයට විතරක් නෙවෙයි මුළු පිරිමි සංහතියටම ශාප කළාය කියනවනේ. කොහොමහරි ඔය හීනෙට බයවෙලා ලෙඩෙක් ගාණට වැටුනු රජතුමා ඉන්දියාවේ ඉඳන් ලංකාවට යකැදුරන් කණ්ඩායමක් ගෙනැවිල්ලා කොහොඹා කංකාරිය කියන ශාන්තිකර්මය කරගත්තලු. ඒක දැකපු අපේ රටේ මිනිස්සුත් ඒ යකැදුරන්ගෙන් ඒක ඉගෙනගෙන. ඔය විදියටයි උඩරට නැටුම කියලා නැටුම් සම්ප්‍රදායක් ලංකාවේ ආරම්භ වුණාය කියන්නේ.

ඉතින් ඒ විදියට ආරම්භ වුණු නැටුමට උඩරට කියන නම වැටුනයි කියන්නේ ඒක මුලින් ඉගෙනගෙන තියෙන්නේ උඩරට පළාතේ උදවිය හින්දා. ඒ කියන්නේ මහනුවර, උඩුනුවර, යටිනුවර, හත්කෝරළේ, හතරකෝරළේ, දුම්බර හාරිස්පත්තුව වගේ ලංකාවේ මධ්‍යම කඳුකර පැතිවල මිනිස්සු. හැබැයි ඉතින් බ්‍රිතාන්‍යයන් විසින් උඩරට ආක්‍රමණය කරපු වෙලාවේ උඩරට රාජධානියත් එක්කම මේ කියන නැටුම් සම්ප්‍රදායත් බිඳවැටිලා. ඒක ආයෙත් පණගහලා ඇවිත් තියෙන්නේ 1948 ලංකාවට නිදහස ලැබීමත් එක්ක. ඒත් එදා උඩරට නැටුම් නටන්න අවසර තිබිලා තියෙන්නේ නම් පිරිමි උදවියට විතරයි. 19 වැනි සියවසේ අගභාගයේ විතර තමයි කාන්තාවන්ටත් ඒකට ඉඩක් ලැබිලා තියෙන්නේ. ඉතින් ඒ ලැබුණු ඉඩෙන් කාන්තා උදවිය උපරිම පල ප්‍රයෝජන ගත්තලු. අන්න ඒ වගේ තරුණියක් ගැනයි මේ කියන්න යන්නෙත්. ඇය තමයි ඩිලිනි සෙනවිරත්න. පදිංචිය එංගලන්තේ. දන්නවද, ඩිලිනි කියන්නේ උඩරට නැටුමෙන් එංගලන්තයත් හොල්ලපු තරුණියක්. ඒ නිසාම ඇය එක්ක කතාබහක යෙදෙන්න අපිට හිතුණා.

**"මේ වෙනකොට මං එංගලන්තයේ ලන්ඩන්වල 'Kandyan Dance Company' කියලා උඩරට නර්තනය ගැන කම්පැනි එකක් කරනවා. 2022 අවුරුද්දේ මැයිවල පටන්ගත්තේ. මේ මැයි මාසෙට ඒක පටන් අරන් හරියටම අවුරුද්දක්. ඒ හරහා මං මගේ නර්තන කණ්ඩායම් එංගලන්තයේ විවිධ අවස්ථාවන්වලට සහභාගි කරවනවා. ඒක එංගලන්තයේ මිනිස්සුන්ට වෙනස්ම අත්දැකීමක්. දන්න තරමින් එංගලන්තය වගේ රටකට අපේ රටේ ප්‍රසිද්ධ නර්තනාංගයක් අරගෙන ගිහිල්ලා මේ වගේ දෙයක් කරන්නේ මං විතරයි."**

වැඩ දන්න මිනිස්සුන්ට තැන අදාළම නෑ කියනවනේ. 29 හැවිරිදි ඩිලිනි කියපු පළවැනි කතාවෙන්ම මට හිතුණේ එහෙම දෙයක්. ඒ හින්දම මට හිතුණා ඇගේ කතාව කොණක ඉඳන් පිළිවෙලට අහන්න.

"පුංචි කාලේ ඉඳන්ම මගේ ඇඟේ නැටුම තිබුණා කියලා අම්මා කියනවා. ඔය මොන්ටිසෝරි යන කාලේ එහෙම එක විනාඩියක් නිකන් ඉඳලා නෑ. නැටිල්ලම තමයිලු. ඒ දවස්වල මොන්ටිසෝරියේ කොන්සර්ට් එහෙම තියෙනවනේ. ඒවගේ තියෙන නැටුම්වලට ආසාවෙන්ම ඉදිරිපත් වෙන ළමයා මමලු. අම්මා කියනවා අනෙක් ළමයි නටන්නේ එක නැටුම් අංගයකට විතරක් වෙනකොට මං හැම නැටුමකටම නටන්න ඕන කියලා අම්මට කියනවලු. එහෙම දුන්නේ නැත්නම් මූණ බෙරි කරගන්නවලු. ඒ විතරක් නෙවෙයි ඒ කාලේ අපේ ගෙදරට එහෙම කවුරු හරි ආවත් එයාලටත් පේන්න නටනවලු. ඉතින් ඔය විදියට නොතේරෙන කාලේ ඉඳන් ඇගේ නැටුම කියන එක තිබිලා."

ඒ විදියට ඇඟේම නැටුම තිබුණු හින්දා ඩිලිනි පුංචි සන්ධියේ ඉඳලම ආසාවෙන් ඉඳලා තියෙන්නේ නැටුම් ටීචර් කෙනෙක් වෙන්න. හැබැයි ඉතින් මුළු පවුලම ලංකාවට ආයුබෝවන් කියලා එංගලන්තයේ පදිංචියට ඇවිත් තියෙන හින්දා ඇයට ඒ ආසාව හිතෙන් අතෑරගන්න වෙලා.

"ලංකාවේ අපි හිටියේ කොළඹ. අම්මා දන්න කාලේ ඉඳන් රැකියාව කළේ හෝටල් ක්ෂේත්‍රයේ. මුලින් කොළඹ ප්‍රසිද්ධ හොටෙල් එකක හිටියත් පස්සේ එයාට රැකියාව වෙනුවෙන් එංගලන්තයට එන්න අවස්ථාවක් ලැබුණා. මගේ පවුලේ ඉන්නේ මමයි, අම්මයි, මල්ලියි විතරයි. ඉතින් අම්මා අපි දෙන්නවත් එක්කම එංගලන්තයට ආවා. එතකොට අපි ගොඩාක් පොඩියි."

එදා එහෙම එනකොට ඩිලිනි ඇයගේ ළඟ තිබුණු නැටුම් පොත් ටිකකුත් අම්මට හොරෙන් බෑග් එකේ දාගෙන එංගලන්තෙට ගෙනාවලු.

"එංගලන්තයට ආවත් මං නටන එක නම් අත්හැරියේම නෑ. ඔය අතරේ මට ලලිත කලාවේදිනි කුමුදු පෙරේරා ගුරුතුමිය මුණගැහුනා. ඇයගෙන් වැඩිදුර නැටුම් ඉගෙනගත්තා. පස්සේ මහාචාර්ය මුදියන්සේ දිසානායක ගුරුතුමා මුණගැහුනා. ඔහුගෙනුත් නැටුම් ඉගෙනගත්තා. ඒ වෙනකොට මං එංගලන්තයේ Southampton කියන විශ්වවිද්‍යාලයේ BSc Criminology and Computer Science උපාධියත් කරමින් හිටියේ. ඔය අතරේ මට හිතුණා නර්තනය ගැනත් විශ්වවිද්‍යාල මට්ටමින් දෙයක් ඉගෙනගත්තා නම් සෑහෙන වටිනවා කියලා. එහෙම හිතලයි ලන්ඩන්වල Middlesex විශ්වවිද්‍යාලයෙන් MA Professional Practice, Dance (Kandyan Dance) කියන උපාධිය සම්පූර්ණ කළේ."

ඔය අතරතුරේ ඩිලිනි හරි අපූරු වැඩකුත් කරලා. ඒ පළවැනි වතාවට ඒ විශ්වවිද්‍යාලයේ හිටපු ළමයි එකතු කරගෙන උඩරට නැටුම් කණ්ඩායමක් හදපු එක. කොහොමින්හරි අන්තිමේ ඇය නැවතිලා තියෙන්නේ ඇය කතාබහ ආරම්භයේදී කියපු විදියට උඩරට නර්තනය සම්බන්ධ ලොකු කම්පැනි එකකුත් සුද්දගේ රටේ පටන් අරන්.

**විජය එන්න කලින් කුවේණි ගෙවපු ජීවිතේ පවා මං එංගලන්තයේදි නටලා පෙන්නුවා**

**"එංගලන්තය වගේ රටවල ඒ ඒ රටවලට ආවේණික සම්ප්‍රදායික නර්තනාංග තියෙනවා. ඒත් ඒ හැම එකකටම වඩා උඩරට නර්තනයේ පැහැදිලි ආකර්ෂණයක් තියෙනවා කියලා මට හිතුණා. ඒකට යොදාගන්න ඇඳුම් පැළඳුම්, සංගීතය වගේ දේවල් හරි ආකර්ෂණීයයි. නොදන්න රටක වුණත් මට මේ වගේ කම්පැනි එකක් පටන්ගන්න හිතුණේ ඒකයි. මොකද ඒ වෙද්දිත් කොච්චර නැටුම් ගැන ඉගෙනගෙන තිබුණත් ඒකෙන් වැඩක් ගන්න මට අවස්ථාවක් ලැබුණේ නෑ."**

ඊළඟට අපි ඩිලිනිගෙන් ඇහුවේ 'Kandyan Dance Company' එක හරහා මේ වෙනකොට ඇය කරන වැඩ කටයුතු ගැන.

"අපිට මේ රටේ විවිධ වූ ප්‍රසංගවලට ආරාධනා ලැබෙනවා. උත්සව අවස්ථාවලට ආරාධනා ලැබෙනවා. මේ රටේ අයගේ ඒ වගේ වැඩවලට දැන් ලංකාවේ උඩරට නැටුමක් නැතුවම බෑ. ඒ වගේම දැන් අපි එංගලන්තයේ ඉන්න ලංකාවේ අය වෙනුවෙන් නර්තන පන්ති පටන් අරන් තියෙනවා. ගොඩාක් වෙලාවට ඒවට එන්නේ මෙහේ කැම්පස්වල ඉගෙනගන්න ලංකාවේ ළමයි සහ පොඩි දරුවෝ. ඒ වගේම ලංකාවේදි නැටුම් කරලා ඒ සේරම අතෑරලා එංගලන්තයේ පදිංචියට ඇවිත් ඉන්න අයත් මගේ ගාවට ආයෙත් නැටුම් කරන්න එනවා. ඉස්සරහට එංගලන්තයේ අයත් මගෙන් නැටුම් ඉගෙනගන්න එයි කියලා හිතනවා. මොකද එයාලත් දැන් ලංකාවේ නැටුමට හරිම ආසයි."

පහුගිය කොවිඩ් කාලේ හැමෝටම සුපුරුදු වැඩකටයුතුවලින් චුට්ටක් ඈත්වෙලා ඉන්න වුණානේ. හැබැයි ඩිලිනි නම් එහෙම ඉඳලා නෑ. ඇය ලියලා උඩරට නර්තනය ගැන පොතක්.

**"පොතට නම දැම්මේ 'An Introduction to Kandyan Dance' කියලා. ඒක එංගලන්තයේ ගොඩාක් ප්‍රසිද්ධ වුණා. මේ වෙනකොට මෙහේ ප්‍රසිද්ධ පුස්තකාල පහක විතර මගේ පොත තියෙනවා. කැමති අයට අන්තර්ජාලය හරහා වුණත් කියවන්න පුළුවන්."**

උඩරට නැටුමෙන් එංගලන්තයම අල්ලපු ඩිලිනිගේ දැන් බලාපොරොත්තුව එංගලන්තයම හෙල්ලිලා යන විදියේ දැවැන්ත ප්‍රසංගයක් කරන එකලු.

"ලබන මාසේ, ඒ කියන්නේ ජූනි 24 වැනිදා එංගලන්තයේ ලන්ඩන්වල අපි 'නර්තන' නමින් ඒ ප්‍රසංගය කරනවා. ඒ ප්‍රසංගයේදී උඩරට නැටුමට මූලිකත්වය දීලා උඩරට, පහතරට, සබරගමු, භරත ඇතුළු ලංකාවේ හැම නැටුමක්ම නටන්න අපි බලාපොරොත්තු වෙනවා. ගිය අවුරුද්දෙත් අපි ඒක පොඩියට කළා. විශේෂත්වය තමයි හැම නැටුමක්ම ලස්සන කතාවක් එක්ක යන්නේ. උදාහරණයක් කිව්වොත් අපි ගිය පාර ප්‍රසංගයේදී විජය රජතුමා ලංකාවට එන්න කලින් කුවේණි ලංකාවේ ගතකරපු ජීවිතේ උඩරට නැටුම එක්ක නටලා පෙන්නුවා. මෙහේ අයගෙන් ඒකට හොඳ ප්‍රතිචාර ලැබුණා."

ඉතින් ලංකාවේ උඩරට නර්තන කලාව ජාත්‍යන්තරයේ බබළවන ඩිලිනිට මේ මල්මිට 'ධරණී' අපෙන්.

**■ රුවන් එස්.සෙනවිරත්න**

SETHRU AYURVEDIC BEAUTY ACADEMY

ISO 9001 CERTIFIED

# අලුතින් ව්‍යාපාරයක් පටන් ගනිමු

රූපලාවන්‍ය නිෂ්පාදන පාඨමාලා මෙහෙයවනු ලබන
ආයතන අභිබවමින් ISO 9001 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකයෙන් පිදුම්
ලැබූ ප්‍රථම හා එකම අධ්‍යාපන ආයතනය
ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ දී

## GEL TYPE COSMETIC PRODUCTS MANUFACTURING COURSE

( ADVANCED CERTIFICATE IN COSMETIC TECHNOLOGY )

පාඨමාලා ආරම්භය
මැයි 28 - පෙ.ව. 9.00
ISO 9001 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකයෙන් පිදුම් ලැබීම නිමිත්තෙන් රු.115000 දැවැන්ත මිල අඩු කිරීමක්

විශේෂ පාඨමාලා ගාස්තු
~~Rs. 1,45,000~~ Rs 30,000
(පාඨමාලා ගාස්තු කොටස් වශයෙන් ගෙවිය හැකිය)

80% Off

මාධ්‍ය සිංහල
- Online & physical live practical
- Limited seats

පාඨමාලාව අවසානයේ දී
තෘතීයික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)
අනුමත සහතිකයක්, විදේශ සේවා කටයුතු අමාත්‍යංශය පිළිගත් සහතිකයක්
සහතික ප්‍රධානෝත්සවය BMICH හිදී...

## ADVANCED CERTIFICATE IN WHITENING & GLUTATHIONE PRODUCT MANUFACTURING

FREE
SERUM COURSE

ජූනි 05 - පෙ. ව. 9.00 ට

50% Off

විශේෂ පාඨමාලා ගාස්තු
Rs 25,000



Ph. D.M.D,
B. Sc. Cosmetology
N.V.Q. Level-4
N.V.Q. Assessor

Conducting by
DR. MAHESH ATHURALIYA

තෘතීයික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාවේ
ලියාපදිංචි ප්‍රථම රූපලාවන්‍ය නිෂ්පාදන පුහුණු ආයතනය

077 630 65 21 / 077 519 40 73



# අම්මාගෙ ගෙදරට වඩා හිරගෙදර මට සනීපයි

ජිප්සි රෝස් බ්ලැන්චාර්ඩ් කියන පුංචි දුවයි ඇගේ මව ඩී ඩී බ්ලැන්චාර්ඩ් මහත්මියයි ජීවත්වුණේ ඇමරිකා එක්සත් ජනපදයේ. අවධානය දිනාගැනීම, හැඟීම්බර වීම වගේ ගති ලක්ෂණ වැඩි හරියක් තියෙන්නේ ආසියාකරයේ මිනිස්සුන්ට කියලා අපි කිව්වට මොකද, ඇමරිකාවේ ජීවත්වෙන මිනිස්සුන්ගේත් ඒ හැටි ලොකු වෙනසක් නෑ කියලා මේ කතාව කියෙව්වම ඔබට වැටහේවි. ජිප්සිගෙ මව වුණු ඩී ඩී බ්ලැන්චාර්ඩ් මහත්මියට අවධානය දිනාගැනීම සම්බන්ධ මානසික රෝගයක් තිබුණා. අවසානයේ ඒක ජිප්සිට කොයිතරම් කරදරයක් වුණාද කියලා කිව්වොත් තමන්ගේ ඔන්ලයින් පෙම්වතා සමඟ එක්ව ඇය, තම මව මරා දැමීමට කටයුතු කළා. මේ සිද්ධිය වුණේ 2015 අවුරුද්දේ. ඒක වුණේ මෙහෙමයි...

ජිප්සි ඉපදුණේ 1991 වර්ෂයේ. ඇය ඉපදුණු දවසෙ ඉඳලා අහන දකින සහ දන්න නොදන්නා හැමෝටම ඩී ඩී කිව්වේ එකම කතාවක්. ඒ තමයි ජිප්සි කියන්නේ රෝගී දරුවෙක් කියන එක. ඒ නිසා උපන්දා පටන්ම පුංචි ජිප්සිට දරුණු ගණයේ රෝග විනිශ්චයන්ට වගේම අවෝරාශියක් වෛද්‍ය ප්‍රතිකාරවලටත් යොමුවෙන්න සිද්ධ වුණා. ඒත් ඇත්තම කතාව තමයි, ජිප්සිට ඉහෙන් බහින රෝගයක් තිබුණේ නෑ. ඇගේ මව ඇගේ රෝග ලක්ෂණ ගැන අමූලික බොරු තමයි කියලා තිබුණේ.

ජිප්සි ඉපදුණු ගමන් එයාගේ අම්මා කිව්වා, ඇයට නින්දෙන් හුස්මගැනීමේ අපහසුතාවයක් තියෙනවා කියලා. ඒ වගේම ඇයට අවුරුදු අටක් පිරෙනකොට ජිප්සි ලියුකේමියා රෝගයෙන් සහ මාංශ පේශී ආබාධයකින් පෙළෙන බවත් ඇය පැවසුවා. ඊට අමතරව තම දියණියට වලිප්පුව, ඇදුම, ශ්‍රවණ ආබාධ වැනි රෝග තිබෙන බවටත් ඇය ප්‍රචාරය කළා.

අම්මාගේ මේ අහස පොළොව නුහුලන බොරු කතා නිසා අසනීපයක් නැතත් මේ පුංචි කෙල්ලට නිදාගන්න වුණේ හුස්ම ගැනීමේ යන්ත්‍රයක් සවි කරගෙන. ඒ විතරක්ද, නිකන් නිරපරාදේ සැත්කම් ගණනාවකටත් මුහුණ දෙන්න සිද්ධවුණා. බොහොම හොඳට තිබුණු ඇගේ බෙට ග්‍රන්ථි ඉවත් කරන්න වුණේ එවැනි කමකට නැති සැත්කමක ප්‍රතිඵලයක් විදියට. පස්සේ කාලෙක ඒ නිසාම ජිප්සිගේ දත් ටික නරක් වෙලා ඒවා ඉවත් කරන්නත් සිද්ධ වුණා.



**ඇයට ආහාර ගැනීමට කෘත්‍රිම නලයක් සම්බන්ධ කරලා තිබුණා. නමුත් මව කියූ විදියට පිළිකාවක් හෝ එවැනි රෝග ලක්ෂණයක් ඇත්තටම නැති නිසා ඇයට එවැනි නලයක් නැතුවත් ආහාර ගන්න පුළුවන්කම තිබුණා. අනිත් එක ජිප්සි හිටියේ රෝද පුටුවක. ඒත් ඇත්තම කතාව නම් ඇයට ඇවිදීමට නොහැකි අපහසුතාවක් තිබුණෙත් නැහැ**

ඒ වගේම ඇයට ආහාර ගැනීමට කෘත්‍රිම නලයක් සම්බන්ධ කරලා තිබුණා. නමුත් මව කියූ විදියට පිළිකාවක් හෝ එවැනි රෝග ලක්ෂණයක් ඇත්තටම නැති නිසා ඇයට එවැනි නලයක් නැතුවත් ආහාර ගන්න පුළුවන්කම තිබුණා. අනිත් එක ජිප්සි හිටියේ රෝද පුටුවක. ඒත් ඇත්තම කතාව නම් ඇයට ඇවිදීමට නොහැකි අපහසුතාවක් තිබුණේ නැහැ. ඒ වගේම මේ දැරියගේ රෝගී බව පෙන්වීමට ඩී ඩී බ්ලැන්චාර්ඩ් ඇගේ හිස බූ ගාලයි තිබුණේ.

කොහොම නමුත් මේ කාන්තාවට අවශ්‍ය වුණේ, ඇය බරපතළ ලෙස රෝගී වුණු දරුවෙක් බලාගන්නා මවක් විදියට බොහෝදෙනාගේ අවධානය සහ අනුකම්පාව දිනාගන්න. පසුව විශේෂඥයන්ගේ මතය වුණේ ඩී ඩී Munchausen syndrome by proxy කියන මානසික ආබාධයෙන් පෙළුණු කාන්තාවක් බව.

මෙය මානසික රෝගයක් වගේම ළමා අපයෝජනයේ එක්තරා ස්වරූපයක්. මේ රෝගයෙන් පෙළෙන ළමා භාරකරුවන් බොහෝවිට ව්‍යාජ රෝග ලක්ෂණ පවසනවා වගේම සැබෑවටම දරුවා අසනීප බව පෙන්වීමට එම රෝග ඇති කිරීමටත් කටයුතු කරනවා.

කොහොමින් කොහොම හරි කාලයක් ගතවෙද්දී ඩී ඩී, ජිප්සි පිළිබඳව පවසන රෝග ලක්ෂණ කවරක් වුණත් වෛද්‍ය පරීක්ෂණවලින් ලැබෙන ප්‍රතිඵල ඊට වඩා පරස්පරවිරෝධී බවක් පෙන්නුම් කළා. හැබැයි ඒ ගැන ප්‍රශ්න කරපු වෛද්‍යවරුන් හමුවීමට ඇය නැවත කිසිම දවසක ජිප්සි රැගෙන ගියේ නෑ. මේ වෙනකොට ඇය හෙද පුහුණුවක් පවා ලබාගෙන හිටියා. ඒ වෙන දෙයක් නිසා නෙවෙයි, රෝග ගැන අවබෝධයක් ලබාගෙන ඇගේ රංගනය තාත්විකව කරගෙන යන්න ඕන නිසා.

ඉතින් ඔහොම කල් ගතවෙද්දී ජිප්සිට කතා කරන්න පුළුවන් වයසටත් ආවා. නමුත් ඩී ඩී, ඒ වෙද්දී ඇයට උපදෙස් දීලා තිබුණා වෛද්‍යවරුන් මුණගැසීමට ගිය පසු ඇගේ අසනීප පිළිබඳව කිසිම දෙයක් ස්වෙච්ඡාවෙන් නොපවසන ලෙසට.

අවසානයේ ඩී ඩී ගේ මේ රංගනයේ ප්‍රතිඵලයක් විදියට, 2008 වර්ෂයේදී Habitat for Humanity කියන සංවිධානය විසින් ඉදිකරන ලද නිවසක් ඔවුන්ට හිමිවුණා. ඒ වගේම එම සංවිධානයේ අනුග්‍රාහකත්වයෙන් විවිධ ප්‍රසංගවලට සහභාගී වෙන්න වගේම ඩිස්නිලන්තයේ සවාරියක් යන්නටත් ඔවුන්ට හැකියාව ලැබුණා. මේ සියල්ල මැද රෝගී දියණියක් රැක බලාගන්නා මවක් ලෙස සැමගේ අවධානය දිනාගන්න මෙහෙයුම ඇය දිගටම ක්‍රියාත්මක කරගෙන ගියා.

ඒ වගේම ජිප්සි වයසින් වර්ධනය වෙද්දී, උප්පැන්න සහතිකයේ දින පවා වෙනස්කරමින් ඩී ඩී නිතරම ඇගේ වයස සඟවන්න උත්සාහ කළා. හැබැයි ඒ මොනවා කළත් වයසින් මෝරා වැඩෙන මේ පුංචි කෙල්ලව පාලනය කරන එකනම් වෙනද තරම් ඩී ඩී ට ලේසි වුණේ නෑ. ඒ වෙද්දී ඇයට වයස අවුරුදු 19ක් වුණත්, මව හැමෝටම කිව්වේ ඇය අවුරුදු 7ක මානසිකත්වයකින් යුතු දරුවෙක් කියලා. ඒ නිසාම සෙනඟ ගැවසෙන තැනක ජිප්සි කතා කරන්න ගියොත් එහෙම මව ඇගේ අත තදින් මිරිකන බව ඇය පසුව කියා තිබුණා.

අම්මා මොන සෙල්ලම් දැම්මත් නව යොවුන් වයසට ආපු ජිප්සි ගෙදර තිබුණු පරිගණකය ආශ්‍රයෙන් Dating site එකකට යන්න තරම් සූක්ෂම වුණා. නිකලස් ගෝඩිජෝන් කියන තරුණයා ඇයට මුණගැහුනේ ඒ වෙබ් අඩවිය හරහා. අවසානයේ ජිප්සි, ඇගේ ජීවිතයේ සියලු කාරණා පිළිබඳව මේ ඔන්ලයින් ප්‍රේමවන්තයාට ඇත්තම කිව්වා. ඒ වගේම මේ කරදරයෙන් නිදහස් වීමට නිවසට පැමිණ මව මරා දමන ලෙසත්, ඉන්පසු ඔවුන්ට එකට ජීවත් විය හැකි බවත් ඇය පැවසුවා. ඒ සැලසුම ක්‍රියාවට නංවන්න එකඟ වුණු නිකලස් ජිප්සිගේ නිවසට පැමිණ ඇගේ මව වුණු ඩී ඩී බ්ලැන්චාර්ඩ්ව පිහියෙන් ඇන මරා දැමුවා.




කොහොම වුණත් ඩී ඩී ගේ මරණින් මතු ඔවුන් පැතූ සිහින ලෝකය සුණුවිසුනු වී ගොස් ජිප්සිට වසර 10ක සිර දඬුවමකුත්, නිකලස්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවමකුත් නියම වුණා.

මේ වනවිටත් ජිප්සී හිරගෙදරට වී නිරෝගී ජීවිතයක් ගත කරනවා. මව සමඟ ගෙවූ ජීවිතයට වඩා අතිශය නිදහස් ජීවිතයක් හිරගෙදර තමාට තිබෙන බව ඇය පවසා තිබුණා. ඒ වගේම මවගේ මරණය පිළිබඳව ඇය සතුටු වනවාද යන වග අසද්දී ඇය කියා තිබුණේ, ඇගේ ග්‍රහණයෙන් නිදහස් වීම සතුටට කරුණක් වුවත් ඇගේ මරණය පිළිබඳව නම් තමා සතුටු නොවන බවයි.

■ සුරේෂ් විදානගමගේ

# මද කිපුණු අලි රංචුවක් මැද අනූ නවයෙන් බේරුනෙමු



අලි උණ හැදෙන්නේ අලි වෙදැදුරන්ට, වනජීවී නිලධාරීන්ට සහ සංරක්ෂකයින්ට පමණක් නොවේ, ඊට පරිබාහිර තැනැත්තන්ද ඊට ගොදුරු වෙන වෙලාවල් ඇත. එහෙත් අලි ගැන හරියට නොදැන අලි උණ බෝ කරගැනීම නොදන්නා දෙමළෙට ගිහිං වරිගෙ නහගත්තා වැනි වැඩකි. අටුවා ටීකා කුමටද? එවැනි අත්දැකීමකට අපිද මුහුණ දුන්නෙමු. 'අපි' ලෙස හැඳින්වූයේ වෙන කිසිවකු නොව මා සහ 'ධරණී' කර්තෘතුමියයි.

වරක් මහනුවර පළාතේ කළ සංචාරයක් අතරතුර අපට සුන්දර දසුනක් දැක ගත හැකි විය. ඒ, පල්ලෙකැලේ අතුරු පාරකදීය. පෘෂ්ඨීමත් ඇත්තු කිහිපදෙනෙක් මාර්ගය යාබද වත්තකට වී සුන්දරවත්, ගාම්භීරවත් හිස පද්දමින් සිටියහ. මේ වැනි අවස්ථාවක් මගහැරීම කිසිසේත් නොවටී. වහාම ක්‍රියාත්මක වන පරිදි වාහනය නැවතූ අපි පිටතට පැනගත්තෙමු. ඇතුන් සිටින වත්තේ වැටද එක තැනකින් කැඩී ඇත. අපටම කියාපු දවසය. එතැනින් රිංගා ගතහොත් හිතේ හැටියට ඇත් රූ සිරි නැරඹීමට හැකි වේ. ඒ දෙසට ළංවන විටම මාර්ගයේ අනෙක් පස නිවසකින් කාන්තාවක් පිටතට පැමිණියාය. අප ගැන විමසිලිමත් වූ ඇයට අපෙන් පැනයකි.

"මේ ඇත්තුන්ගෙ අයිතිකාරයා කවුද?"

"ඔය මාලිගාවේ ඇත්තු."

හඬ නගා කතා කරමින්ම ඈ පාරට ආවාය.

"වැටෙන් රිංගලා බලන්න පුළුවන් නේද?"

"අපෝ බෑ. ඒකට අවසර ගන්න ඕනෙ."

"කාගෙන්ද?"

"අනිත් පැත්තෙ පොලිසියෙන් ඉන්නවා. එතැනින් අහන්න. එහෙම නැතුව යන්න බෑ."

ඒ අතරතුර ඇතුන්ට කෑම රැගෙන පැමිණි හස්තිපාලකවරු කිහිපදෙනෙකි. ඔවුන් සමඟ කතා කිරීමට උත්සාහ කළද අලි රාජකාරිවල සිර වූ ඔවුන්ට අප දෙස බැලීමට උවමනාවක් හෝ වෙලාවක් තිබුණේ නැත.

අවසානයේ පොලිස් මුරපොල වෙත ගියද ඇතුන් බැලීමේ අවසරයක් හිමිවූයේ නැත.

මෙයාලා ගැන පත්තරේට ලියන්න කොයිතරම් කතා තියෙයිද? එනිසා උත්සාහය අතහැරීමටද නොහැකිය. 'ධරණී' අලි කතා නිතර නිතර හැඩකරන මහාචාර්ය අශෝක දංගොල්ල මහතාට ඇමතුමක් ගත්තේ ඒ අනුවය. ඔහු අපව නිවැරදිම තැනට යොමු කළේය. මහාචාර්යවරයාගේ දැනුම් දීම මත ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තිය භාර ප්‍රදීප් මියනපලාව සමඟ දුරකතන සංවාදය ඇරඹුණේ මෙලෙසිනි.

"ඔයාලා මොකටද ඔය මද කිපුණු අලි අස්සෙ යන්න හදන්නෙ? ඔහොමම එන්න මාලිගාවට."

ඔහු ඒ ටික කියා දැමුවේ සිනහවක්ද සමඟිනි.

හදිස්සියට කොරොස් කටෙත් අත දැමීමට නොහැකි වූවාට හිත ඇත්නම් පත කුඩාද? අපි නොසැලී අපේ අරමුණ වෙනුවෙන් පෙරට ගියෙමු. මාලිගාවේ ඇතුන් මගදී බලාගැනීමට නොහැකිනම් මාලිගාවේදී බලා ගැනීම සුදුසුය. මාලිගාවේ ඇත් පන්තිය වෙතට අප ළඟා වනවිට අලි දෙන්නෙක් සැප සේ ස්නානය කරමින් සිටියහ. ඒ, ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තියේ වැඩිමහල්ම සාමාජික කණ්ඩුල සමඟ නාලකයි. අලි නෑවීමටද අප දෙදෙනා සම්බන්ධ වූයේ මද කිපුණු අලින්ගේ හැසිරීම ගැන ඇත් පන්තිය භාරකරු සහ ඇත්ගොව්වන්ගෙන් හොඳ හැටි විස්තර අසා දැනගැනීමෙන් පසුය. අලිත් නාවා මේ ලිපියත් ලිවීමට ඉඩ ලැබුණේ මහාචාර්ය අශෝක දංගොල්ල සහ දළදා මාලිගාවේ ඇත් පන්තිය භාර ප්‍රදීප් මියනපලාව නිසා බවද අමතක කළ නොහැකිය.

■ **රෂ්නිකා ලියනගේ**

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
සජීවී සංගීතය සමඟින්
එකක මිල රු.455/=
ෆ්‍රයිඩ් රයිස - සඳුදා
රයිස් ඇන්ඩ් කරි - අඟහරුවාදා
කහ බත් - බදාදා
රයිස් ඇන්ඩ් කරි - බ්‍රහස්පතින්දා
බිරියානි - සිකුරාදා
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත,කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )

# සුදු පුතාට මෙච්චර දුක් විඳින්න වෙයි කියලා හිතුවානම් කොච්චර ආදරේ වුණත් කසාද බඳින්නේ නැහැ



"අනේ කටු ගහන්න එපා රිදෙනවා අම්මී... කටු ගහන්න එපා."

අනුරාධපුරේ කැබෙතිගොල්ලෑව, මහනතියාව පැත්තේ ගෙදරක පුංචි බබෙක් හැමදෑම රෑට ඔය විදියට කිය කියා අඬනවලු.

උල් කටු ඇඟට ගහනවට බබෙක් තියා වැඩිහිටියෙක්වත් කැමති නෑනේ. ඉතින් කටු ගහන්න බෑ කියලා පුංචි පැටියා විලාප තියද්දි පැටියගේ ආච්චියි, තාත්තයි ටිකක් තදින් පුතාව අල්ලගන්නවාලු. ඊටපස්සේ පුතාගේ අම්මා පුතාගේ චූටි ඇඟට කටු ගහනවලු.

මේක හිතක් පපුවක් තියෙන මිනිහෙක්ට අහන් ඉන්න පුළුවන් කතාවක් නෙමෙයි. අහන් ඉන්න එච්චර අමාරු නම් තමන්ගේ පුංචි දරුවගේ ඇඟට හැමදෑම කටු ගහන ඒ අම්මගෙයි තාත්තගෙයි හිත්වලට කොච්චර වේදනාවක් ඇද්ද?

"මගේ පුතාගේ නම අයාන් බස්නායක. එයාට දැන් අවුරුදු දෙකයි මාස හතයි. මගේ පුතාගේ ඇඟේ යකඩ තැම්පත් වෙනවා. යකඩ ඕනාවට වඩා තැම්පත් වුණොත් පුතා මැරෙන්න වුණත් පුළුවන්. ඉතින් හැමදෑම එයාගේ බඩට කටුවක් ගහලා යකඩ අයින් කරන්න ඕනේ. මුලින්ම ඒක කළේ ඩොක්ටර් කෙනෙක්ට කියලා. හැමදෑම වෛද්‍යවරයෙක්ට මුදල් දෙන්න අමාරු නිසා දැන් මම ඒ වැඩේ ඉගෙනගත්තා. මේ කටුව එකදිගට පැය 10ක් තියන්න ඕනේ. එයා දැඟලුවොත් ඒක ගැලවෙන්න පුළුවන්. ඉතින් රෑට කටුව ගහලා පහුවෙනිදා වෙනකල් නොනිදා පුතා දිහා බලාගෙනම ඉන්නවා. නිදිමරන එක නම් අපිට දැන් හුරුයි. කටු ගහද්දි පුතා අඬනවා. ඒක තමයි අපිට ඉවසන්නම බැරි."

ඒ කතා කළේ කටු ගහන්න එපා කියලා අඬන පුංචි  පුතාගේ අම්මා, නිම්මි රාජකරුණා. අයාන් පුතාගේ ඇඟේ යකඩ තැම්පත් වෙන්නේ ඇයි දන්නවද? අයාන් පුතාට මහා තැලසීමියාව. අර ඉස්සර හිටපු මිනිස්සු ලේ වතුර වෙන ලෙඩේ කියන්නේ. මේ ලෙඩේ හැදුනහම ඇඟේ රුධිර සෛල හැදෙන්නේ නෑ. ඒ මදිවට තියෙන රතු රුධිර සෛල ටිකත් කෑලි කැඩි කැඩී යනවා. ලේ නැතුව මනුස්සයෙක්ට ජීවත්වෙන්න පුළුවන්ද? ඉතින් මාසේ ගානේ ලේ නොදුන්නොත් ලෙඩා මැරෙනවා. ඒ මාරු කළාට මදි විනාශ වෙන රුධිර සෛලවල තියෙන යකඩ ලෙඩාගේ අක්මාවෙයි වකුගඩුවලයි තැම්පත් වෙනවා. ඉතින් දවස ගානේ එච්චා අහක් කරන්නත් ඕනේ. මොකද ගොඩක් තැලසීමියා ලෙඩ්ඩු මැරෙන්නේ ඔය යකඩ ප්‍රශ්නේ නිසයි.

ඔය කියාපු මහා තැලසීමියාව සහිත දරුවෝ බිහිවෙන්නේ  තැලසීමියා වාහකයන් (මහා තැලසීමියාව ඇතිකරන සුළු තැලසීමියා රෝගීන්) දෙන්නෙක්ගේ එක්වීමෙන්.

"අම්මටයි තාත්තටයි දෙන්නටම තැලසීමියාව කියලා බඳිනකොට දැනන් හිටියේ නැද්ද?"

මේ ප්‍රශ්නේ මේ වෙලාවේ අයාන්ගේ අම්මට බර වැඩියි කියලා දන්නවා වුණත් ඇගේ කතාව තව කෙනෙක්ට ආදර්ශයක් වෙයි කියලා හිතද්දි ඒ ප්‍රශ්නේ මට නාහා බැරිවුණා.

"මගේ මහත්තයා අනුරුද්ධ බස්නායක. අපි දෙන්නා යාළුවුණේ ඉස්කෝලේ යන කාලේ. අවුරුදු 10ක් යාළුවෙලා ඉඳලායි විවාහ වුණේ. ඇත්තටම කසාද බඳිද්දි ඒ ගැන පරීක්ෂා කරන්නවත් අපිට තැලසීමියාව ගැන ලොකු දැනුවත්බවක් තිබුණේ නැහැ."

නිම්මි අම්මා එහෙම කිව්වේ කඳුළු හංගන ගමන්. ලොකු පසුතැවීමක් වගේ හැඟීමක් ඇගේ සුසුම්වල පවා තිබුණා. විවාහ වෙද්දි විසි පොරොන්දම් ගැළපුවත් තැලසීමියා පොරොන්දම ගළපන්න ගොඩදෙනාට අමතක වෙනවා. ඒ ගැන හරි දැනුවත් කිරීමක් නැතිකමත් ඒකට හේතුවක්.



"අපි දෙන්නම දරුවෙක්ට ගොඩක් ආසාවෙන් හිටියේ. බැඳලා අවුරුදු එකහමාරකින් පුතා ලැබුණා. මුලදි පුතාට කිසි අසනීපයක් තිබුණේ නෑ. 2021 අගෝස්තු මාසේ බබාට තද උණක් ආවා. එතකොට එයාට මාස 10යි. දරුවා එක්ක වවුනියාව හොස්පිට්ල් එකේ නතර වෙලා ඉන්දැද්දි මටත් කොවිඩ් හැදුණා. පස්සේ අපි තුන්දෙනාම පෞද්ගලික රෝහලක නතර වුණා. මට කොවිඩ් හොඳ වුණත් පුතාට සැරෙන් සැරේ උණ ආවා. හිමොග්ලෝබින් මට්ටම 6.2ට බැස්සා. ඉතින් ඩොක්ටර්ස්ලා දිගටම ටෙස්ට් කළා. මමයි මහත්තයයි දෙන්නම තැලසීමියා වාහකයෝ කියලා දැනගත්තේ ඒකෙන්. පුතාට මහා තැලසීමියාව තියෙනවා කියලත් ඩොක්ටර්ස්ලා කිව්වා. මගේ ලස්සන සුදු පුතා තැලසීමියා රෝගී බබෙක් කියලා දැනගත්තුදා ඉඳලා අදටත් තත්පරයක් පාසා මායි මහත්තයයි මැරි මැරී ඉපදෙනවා."

එදා ඉඳලා අද වෙනකල් මාසයක් ගානේ අයාන් පුතාගේ ඇඟේ ලේ මාරු කරනවලු.

"ලේ මාරු කරන එකයි, යකඩ අදින එකයි දිගටම කරලා  පුතාව ජීවත් කරවන්න අමාරුයි. හැබැයි ඇටමිදුළු බද්ධ කරලා පුතාගේ ලෙඩේ සුවකරන්න පුළුවන්. ලංකාවේ මේ සැත්කම කරන්නේ එකම එක වෛද්‍යවරයෙක් විතරයි. මූලික පියවර විදියට අපි තුන්දෙනාගේ ජාන ඉන්දියාවට යැව්වා. මගේ දරුවගේ වාසනාවට මගේ ජාන 90%ක්ම එයාට ගැළපෙනවා. ඉතින් මගේ ඇටමිදුළු එයාට තැම්පත් කරන්න පුළුවන්. මූලික පරීක්ෂා, සෛල තැම්පත් කිරීම්වලට ලක්ෂ 10ක් වියදම් වුණා. එතකොට  සැත්කමට තව කෝටි දෙකක් ඕනේ."

අනුරුද්ධ බස්නායක පොලිස් නිලධාරියෙක්. මේ පවුල සාමාන්‍ය පවුලක්. මූලික පියවරවල ලක්ෂ 10 සොයාගන්න පුළුවන් වුණත් සැත්කම සඳහා කෝටි දෙකක් හොයාගන්න එක මේ උදවියට හීනයක්.

**දරුවගේ වාසනාවට මගේ ජාන 90%ක්ම එයාට ගැළපෙනවා. ඉතින් මගේ ඇටමිදුළු එයාට තැම්පත් කරන්න පුළුවන්. මූලික පරීක්ෂා, සෛල තැම්පත් කිරීම්වලට ලක්ෂ 10ක් වියදම් වුණා. ඒත් සැත්කමට කෝටි දෙකක් ඕනේ**



"සැත්කමෙන් පස්සේ දරුවගේ ඇඟ ඇටමිදුළු රිජෙක්ට් කරනවද, ලේ හැදෙනවද කියන කාරණා ගැන අවධානෙන් ඉන්න ඕනේ. ඒවට අපේ රටේ පහසුකම් නෑ. ඉතින් ඔපරේශන් එක කරලා අවුරුද්දක්වත් යනකල් මාසයක් ගානේ පුතාගේ ලේ ඉන්දියාවේ යවන්න ඕනේ. ඒවටත් ලොකු මුදලක් වැය වෙනවා. ඒ සේරටම තමයි කෝටි දෙකක ඇස්තමේන්තු ලැබුණේ. ඥාතී, හිතමිතුරන්ගෙන් වගේම ෆේස්බුක් එකේ දැනුවත් කිරීම්වලින් අපිට යම් මුදලක් ලැබුණා. හැබැයි තවත් ලක්ෂ 90ක් මදි. ඒ මුදල හොයාගන්න තමයි අපි පිහිටක් පතන්නේ. පුතා පුංචි කාලෙදිම මේ සැත්කම කළේ නැත්තම් සැත්කම සාර්ථක වෙන්න තියෙන ඉඩ අඩුයි."

අයාන් හරිම ලස්සන පුතෙක්. පුංචි අයාන්ට අකුරු ලියන්නත් පුළුවන්ලු. ආච්චි එක්ක කතන්දර කියන එකලු පුතා ආසම වැඩේ. හැමදාම රෑට කටු ගහන්නේ එයාට ලොකු ලෙඩක් තියෙන නිසා කියලා එයාට තාම තේරුමක් නැතිලු. එහෙම තේරෙනවා නම්, "හැමදාම කටු නොගහා සාමාන්‍ය බබෙක් වගේ ගොඩාක්කල් හිනාවෙලා ජීවත්වෙන්න මට උදව් කරන්න නැන්දේ මාමේ!" කියලා අයාන් පුතා ඔයාලට කියයි.

ලෝක තැලසීමියා දිනය යෙදිලා තිබුණේ මැයි 8 වැනිදාට. නමට දිනයක් තිබ්බට අද වෙනකොට තැලසීමියාව ලංකාවේ ප්‍රධානම බෝ නොවන රෝගයක්. අවධානයක් නැති නිසා දවස ගානේ තැලසීමියා රෝගීන් වැඩිවෙනවා. ලංකාවේ ජනගහනයෙන් 4%ක් තැලසීමියා රෝගවාහකයින්. වාහකයින් දෙදෙනෙක්ගෙන් ඇතිවෙන දරුවන්ට මහා තැලසීමියාව ඇතිවෙන්න 25%ක අවදානමක් තියෙනවා. මහා තැලසීමියාව හැදෙන දරුවෝ වගේම ඒ පවුලේ අම්මලා තාත්තලා කායිකව, මානසිකව, සමාජයීයව මහා වේදනාවක් විඳිනවා.

තැලසීමියාව නැති කරන්න නම් කරන්න තියෙන්නේ පුංචි දෙයක්. කසාද බඳින්න කලින් දෙන්නත් එක්කලා රජයේ රෝහලකට ගිහින් HPLC (හිමොග්ලෝබින් ඉලෙක්ට්‍රොපොරොසිස් රුධිර පරීක්ෂාව) කරගන්න. මේක නොමිලේ කරගන්න පුළුවන් පුංචි රුධිර පරීක්ෂාවක්. එහෙම කළොත් නිම්මි අම්මලාට, අයාන් පුතාට වගේ වෙන කාටවත් දුක් විඳින්න වෙන එකක් නෑ.

"අවුරුදු 10ක් යාළුවෙලා ඉද්දි අනාගතේ ගැන හැමදේම ප්ලෑන් කළා. වෙඩින් එක ගත්තෙත් ගොඩාක් ප්ලෑන් කරලා. බබා හදද්දිත් එහෙමයි. හැමදෙයක් ගැනම හිතුවා. ඒ හැමදේම ප්ලෑන් කළ අපිට මේක අමතක වුණා. අපේ සුදු පුතාට මෙච්චර දුක් විඳින්න වෙයි කියලා දැනගෙන හිටියා නම් කොච්චර ආදරේ වුණත් කවදාවත් අපි දෙන්නා කසාද බඳින්නේ නැහැ දෙයියනේ."

ඒ පාර නම් නිම්මි අම්මට කඳුළු හංගගන්න බැරි වුණා. අයාන් පුතාගෙයි මේ අම්ම තාත්තගෙයි ඒ කඳුළු පිහිදලා ආයෙත් ඒ පවුලට හිනාවක් දෙන්න පුංචි හරි උදව්වක් කරන්න පුළුවන් නම් අයාන් බබාගේ තාත්තට කතා කරන්න, 0763837005.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# උඹලට වපරයක් නැති එකට මං මොනවා කරන්නද?

"වපරී වපරී "

ඒ, කුඩා කාලයේ සිට පාසලේ මිතුරන් මට පට බැන්ද වූ නාමයයි.

මා නිවසට ගොස් හඬා වැටෙද්දී මා සනසන්නේ කිරිඅම්මාය.

"අනේ මගේ රත්තරනේ උන්ට පැලියාව. ඊර්ෂියාව. පින් වපරයක් පිහිටන්නේ කලාතුරකින් කෙනෙක්ට මගේ රත්තරනේ." කිරිඅම්මා මා තුරුළු කරගෙන සැනසුම් බස් දෙඩන්නීය.

"මොකද්ද කිරිඅම්මේ පින් වපරය කියන්නේ?" මා දිනක් විමසුවෙමි.

"උපතින්ම ඔහොම වපරයක් පිහිටන්නේ පෙර කළ පින් නිසා දුවේ. උඹලගේ අම්මා නම් අහසින් පොළොවට කඩන් වැටුණු එකියක් වගේ බයවෙලා උඹව ඉස්පිරිතාලේ උස්සන් යන්න හැදුවා. මම තමා තේරුම් කරලා දුන්නේ ඕක කොච්චර පින්සාර ලකුණක්ද කියලා." කිරිඅම්මා පවසද්දී මා සැනසුනෙමි.

ඉන් අනතුරුව මා මට විහිලු කරන්නට එන මිතුරු මිතුරියන් හට ආඩම්බරයෙන් ඒ ගැන කියන්නට පුරුදු වූයෙමි.

"ඔයාලට පින් නැහැ කියලා මම මොනවා කරන්නද?"

"මේකට කියන්නේ පින් වපරය කියලා. ඔයාලට නැති නිසානේ ඔය ඊර්ෂියාව."

මා ඔවුන්ගේ විහිලු ගණනකට නොගෙන පවසද්දී විහිලු කිරීමද නැවතී ගියේය.

කාලයත් සමඟ මා රූමත්ව වැඩෙන බව කිරිඅම්මා නිතරම කීවේ බොහෝ ආඩම්බරයෙනි.

"අම්මෝ මගේ කෙල්ලගේ ලස්සන. පාට ඇත්දළ වගේ. කොණ්ඩේ කඩා හැලෙනවා. මේ ලස්සනට ගහන්න ඒක කෙල්ලෙක් නැහැ මේ ගමේ." කිරිඅම්මා පසසද්දී අම්මා සහ තාත්තාද ආඩම්බරයෙන් සිනාසෙන්නෝය.

මේ අතර උසස් පෙළ ටියුෂන් පන්තියේදී හමුවන ශමාල් මා දෙස උනන්දුවෙන් බලනා බව මට දැනිණි. ශමාල් පෙනුමින් කඩවසම්ය. පන්තියේ ඉහළම ලකුණු ගන්නා සිසුන් අතර සිටි ඔහු මා ගැන උනන්දු වනවා දැකීම මා සිත කුල්මත් කරන්නට පටන් ගෙන තිබිණි.

මාගේ සිතද නොදැනීම ඔහු වෙත ඇදී යමින් පවතින අතරේ ඔහු කියූ කතාවක් මට ආරංචි විණි.

"පුදුම ලස්සනක් බන් තියෙන්නේ ඒකිගේ. ඇඟේ හැඩ වාත්තු කළා වගේ. ඒත් බන් අර වපරේ නිසා මට සෙට් වෙන්නේ නැහැ. ඔය වපරේ නැත්තම් මම මේ වෙද්දීත් සෙට් කරගෙන." එවදන් මට ආරංචි වූ විට මා හඬා වැටුණෙමි. එදා පන්තියට ඉන්නෙවත් නැතුව හැරී ගෙදර ආවෙමි.

"පින් වපරේ. මේකේ කොහෙද පිනක්. මේක මහා පවක්." මම සිතින් කිරිඅම්මාට බැන වදිමින් නිවසට ගොඩ වැදුනෙමි.

නමුත් මේ ගැන කිරිඅම්මාට කියන්නට බැරිය.

මම අම්මාට කිට්ටු වුණෙමි.

"අම්මා, කිරිඅම්මා ඉස්සර කියනවා නේද මම ඉපදුණු කාලේ අම්මා මාව එක්කගෙන ඉස්පිරිතාලේ යන්න හැදුවා කියලා. මේ වපරේ නිසා?"

"ඔව් දූ. මම අහලා තියෙනවා ඔය පොඩි පොඩි බේත් වගයක් කළාම වපර ගතිය අයින් කරන්න පුළුවන් කියලා. ඒත් ඉතින් දූගේ තාත්තයි, කිරිඅම්මයි කැමති වුණේම නැහැනේ. එයාලා කිව්වේ ඕක පින් වපරයක් කියලා." අම්මා කියද්දී මගේ නෙතින් ආයෙමත් කඳුළු කඩා හැලිනි.

"අනේ අම්මා. ඔයාලට තිබුණේ එයාලා කියන දේවල් අහන්නේ නැතුව මාව ඉස්පිරිතාලේ ගෙනියන්න. අනේ අම්මා මාව දැන්වත් ගෙනියන්න. මට බැහැ මෙහෙම ජීවත්වෙන්න." මම හඬා වැටුණෙමි.

ඉතින් එළැඹුණු දිනයක අම්මා මා



රැගෙන රෝහලට ගියේ තාත්තා සහ කිරිඅම්මාට රහසිනි.

"වපරයක් නිට්ටාවටම සුව කරන්න පුළුවන් පොඩි දරුවෙක්ගේ. වපරය අඳුනගත්තු ගමන් ගෙනාවා නම් හරිම ලේසියි ඒක නැති කරන්න." වෛද්‍යවරයා කියද්දී මා වේදනාවෙන් බලා සිටියෙමි.

"ඒ කියන්නේ මහත්තයෝ අපිට දැන් බැරිවෙයිද?" අම්මා ඇසුවාය.

"මෙහෙමයි මම බැහැ කියනවා නෙවේ අම්මා. ඔපරේෂන් එකක් කරන්න පුළුවන්. ඒත් ඒක අවදානම්. පොඩි කාලෙදිම එක්කගෙන ආවා නම් පොඩි පොඩි ව්‍යායාම ප්‍රතිකර්ම කීපයක් මඟින්ම සුව කරගන්න තිබ්බා."

"අනේ මහත්තයෝ ඇත්තටම මට ඕනේ වුණේ කෙල්ලව පොඩි කාලෙදිම ඉස්පිරිතාලේ එක්ක එන්න තමා. ඒත් දුවගේ තාත්තයි කිරිඅම්මයි විරුද්ධ වුණානේ මේ පින් වපරයක් කියලා." අම්මා කියද්දී මා නිහඬව බලා සිටියෙමි.

වෛද්‍යවරයාගේ මුවේ මැවුනේ සිනාවකි.

"පින් වපරය? එහෙම එකක් නැහැ අම්මා. වපරය කියන්නේ ලෙඩක්. වපරය වෛද්‍ය විද්‍යාවෙන් හඳුන්වන්නේ අක්ෂි චලන ආබාධය කියලා. මේ අසනීපය නිසාම පසුකාලීනව ඇස්වල පෙනීම දුර්වල වෙන්න පුළුවන්. පසුකාලීනව ඔලුවේ කැක්කුම, ඇස්වල වේදනාව, එක රූපය රූප දෙකක් වෙලා පේන්න ගන්න පුළුවන්. අනිත් එක සමහර වෙලාවට වපරය කියන්නේ රෙටිනෝබ්ලාස්ටෝමා කියන පිළිකාවේ රෝග ලක්ෂණයක්. අන්න ඒ නිසා පොඩි දරුවෙක් වපරය ආබාධයෙන් පීඩා විඳිනවා කියලා දැනුණු ගමන් කරන්න ඕනේ ඒ දරුවාව වෛද්‍යවරයෙක් ළඟට ගේන එක. ගොඩක් අය ළඟ තියෙන මේ පින් වපරය කියන අන්ධ විශ්වාසය නිසා දරුවෝ ගොඩක් අසරණ වෙනවා. තරුණ කාලයේදී වපරය නැති කරලා දෙන්න කියලා මා ගාවට ඕනේතරම් දරුවෝ ඇවිත් තියෙනවා. තරුණ කාලයේදී ඕනෙම කෙනෙක් හිතන්නේ තමන්ගේ ලස්සන ගැන. ඉතින් වපරය ගැන කළකිරෙන එක පුදුම වෙන්න දෙයක් නැහැනේ."

වෛද්‍යතුමාගේ දීර්ඝ පැහැදිලි කිරීමෙන් පසුව මා මඳක් කල්පනා කළෙමි.

"ඔපරේෂන් එක කරන්න මම විභාගයෙන් පස්සේ එන්නම් ඩොක්ටර්." ඔහුට කී මම අම්මා සමඟ නිවසට පැමිණියෙමි.

ශමාල්ව අමතක කර දමා මම හොඳින් පාඩම් කර විභාගයට මුහුණ දුන්නෙමි. විශ්වවිද්‍යාලයේදී මාගේ වපරය ගැන කරදර නොවූ තරුණයෙකු මට මුණගැසිනි. ඔහු වසන්තය. ඔහුගේ සිත මා ළඟ නතරව තිබුණේ අහඹු සිදුවීමක් නිසාය.

මා සවස්වරුවක දේශනා අවසන් වී නේවාසිකාගාරය වෙත පැමිණෙමින් සිටියෙමි. පාරේ වේගයෙන් ගිය කාර් රථයකට හසු වූ බලුපැටවෙකු වේදනාවෙන් හඬ දෙද්දී පළමුව එතැනට දුවගෙන ගියේ මාය. දෙවනුව ඔහුය. විශ්වවිද්‍යාලයේදී දැක පුරුදු වුවද, කිසිදු කතා නොකර තිබූ නාඳුනන ඔහු සහ මම එකම ත්‍රීරෝද රියකට නැගී බලුපැටවාව සත්ව රෝහලකට ගෙන ගියෙමු. ඉතින් අපේ කතාවේ ආරම්භය එය විය.

වපරය ඉවත් කර දැමීමේ ශල්‍යකර්මය කර ගැනීමට මා ගත් තීරණයේදී ඔහු මා අසළින්ම සිටියේය.


"මතක තියාගන්න කෙල්ලේ. මගේ හිත නම් ඔයා ළඟ නැවතුණේ පෙනුම නිසා නෙවේ. මම වගේම ඔයත් සත්තුන්ට ආදරේ නිසා. එදා අර බලුපැටියා ඇක්සිඩන්ට් වුණාම මම තරමටම ඔයත් කලබල වුණු නිසා. ඉතින් ඔයා ඔය ඔපරේෂන් එක කළත් නැතත් මගේ ආදරේ නම් වෙනසක් නැහැ." ඔහු කියද්දි මම සතුටින් සිනාසුණෙමි.

"ඒත් මම ආසයි ඇස්වල වෙනසක් නැතුව සාමාන්‍ය කෙනෙක් වගේ ඉන්න." මා කීවෙමි.

"මම දන්නවා. අපි ඔපරේෂන් එක කරගමු." ඔහු මට එකඟවෙමින් පැවසුවේය.

■ සමාධි ඩයස්

# කාක දූපතේදී රීටා ජෝන් මැරූ කාමාතුරයන් කොටුවුණු හැටි





ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. හෙතෙම නීතිය නව්‍යකරණයට මෙන්ම නීතිය පිළිබඳ සරල අන්දමින් දැනුවත් කිරීමට සක්‍රීයව දායක වන්නෙකි. නීති ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් උසුලන සිදුවීම් සම්බන්ධයෙන් ඔහු දක්වන අදහස් නීති ක්ෂේත්‍රයේ අයට පමණක් නොව, රටේ සාමාන්‍ය පුරවැසියන්ටද එකසේ වැදගත් වේ. මේ, එලෙස සැකසෙන ලිපි මාලාවක පහළොස්වැන්නයි.

අපරාධයක දරුණු බව එය සිදුකරන මොහොතේදී ඊට දායක වන පුද්ගලයින් නොදන්නවා හෝ නොසලකා හරිනවාදැයි අප කිසිවකු දන්නේ නැත. එහෙත් ඔවුන් ඉතිරි කරන දරුණු කළු පැල්ලම් ඉතිහාසයට එකතු වෙයි. මේ එවැන්නකි. ශ්‍රී ලංකාවේ සිදුවූ බිහිසුණු අපරාධ ගොන්නේ ඉහළින් මෙයද තිබෙන බවට කිසිඳු සැකයක් නොවේ.

## මුහුදෙන් එතෙර ජීවන සහකරු

ඉන්දියාවේ උපන් රූමතියක වූ රීටාගේ සිත ගියේ ශ්‍රී ලාංකික නාවික ඉංජිනේරුවකු වූ මනෝහරන් වෙතය. විවාහයද ඔහු ගෙල පැළඳූ 'තාලිය' හෙවත් 'මංගල සූත්‍රය' රීටාගේ ගෙලේ විය. අභරණ සඳහා දක්වන රුචිකත්වය නිසාමදෝ රීටා නිරන්තරයෙන් ඒවායින් සැරසී සිටියාය. සිය සහකරුගේ උපන් දේශය වූ ශ්‍රී ලංකාවට ඈ පැමිණියේ 1998 සැප්තැම්බර් විසි වනදාය. සැමියාගේ නිවහන මට්ටක්කුලිය, මෝදර පිහිටි කාක දූපත ආශ්‍රිතව පිහිටා තිබිණ. අලුත විවාහ වූ යුවලට යාමට ඒමට තැන් ඕනෑතරම් විය. ඔවුහු හැකි සෑම අවස්ථාවකම නිදහස භුක්ති විඳින්නට ඇත. 1998 ඔක්තෝබර් එකොළොස් වනදාද රීටා සිය සැමියා මනෝහරන් සමඟ කාක දූපතේ කැලණි ගං මෝය දෙසට ඇවිදින්නට ගියාය. නිල් පැහැ ඩෙනිම් කලිසමකින් සහ ලා කොළ පැහැ කමිසයකින් සැරසුණු ඈ සුපුරුදු ලෙසම ආභරණ පැළැන්දය. දෙකනේ 'gypsy' කරාබු ජෝඩුවකි. මංගල මාලයෙහි KDM යන අකුරු සහිත පෙන්ඩනයක්ද විය. මල් මෝස්තර සහිත වළලු දෙකක්ද ඈ පැළඳ සිටියාය.

## අවසාන වතාවට විඳි කඩල රස

ඇවිදින අතරේ අසල සිටි වෙළෙන්දෙකුගෙන් කඩල ගොට්ටක්ද ඔවුහු මිල දී ගත්හ. කඩල කමින් පෙම් සුව විඳිමින් ඇවිද ගිය දෙදෙනා පසුව නැවත හැරී පැමිණියහ. ඒ එන අතරතුරදී ඔවුන්ට නාඳුනන මිනිසුන් කිහිපදෙනෙකු පෙරමගට හමුවිය. රීටා - මනෝහරන් යුවල ඔවුන් හඳුනන්නේ නැත. නමුත් ඔවුන් මාර්ගය හරස් කරන බවක් දක්නට ලැබිණ. නාඳුනන මිනිසුන්ගෙන් එක් අයෙක් රීටාගේ අතින් අල්ලාගත්තේය. ඊට විරෝධය දක්වමින් මනෝහරන්, බිරිය තමා වෙතට ළංකර ගත්තේය. අසභ්‍ය වදන් හුවමාරුවක්ද සිදුවිය. පිරිස අතර සිටි එක් අයෙක් සෙසු අය මගහැර එතැනින් ඉවත්ව ගියේය.

සෙසු තිදෙනාද තරමක් දුරස්ව සිටියත් වාතාවරණය යහපත් නැති බව මනෝහරන් තේරුම්ගත්තේය. හෙතෙම මෙතැනින් පළා යන්නැයි රීටාට කීවේය. ඒ උපදෙස පිළිගත් ඈ දුවන්නට වූවාය. එහෙත් පසුපස හඹා ගිය පළමු විත්තිකරු රීටා සිය ග්‍රහණයට ගත්තේය. ඒ තමා සතුව පිස්තෝලයක් ඇති බවටද අනතුරු අඟවමිනි. අනෙක් විත්තිකරුවන් දෙදෙනා සමඟ මනෝහරන් සටන් වැදුණෝය. රීටා දිගින් දිගටම කෑ ගැසුවාය.

## බිරියගේ හඬ නෑසී යයි

දෙවැනි විත්තිකරු මනෝහරන්ගේ බෙල්ලෙන් අල්ලා ගත්තේය. මනෝහරන්ගේ කමිසයෙන් ඇදගෙන සිටි තෙවන විත්තිකරු ඔහුගේ උදරයට පා පහරක් එල්ල කළේය. ඔහු පැළඳ සිටි උපැස් යුවලද බිම වැටුණේ ඒ ගැටුම අතරය. දෙදෙනෙකුගේ ප්‍රහාර හමුවේ වුව මනෝහරන්ද ප්‍රතිප්‍රහාර එල්ල කළේය. දෙවැනි විත්තිකරු සහ මනෝහරන් බිම ඇද වැටුණහ. ඒ අවස්ථාවේ දෙවැනි විත්තිකරු මනෝහරන්ගේ පපුවේ වම් තන පුඩුවට පහළින් සපා කා තිබේ. දෙවැනි විත්තිකරුගේ මුහුණටද පහර කීපයක් එල්ල විය. මේ සියලු ගැටුම් මධ්‍යයේ සිය බිරිය උදව් ඉල්ලා කෑ ගසන අයුරු මනෝහරන්ට ඇසිණ. එහෙත් ටික වේලාවකින් පසු ඒ හඬ නෑසී ගියේය. මනෝහරන් සමඟ ගැටුණු දෙවැනි සහ තෙවැනි විත්තිකරුවෝද පළමු විත්තිකරු රීටා රැගෙන ගිය දෙසට දිව ගියහ. පහරදීමට ලක්ව බිම වැටී සිට නැගිටි මනෝහරන්ට කළ යුතු කිසිවක් සිතා ගැනීමට නොහැකි විය. අවට කිසිවකුගෙන් උපකාර හිමි වූයේද නැත. හෙතෙම නිවසට දුව ගොස් උසස් පොලිස් නිලධාරියකු වූ සිය පියාට සිදුවීම දැනුම් දුන්නේය.



රීටාගේ මළ සිරුර සොයා ගත් මොහොත

## සෙවීම නිශ්ඵලයි

පියා සහ තවත් පිරිසක් සිදුවීම වූ දෙසට ගොස් අවට පිරික්සුවේ රීටා සොයාගැනීමේ අපේක්ෂාවෙනි. සවස් වෙද්දී පොලිසියේ සහායද ඊට හිමිවිය. නිල සුනඛයින් සහ හමුදා භටයින්ද ඊට එක් වී තිබේ. නමුත් අඳුර රජයන කඩොලාන, පඳුරු, වැල් ආදියෙන් ගහණ පෙදෙසින් රීටා හමුවූයේ නැත. සොයාගැනීමට හැකිවූයේ ඇගේ පාවහන් යුගල සහ මනෝහරන්ගේ කමිසය පමණි.

## සැකකරුවන් සෙවීමේ මෙහෙයුම

රීටා පිළිබඳ කිසිඳු තොරතුරක් නොවූවද ඔක්තෝබර් 13 වනදා පොලිසියට ලැබුණු තොරතුරකට අනුව පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබිණි. ඔහු සිදුවීම ද විත්තිකරුවන් තිදෙනා සමඟ සිට ඉවත්ව ගිය තැනැත්තායි. ඔහු ලබාදුන් හෝඩුවාවක් ඔස්සේ පොලිසිය මුලින්ම ගියේ කොම්පඤ්ඤවීදියටයි. එහිදී දෙවැනි විත්තිකරු හමුවිය. එදිනම සවස දළුගම, කොහොල්විලදී තෙවන විත්තිකරුද අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකියාව ලැබිණි. පළමු විත්තිකරු පිළිබඳ ඒ වනවිටද කිසිඳු තොරතුරක් නැත. අත්අඩංගුවට ගත් දෙදෙනාගෙන් වෙන වෙනම ප්‍රකාශ සටහන් කර ගැනිණ. ඔවුන් දෙදෙනාම පැවසුවේ රීටාගේ මළසිරුර තිබෙන ස්ථානය දන්නා බවයි.

## නවතම ක්‍රමවේදයක්

සාක්ෂි ආඥා පනත ප්‍රකාරව පොලිසියට දෙන කටඋත්තරයක් සාක්ෂියක් නොවේ. එහෙත් ඒ ඔස්සේ ගොස් යමක් සොයාගතහොත් ඒ සොයාගැනීමට අදාළ කොටස පමණක් සලකුණු කර සාක්ෂියක් ලෙස ඉදිරිපත් කළ හැකිය. එහිදී විමර්ශකයින් මුලින් දෙවැනි විත්තිකරු සිද්ධිය වූ ස්ථානයට රැගෙන ගොස් දුරින් හිඳ ඔහු පෙන්වන ස්ථානය x ලෙස සටහන් කරගත්හ. පසුව තෙවන විත්තිකරු සමඟද සිද්ධිය වූ ස්ථානයට ගොස් පෙර සේම දුරින් හිඳ ඔහු පෙන්වන ස්ථානය y ලෙස සටහන් කරගත්හ. දෙදෙනාම අවස්ථා දෙකකදී පෙන්වා තිබුණේ එකම ස්ථානය බව තහවුරු වූ අතර ඒ අනුව කරන ලද සෝදිසි කිරීමේදී විමර්ශකයින්ට රීටාගේ මළසිරුර තිබූ තැන සොයාගැනීමට හැකිවිය. ඒ අනුව එවකට සොලිසිටර් ජනරාල්ව සිටි සහ මෙම නඩුවේ පැමිණිල්ල මෙහෙය වූ සී.ආර්.ද සිල්වා මෘත ශරීරය සොයාගැනීමට තොරතුරු දුන් විත්තිකරුවන් දෙදෙනාගේම ප්‍රකාශ සාක්ෂි ආඥා පනත යටතේ අදාළ කරගත්තේය. එය ඉතාම සුවිශේෂ කරුණකි.

## සලු පිලි අභරණ රහිතව අවසන් ගමන් ගිය රූමතිය

හැඩකාර රීටා ඉස්තරම් ඇඳුමින් සහ අභරණින් නිතර සැරසුණාය. මනෝහරන් සමඟ අවසන් වරට ඇවිදීමට යද්දීද ඈ සැරසුණේ එසේය. ඇය එදා ඇඳ සිටි බව කියන යටඇඳුම්ද සිංගප්පූරුවෙන් මිලදී ගත් ප්‍රකට වෙළඳ සන්නාම සහිත ඒවාය. එහෙත් මෘත ශරීරය හමුවන විට ඇගේ සිරුරේ වූයේ කන පැළඳි 'gypsy' යුගල පමණි. පසුව ඇගේ ඇඳුම්ද අවට තිබී සොයාගෙන තිබේ. ඒ සියල්ල සැමියා හඳුනාගත්තේය. පසුව මහේස්ත්‍රාත්වරයා සමඟම අධිකරණ වෛද්‍ය නිලධාරියාද එම ස්ථානයට පැමිණියේය. මළසිරුර මෘත ශරීරාගාරයට යැවීමෙන් පසු සිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්විණ. එහිදී හෙළිවූයේ ඇය සමූහ ස්ත්‍රී දූෂණයකට ලක්කර ඝාතනය කර ඇති බවයි. එමෙන්ම ඇගේ ආහාර මාර්ගයේ තිබී හමුවුණු කඩලවල ස්වභාවය අනුව ඒවා අනුභව කර වැඩි වේලාවක් යාමට ප්‍රථම ඝාතනය සිදුව ඇති බව හෙළි කෙරිණ. ගෙල සිර කිරීමෙන් මරණය කළ බවටද සාධක හමුවිය.

## මොහොතක ආසාව තෘප්ත කර සැඟව සිටි සැකකරු

නව ජීවිතයක් ගැන බලාපොරොත්තු තබමින් මෙරටට පැමිණි රීටාගේ අපේක්ෂා පමණක් නොව ජීවිතයද නැති වූයේ පිරිසකගේ එක මොහොතක ආසාවක් සංසිඳවීම වෙනුවෙනි. ඒ සා අපරාධයක් සිදුකළ අයට වන්නේ ලෝකයෙන් සැඟව සිටීමටය. එහෙත් සදාකාලිකව සැඟව සිටිය නොහැකි වේ. සිරුර සොයාගැනීමෙන් පසු පළමු විත්තිකරුද හසලක ප්‍රදේශයෙන් අත්අඩංගුවට ගැනීමට හැකි විය. අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් ඔහු පරීක්ෂා කරනු ලැබීය. ඔහුගේ සිරුරේ තුවාල සලකුණු තිබිණ. දෙවැනි සහ තුන්වැනි විත්තිකරුවන්ගේ සිරුරුවලද තුවාල සලකුණු තිබී ඇත.

## රීටාගේ වළලු විත්තිකරුවකුගේ බිරිය සන්තකයේ

පළමු විත්තිකරුගේ බිරිය ඇය සන්තකයේ තිබූ වළලු ජෝඩුවක් පොලිසියට බාර දුන්නාය. ඒවා රීටා පැළඳ සිටි ඒවායි. ඊට අමතරව දෙවැනි විතතිකරුගේ නිවස පරීක්ෂා කිරීමේදී රීටාගේ තාලිය සහ පෙන්ඩනයද හමුවිය. ඒ සියල්ල මනෝහරන් නඩු විභාගයේදී හඳුනාගත්තේය.

## විත්තිකරුවන්ට එරෙහි චෝදනා

අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනාම හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කෙරිණ. මනෝහරන් ඒ සියල්ලන් හඳුනාගත්තේය. වෙනත් ඇසු දුටු සාක්ෂි කිසිවක් නැති වුවද මනෝහරන්ගේ සාක්ෂිය ප්‍රබල පරිවේෂණීය සාක්ෂියකි. මනෝහරන් අවසාන වරට රීටා දකින විට ඈ සිටියේ විත්තිකරුවන් භාරයේය. ඈ දූෂණයට ලක්ව ඇත්තේ ඔවුන්ගේ ග්‍රහණයට හසුවීමෙන් පසුවයි. එදින පස්වරුවේ එය වූ බවට ස්වාධීන වෛද්‍ය සාක්ෂි තිබේ. ආහාර ජීර්ණය වීම අනුව මරණය සිදුවූ වේලාව නිර්ණයද ප්‍රබල සාධකයකි. මෘත ශරීරය හංගා තිබූ තැන ගැන දෙවන සහ තෙවන විත්තිකරුවෝ දැන සිටියහ. මරණකාරියගේ ආභරණද විත්තිකරුවන් සන්තකයේ තිබියදී සොයා ගැනිණ. ඔවුන්ගේ සිරුරුවල තුවාලද සිදුවීම සමඟ හොඳින් ගැළපේ. පැමිණිල්ලට ප්‍රබල පරිවේෂණීය සාක්ෂි තිබියදී විත්තිකරු ඒ සාක්ෂි ගැන පැහැදිලි නොකරන්නේ නම් විත්තිකරුට එරෙහිව යන තීරණයකට එළඹීමට හැකිය. එම ක්‍රමවේදය හඳුන්වන්නේ එලන්බරෝ සිද්ධාන්තය වශයෙනි. නමුත් එම ක්‍රමවේදය භාවිත කෙරෙන්නේ විරල වශයෙනි. මරණකාරිය පොදු ස්ථානයකදී විත්තිකරුවන්ට හමුවූයේ නම් ඇයට වූ දේ පැහැදිලි කිරීමට ඔවුන් බැඳී නැත. එහෙත් ඈ සිටියේ මොවුන්ගේ භාරයේය. එබැවින් ඔවුන්ට නිහඬව සිටිය නොහැකිය. එසේ නිහඬ වුවහොත් ඔවුන්ට විරුද්ධව පවතින සාක්ෂි අනුව තීන්දුව ලබාදිය හැකිය. විත්තිකරුවන් තිදෙනාට එරෙහිව ත්‍රි පුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ නඩු පැවරුණේ චෝදනා හයක් යටතේය. පළමු සහ දෙවන විත්තිකරුවෝ පැහැරගෙන යාම, නීති විරෝධී සංසර්ගයකට බලපෑම් කිරීම, සමූහ දූෂණයකට ලක් කිරීම, ආභරණ කොල්ලකෑම සහ මිනීමැරීමේ චෝදනාවලට වරදකරුවෝ වූහ. සිර දඬුවම්වලට අමතරව මරණ දණ්ඩනයටද ඔවුහු යටත් වූහ. තෙවන විත්තිකරු ආභරණ කොල්ලකෑම හැර සෙසු සියල්ලට වරදකරු විය. ඔහුටද සිර දඬුවම් සහ මරණ දඬුවම නියම විය.



අත් අඩංගුවට පත් සැකකරුවෝ...

## තීන්දුවට එරෙහි අභියාචනයක්

චූදිතයෝ තීන්දුවට එරෙහිව අභියාචනය කළහ. එහිදී මතු කළ ප්‍රධාන තර්කයක් වූයේ විත්තිකරුවන් තිදෙනා අත්අඩංගුවට ගැනීමට තොරතුරු ලබාදුන් තැනැත්තා අපරාධ සහායකයකු ලෙස නම් කිරීමයි. ඔහු මේ පිරිස සමඟ සිටියදී අපරාධයට පෙර එම ස්ථානයෙන් ඉවත් වූ, පසුව පොලිස් භාරයට පත් තැනැත්තායි. ඔහු අපරාධයේ කිසිඳු අදියරකට දායක වී නැත. එසේ තිබියදී ඔහු අපරාධ සහායකයකු ලෙස නම් කිරීම සහ ඔහුගේ සාක්ෂි විභාගයට නොගැනීම ප්‍රශ්නගත විය. එමෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තියට අනුව පොදු අදහසක් ඉටු කරගැනීමට කීපදෙනෙකු කරන ක්‍රියාවක් ලෙස විත්තිකරුවන්ගේ පොදු චේතනාව ඔප්පු වී නොමැති බවද ඉදිරිපත් විය. තවත් කරුණු කිහිපයක් ඉදිරිපත් වුවද ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේ තීන්දුවට ඉන් බලපෑම් එල්ල නොවන බවයි. ඒ අනුව මහාධිකරණය තීන්දුව තහවුරු කී ශ්‍රේෂ්ඨාධිකරණය දඬුවම් සඳහා එක් සංශෝධනයක් පමණක් කළේය. දණ්ඩ නීති සංග්‍රහයේ 357 වන වගන්තියේ දැක්වෙන්නේ ස්ත්‍රියක අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම ගැනයි. ඒ සඳහා නියමිත දණ්ඩනය ඉක්මවා දඬුවමක් මහාධිකරණය ලබා දී තිබිණ. එබැවින් එය වසර දෙකකින් අඩු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළේය.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මෙම සිදුවීම හුවාදක්වමින් පෙන්වා දෙන්නේ කවරාකාරයේ අපරාධයක් කළද සැමදා සැඟව සිටිය නොහැකි බවයි.

"විමර්ශකයින් දක්ෂ වුවොත් කිසිම අපරාධයක් කාලයේ වැලිතලාවට යටව යන්නේ නෑ. ඔවුන්ට පුළුවන් කෙසේ හෝ ඒවා මතු කරගන්න. මේ සිදුවීමේදී විමර්ශකයින් සොයාගත් කරුණු සිදුවීමට ඉඩ නැතැයි සිතෙන මට්ටමේ අභව්‍ය ඒවා නොවීමත් විශේෂයි. ඒ වගේම තමයි අපි යන එන තැන්වල පරිසරය ගැන වුණත් අපි බොහෝදුරට සැලකිලිමත් වෙන්න ඕනෙ, අපේ ආරක්ෂාව වෙනුවෙන්."

■ නීතිඥ රෂ්නිකා ලියනගේ



ජනාධිපති නීතිඥ
සරත් ජයමාන්න විසින් රචිත
**යළි මැවෙන අපරාධයක්** පොත
ඔබේ නිවසටම ගෙන්වා ගැනීමට
www.slbooks.lk වෙබ් අඩවියට
පිවිසෙන්න.
නැතහොත් 0777342809 අංකයට
Inbox/WhatsApp/SMS කරන්න.

මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# අහසට ඇඟිල්ල දික් කරලා වැස්ස නවත්තන්න අපේ නඩේ ගුරාට පුළුවන්



වර්තමානයේ බොහෝවිට දකින්නට නොලැබුණද පැරණි වන්දනා නඩවල මාර්ගෝපදේශකවරයා ලෙස කටයුතු කළේ 'නඩේ ගුරා' ය. එහෙවි පසුබිමක පසුගිය ශ්‍රී පාද වන්දනා සමයේ සිය කැමැත්තෙන් කඩුවෙල ප්‍රදේශයේ සිට සිරිපා වන්දනාවේ ගිය වන්දනාකරුවන්ට නඩේ ගුරකු බවට පත්වූ ආශ්චර්යමත් බලයක් සහිත පුද්ගලයකු පිළිබඳව මට දැනගන්නට ලැබුණි. දැනගන්නට ලැබුණු අන්දමට ඔහු සමන් දෙවියන්ගේ සුවිශේෂී ආදරයටත් කරුණාවටත් පාත්‍ර වූ පුද්ගලයෙකු වන අතර ඒ ඔස්සේ ලබාගත් විශ්ව ශක්තියකටද හිමිකම් කියන්නෙකි.

"මම පහුගිය සිරිපාද වාරේ දෙවතාවක්ම සිරිපාදේ කරුණා කළා. ඒ මුල් ගමනේදී තමයි අපිට ඔය කියන ගුරුතුමා හමුවුණේ. ඒ සැරේ වන්දනා ගමනට යොදගත්තු බස් එක අයිති මුදලාලි තමයි අපිට මුලින්ම ඒ ගුරුතුමාව සම්බන්ධ කරලා දුන්නේ. අපේ වන්දනා නඩේ හතළිස් හතක් විතර හිටියා. ඒත් අපිට නඩේ ගුරෙක් කියලා කෙනෙක් හිටියේ නෑ. පස්සේ මේ ගුරුතුමා තමයි අපිත් එක්ක ඒ වන්දනා ගමනට එකතුවෙලා හැමදෙයක්ම බලා කියාගෙන කටයුතු කළේ. ඒ වන්දනා ගමනේදී අපිට ඒ ගුරුතුමාගේ විශේෂ ගති ලක්ෂණ කීපයක් වැටහුණු හින්ද තමයි අපි කීපදෙනෙක් කතා කරලා අපේ දෙවැනි සිරිපාදේ වන්දනා ගමනටත් එතුමව සම්බන්ධ කරගත්තේ. ඒ ගමනටත් හතළිස් නවදෙනෙක් සම්බන්ධ වුණා."

පසුගිය ශ්‍රී පාද වන්දනා සමය තුළ ඒ නඩේ ගුරා සමඟ දෙවරක්ම ශ්‍රී පාද වන්දනා ගමන්වලට එක්වූ කඩුවෙල ඉහළ බෝමිරිය ප්‍රදේශයේ කාන්තාවක් මා හා කීවාය.

ඇය වැඩිදුරටත් මා හා කී තොරතුරු අනුව එම ගුරුතුමා පිළිබඳ වැඩිදුර තොරතුරු මෙසේය.

දෙම්පේ ප්‍රදේශයේ පුද්ගලයෙකු බව පැවසෙතත් ඔහු පිළිබඳව ඊට වැඩි තොරතුරක් ඇය නොදනී. ඇය පවසන අන්දමට ඔහු පනස්පස් වියැති තනිකඩයෙකි. කලක් දෙම්පේ ප්‍රදේශයේ ඇති ආරණ්‍ය සේනාසනයක බවුන් වඩමින් සිටියදී ඔහු වෙත සමන් දෙවියන්ගේ ආකර්ෂණය ලැබී තිබේ. ඉන්පසු එහිම පැවිදි වී ආරණ්‍යවාසී හිමි නමක සේ වැඩසිටීමේ අවස්ථාව අතහැර ජන සමාජයට පිවිස අප සමාජයේ අසරණ වූවන්හට සමන් දෙවියන්ගේ පිහිටාරක්ෂාව ලබාදීමේ විශේෂ ව්‍යාපෘතියකට අතගසා ඇත. එම තීරණය මත සමාජගත වූ ඔහු ඉකුත් වසර තිහක පමණ කාලය තුළ දහස් වරක් පමණ විවිධ වන්දනා නඩ සමඟ සිරිපා කරුණාවේ යෙදී තිබේ. මා හා එම විස්තර හෙළිකළ කාන්තාව කී අන්දමට එම ගුරුතුමා ඒ වන්දනා ගමන්වලදී වන්දනා නඩවලට කරන සේවය වෙනුවෙන් කිසිඳු මුදලක් හෝ වෙනයම් ලාබ සත්කාරයක් අපේක්ෂා නොකරන්නෙකි. මුළුමනින් නිර්මාංශාහාරිකයකු වන ඔහු එම වන්දනා නඩයෙන් ලැබෙන ආහාරපානවලින් පමණක් සෑහීමකට පත්වන්නෙකි.

"අපි පහුගිය සැරේ මුල්ම වතාවේ සිරිපාදේ කරුණා කරනකොට ගඟුලතැන්න පහුවෙනවත් එක්කම හතරවටින්ම ආපු වැහි වලාකුළු අපිව වට කරගත්තා. එද වන්දනාකාරයෝ හුඟක් වැඩියි. හැමෝටම නොතෙමී ඉන්න තැනක් හොයාගන්න එකත් හරිම අමාරු වුණා. ඔය අතරේ ගුරුතුමා එකපාරටම 'ඔහොම පොඩ්ඩක් ඉන්න මාත් පුංචි උත්සාහයක් දරලා බලන්න' කියලා එයාගේ දකුණු අත එකපාරටම ඉහළට කරගෙන දබරැඟිල්ල අහසට දික්කරගෙන විනාඩි කීපයක් නිසොල්මන්ව හිටියා. ඊටපස්සේ 'දැන් බොහෝවිට හරියයි' කියලා අත පහළට දලා විනාඩියක්වත් ගියේ නෑ, කොහේදෝ ඉඳලා මහ සැර හුළඟක් ඇවිත් ඒ වැහි වලාකුළු ඈතට ඇදිලා ගියානේ. ගුරුතුමා මෙහෙම කළේ සිය ගාණක් බලාගෙන ඉන්න අතරේ තමයි. මේක අපි කාටත් අදහාගන්න බැරි දෙයක් වුණා." එම කාන්තාව කීවාය.

ගුරුතුමා නමින් හැඳින්වූ පුද්ගලයා ඒ මොහොතේ දැක්වූ ඒ ප්‍රාතිහාර්යය සම්බන්ධයෙන් ඇය ඊට පසුව ඔහුගෙන් විමසුම් කර ඇත. එවිට ඔහු පවසා තිබුණේ යෝග භාවනා වැඩීමෙන් ඒ විශ්ව ශක්තිය තමන් වෙත ඒකරාශී කරගත් බවයි.

**මං කැමති නම් දවසක් වෙලාවක් දාගෙන හංවැල්ල කිට්ටුව තියෙන තැනකට ඇවිත් එයාව පෞද්ගලිකව හම්බුවෙන්න කියලා ගුරුතුමා කිව්වා. ඒ එක්කම ඒ ගමන ගැන කාටවත් කියන්න ඕනේ නෑ කියලත් කිව්වා**

"අපේ හුඟදෙනෙක් දන්නේ නැති වුණාට බෞද්ධයන්ට වැඩිපුරම ගැළපෙන්නේ යෝග භාවනාව කියලා බුදු හාමුදුරුවෝ දේශනා කරලා තියෙනවාලු. අර 'යෝගා වේ ජායතී භූරි' කියන ගාථාවෙන් බුදුහාමුදුරුවෝ ඒ බව කෙළින්ම විස්තර කරලා තියෙනවලු." එම කාන්තාව එසේ පවසත්ම මම එක්වරම තිගැස්සුණෙමි.

"ඊළඟට මොනවද ඒ මනුස්සයා කිව්වේ?" අනතුරුව ඒ තිගැස්සුම්සහගත බව ඇගෙන් වසන්කර මා ඇගෙන් ඇසුවේ එම පුවතේ ඉතිරි කොටස දැනගැනීමට ඇති නොඉවසිලිමත් බව අනුවය.

"ඔය යෝග භාවනා හැමෝටම හරි යන්නේ නෑ. ඒවා වඩන්න සසරේ රැස් කරපු කුසල් තියෙන්න ඕනෙලු කියපු ගුරුතුමා මම නම් ඒ විදියට සසරේ කුසල් රැස් කරපු කෙනෙක් බව විශ්ව ශක්තියෙන් එයාට පේනවා කියලත් කිව්වා. ඒ වගේම ඔය යෝග භාවනා කියන දේවල් පන්ති දලා උගන්වන්න බෑ කියලත් කිව්වා. ඒත් මං කැමති නම් දවසක් වෙලාවක් දගෙන හංවැල්ල කිට්ටුව තියෙන තැනකට ඇවිත් එයාව පෞද්ගලිකව හම්බුවෙන්න කියලා ගුරුතුමා කිව්වා. ඒ එක්කම ඒ ගමන ගැන කාටවත් කියන්න ඕනේ නෑ කියලත් කිව්වා." එම කාන්තාව කීවාය.

"යෝගාවේ ජායතී භූරී කියන්නේ ධම්මපද ගාථාවක්. ඒකෙන් කියන්නේ යෝග වැඩීමෙන් ප්‍රඥව උපදවනවා කියන එක නම් තමයි. නමුත් ඔතන බුදුහාමුදුරුවෝ යෝග කියලා හඳුන්වලා තියෙන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ලෝක ස්වභාවය නුවණැසින් දැකීම (විදස්සනාව) මිසක් ඔය කියන කායික ව්‍යායාම නම් නෙවෙයි" මම කීවෙමි. "එහෙනම් ඒ ගුරුතුමා ඇඟිල්ල අහසට දික්කරගෙන හිටියට පස්සේ එන්න ආපු වැස්ස නතර වුණේ කොහොමද?" ඒ සමඟම ඇය ඇසුවාය.

"වැස්ස නතර වුණේ ඒ මනුස්සයා අහසට ඇඟිල්ල දික්කරපු නිසා නෙවෙයි. ඒ එක්කම ආපු හුළඟ හින්ද." මම පිළිතුරු දුනිමි.



අංජලී බුදවත්ත ජයවර්ධන
මනෝඋපදේශිකා/ මාධ්‍යවේදිනී



# නෝටි ෆෝටි කිට්ටු වෙද්දී ගැහැනු හැඩවෙන්නේ ඇයි?

අද කතා කරන්න යන මාතෘකාව ගැන ලියන්න හිතුණෙම දවස් කීපයකට කලින් මාව මුණගැහෙන්න ආපු කාන්තාවක් නිසයි. ඇයට මම නිර්මලා කියන්නම්. නිර්මලා අවුරුදු 42ක දෙදරු මවක්.

විවාහයෙන් කාලයක් යද්දී නිර්මලාගේ ලිංගික ජීවිතය තරමක් උදාසීන වුණාලු.

ඈ කිව්ව විදියට ඇගේ සැමියත් ලිංගිකත්වයට ඒ තරම් නැඹුරු අයෙක් නෙමෙයි. නිර්මලාට වුණත් අවශ්‍යතාවයක් නොදැනුණු තරම්ලු. සැමියගේ අවශ්‍යතාවය මත දෙන්නා ඉඳහිටලා ලිංගිකව එකතු වෙලා තියෙනවා.

හැබැයි මෑතක ඉඳලා නිර්මලාට බොහොම තදින් මේ අවශ්‍යතාවය දැනෙන්න අරන්. ඇය මේ ගැන සැමියා එක්ක කතා කරලත් නැහැ. ඉතින් සැමියා වෙනදා වගේ ඔහුගේ අවශ්‍යතාවය තෘප්තිමත් කරගත්තා මිසක ඇගේ අවශ්‍යතාවය ගැන බලලා නැහැ.

සැමියගෙන් ඇය බලාපොරොත්තු වෙන ලිංගික තෘප්තිය නොලැබෙන තැනදී නිර්මලා ෆේස්බුක් එකෙන් මුණගැහුනු පුද්ගලයෙක් එක්කලා දින කිහිපයක් මැසේජ් කරලා. ඔහොම යද්දී ඇය කරන්නේ වරදක් බව ඇයටම හිතිලා. පස්සේ නිර්මලා ඇගේ මිතුරියකට මේ කාරණාව කියලා තියෙනවා. නිර්මලාව මගේ ළඟට යොමු කරලා තිබුණේ ඇය. වෙලාවේ හැටියට මිතුරිය ඇයව යොමු කරලා තිබුණේ හරිම තැනට. නිර්මලා මුලදීම උපදේශනයට යොමු නොවුණා නම් ඇයට නතර වෙන්න වෙන්නේ සංකීර්ණ ප්‍රශ්න ගොන්නක.

නිර්ලාට වෙච්ච සංසිද්ධිය ගැන මම මෙහෙම පැහැදිලි කරන්නම්කෝ.

ගෑනු ළමයෙක් වැඩිවිය පැමිණිච්චි හැටියේ ඇඟපත හැඩවෙලා මූණට අමුතුම දිස්නයක් එනවා. කාන්තාවකට පිරිමියෙක් ආකර්ෂණය වෙන්නේ එතකොට. ඕක ප්‍රජාව බෝ කරන්න ස්වභාවධර්මයෙන් දුන උප්පරවැට්ටියක්. මේවා විද්‍යාත්මක කාරණා.

හෝර්මෝන ක්‍රියාකාරිත්වය එක්ක යෞවන කාලෙදී වැඩිපුර ලිංගික හැඟීම් දැනෙනවා. හැබැයි 25-35 වගේ කාලෙදී කාන්තාවකට සාපේක්ෂව ලිංගික අවශ්‍යතා දැනෙනවා අඩුයි. එහෙම ඉඳලා ආයේ 35 පැන්න හැටියේ ඔන්න ආයෙත් ගෑනුන්ගේ මූණු කට කළඑළි වැටෙන්න ගන්නවා. ඒ මොකද දන්නවද?

හතළිස් ගණන්වල මැදදී කාන්තාවන්ට ඔසප්වීම නතර වෙනවා. අර අපි ආර්ථවහරණය වෙනවා කියන්නේ. සොබාදහම කාන්තා ඇඟ නිර්මාණය කරලා තියෙන්නේ පුළුවන් තරම් වර්ගයා බෝ කරන්න. හතළිස් ගණන්වලදී ප්‍රජනන පද්ධතියේ ක්‍රියාකාරිත්වය නතර වෙනවා කියලා අපේ ඇඟ දන්නවා. ඔපස් නතර වෙන්න කලින් අවසාන වතාවට පිළිසිඳගැනීමකට යන්න අපේ ශරීරය මාර උත්සාහයක් ගන්නවා.

ඔය සංසිද්ධියත් එක්කලා 35 පැනලා 40 ළංවෙද්දී කාන්තාවන්ගේ ඇගේ ඊස්ට්‍රජන් ඒ කියන්නේ ගෑනු හෝර්මෝනය වැඩිවෙනවා. එතකොට ආයෙත් අර නව යෞවන කාලෙදී වගේ ගෑනුන්ගේ හම දිලිසෙන්න ලස්සන වෙන්න පටන්ගන්නවා. ලිංගික අවශ්‍යතා වැඩිපුර දැනෙන්න ගන්නවා.

කොච්චර කෑවත් බඩ පිරෙන්නේ නැහැ වගේ කොච්චර ලිංගිකව එකතු වුණත් ආශාව අඩු නොවෙන්න පුළුවන්. ලිංගික උද්දීපනය එක්ක ඔය වයසේ කාන්තාවෝ වෙනදට වඩා රූපය ගැන වුණත් හිතන්න ගන්නවා.

අර අපි කතාවට නෝටි ෆෝටි කියන්නේ මෙන්න මේකට. නෝටි කිව්වට මේකේ කිසිම නෝටි දෙයක් නැහැ. මේක කාන්තාවක් පිරිමියෙක් තේරුම් බේරුම් ඇතිව විඳින්න ඕන ලස්සන කාලයක්.

මේ කාලෙට ශාරීරිකව, මානසිකව මෙහෙම වෙනස්කමක් ඇතිවෙනවා කියලා කාන්තාවන් දැනුවත් වෙන්න ඕනේ. සත්තුන්ට ඒ අයගේ ලිංගික කාරණා පාලනය කරන්න බැහැ. හැබැයි අපි හිතන්න පුළුවන් මනසක් තියෙන මිනිස්සු. ඉතින් ලිංගිකත්වය නිසා අනවශ්‍ය කරදරවල නොවැටී ඉන්න කාන්තාවක් බුද්ධිමත් වෙන්න ඕනේ.

ඊගාවට සැමියගේ වගකීම. ආසියානු රටවල බහුතරයක් සැමියන් තමන්ගේ වැඩේ කරගෙන අනිත් පැත්ත හැරිලා නිදගන්නවා. හරියට නිකන් තමන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කරගන්න විතරක් කසාද බැඳලා වගේ. ගොඩක් කාන්තාවන් ලැජ්ජාවට මේ කාරණා ගැන කතා කරන්නෙ නැහැ. ලිංගික අවශ්‍යතා දැනෙන්නේ පිරිමින්ට විතරක් නෙමෙයි. විවාහයක් ඇතුළේ මේ කාරණාව සම්බන්ධයෙන් දෙන්නටම සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනේ. අර කිව්වා වගේ හතළිස් ගණන්වලදී බිරිඳගේ අවශ්‍යතාවය වැඩිවෙන්න පුළුවන් කියන එක පිරිමියත් දැනගන්න ඕනේ. ඒ කාලෙටත් අනිත් පැත්ත හැරිලා නිදාගන්න ගියොත් නැති ප්‍රශ්න වුණත් ඇති වෙන්න බැරි නැහැ.

ආර්ථවහරණයෙන් පස්සේ කාන්තාවකගේ ලිංගික හැඟීම් නැතිවෙනවා. ඉතින් ඒ හැඟීම් නැතිවෙන්න කලින් දෙන්නත් එක්කලා ඒ කාලය විඳින්න. ඔය කාලෙට එන ලිංගික හැඟීම් යටපත් කරන්න එපා. එතකොට කාන්තාවට පසුකාලීනව පසුතැවීමක් ඇති වෙන්න පුළුවන්. ඒත් ඉතින් නෝටි ෆෝටි පැන්නට පස්සේ දුක්වෙලා වැඩක් නෑ. තවත් දරුවෝ අනවශ්‍ය නම් උපත් පාලන ක්‍රමයක් පාවිච්චි කරන්න. මැදිවියේ වුණත් අම්මා කෙනෙක් වෙන්න යහපත් සෞඛ්‍ය තත්ත්වයක ඉන්නවා නම් වෛද්‍යවරයෙක් එක්ක කතා කරලා ඒ ගැන හිතන්න පුළුවන්.

විවාහ නොවුණු කාන්තාවක් විවාහ වුණේ නෑ කියලා නැහැ ඇයටත් හැඟීම් දැනීම් ඇති වෙනවනේ. හතළිස් ගණන්වලදී මේ ලිංගික සන්තර්පණය ලැබෙන්නේ නැතිකොට කාන්තාවට අධික ලෙස තරහා යන්න පුළුවන්. මානසික අවපීඩනය, කාංසාව වගේ ගැටලු වුණත් ඇතිවෙන්න පුළුවන්. සන්තර්පණයෙන් තොරව ඔය කාලය ගෙවුණොත් ඒ කාන්තාවගේ ජීවිත කාලෙම වුණත් ඒ තැවීම දැනෙන්න බැරි නැහැ. පස්සේ කාලෙක ඒක හරියට ඇරියස් එකක් වගේ සමාජයේ අනිත් අය හරහා පිටවෙන්නත් පුළුවන්. විවාහ නොවුණු අය ලිංගිකව එකතු වෙනවා කියන එක තාම අපේ සමාජයට මැජික් එකක්. හැබැයි මේ කාරණා බොහොම විද්‍යාත්මක, ස්වභාවික කාරණා කියන එකයි අවසාන වශයෙන් කියන්න ඕනේ.



**මේ කාලෙට ශාරීරිකව, මානසිකව මෙහෙම වෙනස්කමක් ඇතිවෙනවා කියලා කාන්තාවන් දැනුවත් වෙන්න ඕනේ. සත්තුන්ට ඒ අයගේ ලිංගික කාරණා පාලනය කරන්න බැහැ. හැබැයි අපි හිතන්න පුළුවන් මනසක් තියෙන මිනිස්සු. ඉතින් ලිංගිකත්වය නිසා අනවශ්‍ය කරදරවල නොවැටී ඉන්න කාන්තාවක් බුද්ධිමත් වෙන්න ඕනේ**

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# කවදාහරි පශු වෛද්‍යවරියක් වෙන්න තමයි මට ඕනේ

## පෙමිණී අසංශා ජයලත්



ජෝර්ජ් ස්ටුවර්ට් සමාගම් සමූහය කියන්නේ 'ධරණී' අයත් පවුලේ සහෝදර සමාගමක්. ඉතින් මෙදා වෙසක් එකට ජෝර්ජ් ස්ටුවර්ට් එකෙන් බොහොම අපූරු බැති ගී ප්‍රසංගයක් එක්ක රසවත් බත් දන්සැලක් පවත්වනවය කියන ආරංචිය අපිටත් ආවා.

ඒ නිසා අපිත් සුදු පාටින් සැරසිලා මැයි 6 වැනිදා හවස 7ට විතර ගල්කිස්සේ පිහිටි ජෝර්ජ් ස්ටුවර්ට් සමාගම් සමූහයට අයත් ආයතනයකට ගියා. කිව්වත් වගේම එදා ජෝර්ජ් ස්ටුවර්ට් ආයතනය වෙසක් සිරි අසිරියෙන් බැබලුණා. ඒ සිරිය මැද වෙසක් බැති ගී කණ්ඩායම් කිහිපයක්ම බොහොම අපූරු තාලෙට බැති ගී ගායනා කළා.

ඔය අතරේ පවුලක් එක්කාසුවෙලා ගායනා කළ බැති ගීතෙකට වැඩිපුර අපේ ඇහැ, කණ යොමුවුණා. අපේ විතරක් නෙමෙයි එතැන හිටපු අයගෙන් ඒ අයට කොච්චර හොඳ ප්‍රතිචාරයක් ලැබුණාද කිව්වොත් එක බැති ගීයක් ගායනා කරන්න වේදිකාගත වුණු ඒ උදවියට පිරිසගේ ඉල්ලීම මත බැති ගීත කිහිපයක්ම ගායනා කරන්නත් වුණා.

මේ විදියට ලස්සනට බැති ගීත ගායනා කරලා තියෙන්නේ ජෝර්ජ් ස්ටුවර්ට් ආයතනයේ ගිණුම් අංශයේ කාර්යාල සහායකවරයෙක් විදියට සේවය කරන සුජීව ජයලත් මහත්මයාගේ පවුලේ උදවිය. මේ කණ්ඩායමේ බොහොම හුරුබුහුටි සුන්දර තරුණියක් හිටියා. ඇගේ රුව වගේම හඬත් පැමිණ සිටිය බොහෝදෙනාගේ ආකර්ෂණයට ලක්වුණා. ඇය සුජීව ජයලත් මහතාගේ දියණිය පෙමිණී අසංශා ජයලත්. බැති ගී අවසානයේදි අපි පෙමිණීත් එක්ක ටිකක් කතා කළා. පෙමිණීගේ හුරුබුහුටි චාම් රුව 'ධරණී' කවරයකට සුදුසුයි කියලා හිතුණු නිසා අපි අද 'ධරණී' කවරය සරසන්නත් ඇයට ආරාධනා කළා.

**පෙමිණී, ගෙදර කවුරු කවුරුද අද භක්ති ගීත කියන්න ඇවිත් තියෙන්නේ?**

"අපේ ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, මමයි, අක්කයි, අයියයි, අයියා විවාහ වෙලා ඉන්න අක්කයි. ඒ අතරෙන් අයියා ඇර අනිත් සේරම අපේ භක්ති ගීත කණ්ඩායමේ ඉන්නවා."

මේ පිරිස බොහොම හුරුපුරුදු තාලෙට බැති ගී කියාපු නිසා පවුලේ උදවිය මීට කලිනුත් භක්ති ගීත කියලා තියෙනවාද කියලත් අපි ඇගෙන් ඇහුවා.

**"මගේ නැනා යෙෂානි වින්ද්‍යා. එයාට ගොඩාක් ලස්සනට සිංදු කියන්න පුළුවන්. 2021දි පළාත් සභාවෙන් පැවැත්තුව භක්ති ගීත තරඟයකට පවුලේ අපි හැමෝම ඉදිරිපත් වුණා. තරඟෙන් දෙවැනි ස්ථානය දිනන්නත් අපිට පුළුවන් වුණා. ඒ තරඟයේ වීඩියෝ එකක් තාත්තා එයාගේ ආයතනයේ චමිල් ඉන්ද්‍රජිත් මහත්මයට පෙන්නලා තිබුණා. ඒක දැකලා තමයි මේ බැති ගී ප්‍රසංගයට ගායනා කරන්න අපිට එන්න කියලා කිව්වේ. අපි අද පුරුදු වෙලා ආවේ එක බැති ගීයයි. ඒක කිව්වට පස්සේ තව ගායනා කරන්න කියලා ඉල්ලීම් ආවා. පස්සේ එවෙලේම පුරුදු වෙලා තවත් බැති ගීත දෙකක් ගායනා කළා."**

බැති ගීතවලට කට්ටියගෙන් ලැබුණු ප්‍රතිචාර කොහොමද කියලා අපි පෙමිණීගෙන් අහන්න ගියේ නැත්තේ අපිම ඒ ප්‍රතිචාර දැකපු නිසයි.

**අපි පුරුදු වෙලා ආවේ එක බැති ගීයයි. ඒක කිව්වට පස්සේ තව ගායනා කරන්න කියලා ඉල්ලීම් ආවා. පස්සේ එවෙලේම පුරුදු වෙලා තවත් බැති ගීත දෙකක් ගායනා කළා**

බැති ගීත කතාවෙන් පස්සේ අපි ඇගේ පෞද්ගලික විස්තර ටිකකුත් ඇහුවා.

"අපේ ගෙවල් කෝට්ටේ. මට අවුරුදු 16යි. කෝට්ටේ ආනන්ද බාලිකා පාසලේ ශිෂ්‍යාවක්. මම මේ පාර සාමාන්‍ය පෙළ විභාගයට ලියන්නයි ඉන්නේ."

ඇය බාහිර විෂයන් විදියට නර්තනය සහ නාට්‍ය ඉගෙන ගන්නවලු. ඊට අමතරව පෙමිණි ජනප්‍රිය ගීත රූප රචනාවල ළමා චරිත කිහිපයක් රඟපාලා තියෙන බවත් ඇය කිව්වා.

"මම සත්තුන්ට හරිම ආදරෙයි. අපේ ගෙදර බල්ලෝ දෙන්නෙකුයි, පූසෝ දෙන්නෙකුයි, ගිරවෙකුයි ඉන්නවා. පාරේ ඉන්න අසරණ සත්තුන්ට කන්න බොන්න දීලා ප්‍රතිකාර කරනවා. ඉතින් සත්තුන්ට තියෙන ආදරේ නිසාම කවදාහරි පශු වෛද්‍යවරියක් වෙන්න තමයි මට ඕනේ. සාමාන්‍ය පෙළින් පස්සේ විද්‍යා විෂයන් තෝරගෙන කොහොම හරි ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරගන්නවා."

මනුස්සයෙක් වුණාම මිනිස්සුන්ට සත්තුන්ට ඔය හැමෝටම කරුණාවෙන් සලකන්න කියලලු පෙමිණිට ඇගේ තාත්තා උගන්වලා තියෙන්නේ.

**"මනුස්සෙක්ට තියෙන වටිනම ආභරණය කරුණාවන්තකම කියලයි තාත්තා කියන්නේ. කන්න බොන්න නැති කෙනෙක් දැක්කහම කන්න ටිකක් අරන් දෙන්න පැකිළෙන්න හොඳ නැහැ. ඉතින් මම නිතරම මට පුළුවන් විදියට මිනිස්සුන්ට උදව් කරනවා."**

පෙමිණි ඒ විස්තරේ කිව්වේ බොහොම කාරුණික තාලෙට. මේ කාලේ පෙමිණිගේ වයසේ ගෑනු ළමයි ගැන ඇහෙන කතා එච්චර සුබ නැහැනේ. ගෑනු දරුවෙක්ට සමාජය ගැන තේරුම් බේරුම් කරලා සහකම්පනය ඇතිව සමාජයට දයාද කරන එක දෙමාපියන්ගෙ වගකීමක්. දරුවන්ට වරදිනකල් ඇස් පියාන ඉඳලා පස්සේ ඇඟිල්ල දික්කරන දෙමාපියන්ට වඩා ගැහැනු දරුවෙක්ට ලැබෙන්න ඕනේ පෙමිණිගේ අම්මා තාත්තා වගේ ආදර්ශමත් උදවිය කියල අපිට හිතුණා.

**"අම්මායි තාත්තයි නිතරම මට හයියක් වෙනවා. හොඳ නරක කියා දෙනවා. මගේ අයියයි අක්කයි පොඩි කාලේ ඉඳලා ජීවත්වුණේ මට ආදර්ශයක් වෙන විදියට. ඉතින් මට වඩා බාල නංගිලා මල්ලිලාට ආදර්ශයක් වෙන විදියට ජීවත්වෙන්නයි මට ඕනේ. දෙමව්පියෝ අවවාදයක් දුන්නොත් ඒ අය එහෙම කරන්නේ තරහට කියලයි අද කාලේ ගොඩක් අය හිතන්නේ. එහෙම නැහැ. අපිට වරදක් වෙන දෙයක් එයාලා කවදාවත් කියන්නේ නැහැ. ඉතින් මම මගේ වයසේ අනිත් අයටත් කියන්නේ කවදාවත් අම්මා තාත්තට දුකක් දෙන්න එපා. අපිට ආයෙත් මේ කාලය එන්නේ නැහැ. ඉතින් ඉගෙනගන්න පුළුවන් කාලේ හොඳට ඉගෙනගන්න. එතකොට කවදාවත් වරදින්නේ නෑ."**

අවුරුදු 16 පෙමිණි ඇගේ වයසේ අනිත් දරුවන්ට දුන්නු පණිවිඩය ඒක. ඊගාව අවුරුද්දේත් පෙමිණිගේ පවුලේ බැති ගීත නරඹන්න එන පොරොන්දුව දීලා ඇයට සුබ පතලා අපි ජෝර්ජ් ස්ටුවර්ට් ආයතනය සංවිධානය කරපු දන්සැල පැත්තට ගියා.

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**
**ඡායාරූප - ප්‍රදීප් දඹරගේ**






අපේ පුංචි දූලා පුතාලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න




අත්පොත් තබන පෙරපාසල් නංගිලා මල්ලිලාට

අකුරු කරන්නට අලුතින්ම පාසලට පිය නැගූ පුංචි නංගිලා මල්ලිලාට

ශිෂ්‍යත්වය ඉලක්ක කර සැකසූ පාඩම් සහ ප්‍රශ්න පත්‍ර සමඟින්

මාසික අධ්‍යාපනික පුවත්පත් 6ක්

මැයි කලාපයන් දැන් වෙළෙඳපොළේ

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348

දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක

**මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි**

# හස්බන්ඩ්ගේ මූණත් නැන්දම්මගේ මූණ වගේ නිසා ලේලිට වහ කන්න හිතිලා



'එමා බෝවාරි' කියලා ප්‍රංශ නවකතාවක් තියෙනවා. ඔය කතාවේ අම්මෙකුයි, තාත්තෙකුයි, පුතෙකුයි ඉන්නවා. පුතාගෙ නම චාල්ස්. චාල්ස්ගෙ තාත්තා කිසිම වගකීමක් කරට නොගෙන නිකමෙක් වගේ ඉන්න මිනිහෙක්.

හැබැයි චාල්ස්ගෙ අම්මා උත්සාහවන්ත ගෑනියෙක්. ඇගේ ලොකුම බලාපොරොත්තුව වුණේ මොන ප්‍රශ්නේ තිබුණත් චාල්ස්ව දොස්තර මහත්තයෙක් කරන එක. අන්තිමේදි ඇය කොහොමහරි ඒක කළා. හැබැයි හැමවෙලාවෙම චාල්ස්ව තමන්ගේ පදේට නටන දරුවෙක් විදියට තියාගන්නත් මේ අම්මා අමතක කළේ නෑ.

හැබැයි දොස්තර කෙනෙක් වුණාය කියලා චාල්ස්ට රට්ටුගෙන් ඒ හැටි පිළිගැනීමක් ලැබුණෙ නෑ. මේකා පොඩි කාලේ ඉඳලම අම්මාට ඕන විදියට හැදුන දියාරු මිනිහෙක් කියලයි හැමෝම චාල්ස්ට කිව්වේ. අන්තිමට චාල්ස් කසාද බැන්දා. ඒ බැඳගත්තෙත් අම්මා කැමති වුණ ගෑනියෙක්ව.

ඔන්න දැන් තමයි කතාවෙ හොඳම හරිය. පුතා කසාද බැන්දා කියලා අම්මා පුතාව ගෑනිට දීලා අත පිහිදාගන්න කැමති වුණේ නෑ. කලින් වගේම චාල්ස්ව පාලනය කළා. ඒ විතරක් නෙමෙයි මේ බිරිඳ චාල්ස්ට තේ එකක් හැදුවත් මගෙ කොල්ලාගෙ පදම දන්නෙ මම කියලා ප්‍රශ්න ඇති කරගත්තා. ඒ විතරක්යෑ මේ උන්දෑ කවදාවත් පුතාටයි ලේලිටයි රෑට සැනසීමෙන් නිදාගන්න දුන්නෙ නැහැ. හැමදාම බොරු අසනීපයක් මවාගෙන චාල්ස්ව උන්දැගේ ඇඳ අයිනෙන් නිදි කරවාගත්තා. මම දුක් විඳලා උගන්නපු කොල්ලාගෙ පඩියෙන් වෙන එකියෙකුට සැප දෙන්නෙ මොකටද කියලා පුතා හරිහම්බ කරන දේවලුත් මේ උන්දැගේ අතට ගත්තා.

ඒ ප්‍රශ්න නිසා චාල්ස්ගෙ බිරිඳ දැඩි මානසික පීඩනයකට ලක්වුණා. අවසානේ චාල්ස්ගේ බිරිඳ දිවි නහගන්න පවා උත්සාහ කළා.

'එමා බෝවාරි' නවකතාව නැන්දම්මා ලේලි ගැටුම ගැන ලොකු සමාජ කථිකාවක් ඇතිකරාපු පොතක්. පොත ගැන ටිකක් මතක් කළේ නැන්දම්මා ලේලි ගැටුම නිසා දිවිනහගන්න හදපු කාන්තාවන් කීපදෙනෙක්ගේ ඇත්තම කතා කිහිපයකට පූර්විකාව ගන්නයි.

හිඟන්නගේ තුවාලේ වගේ කවදාවත් විසඳුමක් නොලැබෙන නැන්දම්මා ලේලි හබය ගැන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා කිව්වේ මෙහෙම කතාවක්.

එදා මෙදා තුර ඔය ප්‍රශ්නේ අඩු වැඩි වශයෙන් හැම ගෙදරකම තියෙනවා. හැබැයි ඒකට අපිට සීයට සීයක් නැන්දම්මලාට විතරක්ම දොස් කියන්නත් බෑ. ලේලිලාගෙත් වැරදි තියෙන්න පුළුවන්. නමුත් වැඩි බරක් වැටෙන්නෙ නැන්දම්මලාගෙ පැත්තට කියලා මනෝවිද්‍යාත්මකව ඔප්පු කරලා තියෙනවා.

ඒ මෙහෙමයි. මුළු ජීවිත කාලෙන් බාගයක්ම දුක් විඳලා පුතෙක්ව හැදුවට පස්සෙ ගොඩක් අම්මලාට හිතෙන්න ගන්නවා පිට ගෑනියෙක්ට වඩා පුතාගේ අයිතිය තියෙන්නේ මට කියලා. මම දුක් විඳලා හදපු දරුවා හරිහම්බ කරන ඒවාගෙන් පිට ගෑනියෙකුට සැප විඳින්න දෙන්නෙ මොකටද වගේ පටු සිතුවිලි අම්මලාට ඇතිවෙනවලු. එතැනින් පස්සෙ පුතායි ලේලියි මොනවා කළත් රුස්සන්නෙ නැති ගතියක් ඉබේටම ඇතිවෙනවා. සමහරක් නැන්දම්මලා ඔය තත්ත්වය අමාරුවෙන් තේරුම් අරගෙන ඒ සිතුවිලි පාලනය කරගන්නවා. හැබැයි ගොඩක් උදවියට ඒක එහෙම කරන්න බැරිවෙලා තියෙනවා.

ඕකට මම අත්දැකපු හොඳ උදාහරණ කීපයක් කියන්නම්.

මීට මාස කීපයකට උඩදි මමයි මගේ මිත්‍රයෙකුයි රාජකාරි වැඩකට කොළඹ ඇවිත් දෙහිවල පැත්තෙ නවාතැන් ගත්තා.

එදා හවස අපි දෙන්නා පොඩි විවේකයක් ගන්න හිතාගෙන මුහුදු වෙරළ පැත්තට ගියා. ඒ යනකොට එතැන වෙනමම ගාලගෝට්ටියක්. මුහුදට පැනපු කාන්තාවක්ව වටේපිටේ උදවිය බේරගෙන කියලා ටිකක් විපරම් කළහමයි දැනගත්තේ. ටික වෙලාවකින් හැමෝම වටවෙලා ඇයගෙන් මේ ගැන ප්‍රශ්න කළා. නැන්දම්මා දෙන මානසික පීඩනය නිසා ඇයට ජීවිතේ තිත්ත වෙලා කියන එකයි එතකොට ඇය කිව්වේ. පුදුමේ කියන්නෙ ඇය ඒ වෙලාවෙ මුහුදේ පැනලා තියෙන්නෙ ඇගේ අවුරුදු හයක දරුවාවත් වැල්ලෙ වාඩි කරවලා තියලා.

මේකත් ඒ වගේම කතාවක්.

මේ කියන තරුණියව මට මුණගැහුනේ ගම්පහ පැත්තේ පෞද්ගලික ආයතනයක දේශනයකට සහභාගි වුණු වෙලාවක.

ඇය මට කියපු විදියට ඇගේ නැන්දම්මා උදේ ඉඳන් රෑ වෙනකල් මේ ලේලියව මැරෙන්න කියලා හදි හූනියම් කරන තැන්වල යනවලු. නිතරම දේවාලවල ගිහින් දෙහි, මිරිස්, නූල් ගෙනැල්ලා පාපිසි යට, කොට්ට මෙට්ට යට දාලා තියෙනවාලු. සැමියාට කිව්වත් මේකට විසඳුමක් නොලැබුණ නිසා ඇයත් දෙවතාවක් තමන්ගේ සිය දිවි හානිකරගන්න උත්සාහ කරලා.

තවත් කතාවක් මතක් වුණා. මේ කාන්තාව නම් මට දුරකතනයෙන් කතා කරපු කෙනෙක්.

කලින් ඈයොන්ට වගේම නැන්දම්මා මැයටත් කායිකව මානසිකව ඉතාමත් දරුණු විදියට වද දීලා. හැබැයි ඊටත් වඩා ඇයට තිබිලා තියෙන ප්‍රශ්නේ සැමියාගෙයි නැන්දම්මාගෙයි මූණු දෙකම එක වගේ වීම. ඇය මට කියපු විදියට උදේ ඉඳන් රෑ වෙනකන් තමන්ට වදදෙන නැන්දම්මාගෙම මූණ තියෙන සැමියා නිදි ඇඳට ආපු ගමන් ඇයට ඔහු ගැන අප්පිරියාවක් දැනෙනවලු. ඒ නිසා ඇය ඔහු එක්ක අඹු සැමි සම්බන්ධතා පවත්වන එකත් නතර කරලා. ඒ වෙලාවට නැන්දම්මා ඇවිත් තමන්ව අතපත ගානවා වගේ ඇයට දැනෙනවලු. ඔය ප්‍රශ්නේ නිසා ඇයත් වතාවක් වස පානය කරන්න උත්සාහ කරලා.

මම කලින් කිව්වා වගේම දැනුත් කියන්නෙ ඔය ප්‍රශ්නේ දෙපැත්තක් තියෙන්න පුළුවන්. නමුත් මේ ප්‍රශ්නෙට තියෙන එකම විසඳුම තේරුම්ගැනීම විතරමයි.

අපි දරුවො හැදුවට උන්ව දීගතල දුන්නට පස්සෙ උන්ටත් උන්ගෙ පාඩුවෙ ජීවත්වෙන්න දීලා හිත හොඳින් පැත්තකට වෙන්න තරම් වැඩිහිටි අපිට හොඳ බුද්ධියක් තියෙන්නට ඕනෙ. ලංකාවේ ගොඩක් ඉන්නේ අත්හැරීම පුරුදු කළ බෞද්ධයෝ. හැමදාම පන්සල් ගියත් ගොඩක් නැන්දම්මලාට අත්හැරීම පුරුදු නෑ.

ගෑනියෙක් තමන් ඉපදුණු දා ඉඳලා හිටපු පවුල අතඇරලා අලුතින් පවුලකට එන්නෙ ඒ ගෙදර උන් ගැන විශ්වාසේ තියලා. එහෙම ආපු ලේලිට ගෙදර ආව දවසේ ඉඳලා වද දෙනවා නම්, ඒකිගෙ ඇඳුමේ දිග පළලයි, පුතා එක්ක හුරතල් වෙන විදියයි, හොද්දෙ ලුණු නැති එකටයි කුරු ගහහා නැති ප්‍රශ්න ඇතිකරන එකෙන් පිට එකාගේ විතරක් නෙවෙයි තමන්ගෙ එකාගෙත් ජීවිතේ අගාධෙට වැටෙනවා. ඔය කිසිම නැන්දම්මෙකුටවත් තමන්ගේ පුතාව ජීවිත කාලෙම රෙද්දෙ එල්ලගෙන තියාගෙන ඉන්න බෑනේ. ඌව ඉතින් කවදාහරි ගෑනියෙකුට දීලා හිත හදාගන්නම වෙනවා.

කච්චානී ජාතකයේ ඔය අපේ නැන්දම්මලාට ආදර්ශයක් ගන්න පුළුවන් හොඳ නැන්දම්මෙක් ඉන්නවා. ඔය කතාවෙත් අම්මෙකුයි, තාත්තෙකුයි, පුතෙකුයි ඉන්නවා. කලවයස හරි ගිහාම ඔය පුතත් කසාදයක් කරගෙන බිරිඳව ගෙදරට එක්කගෙන ආවා. ඒ ගෙනාවම ඉතින් අර නැන්දම්මා ලේලිටත් දුවෙකුට වගේම ආදරෙන් සලකලා. හැබැයි අර ලේලිට ඕනවෙලා තියෙනවා සැමියාට බොරු කේලම් කියලා නැන්දම්මව ගෙදරින් පන්නගන්න. හිතුව විදියටම ඇය දවසක් සැමියාගෙත් උදව් ඇතුව නැන්දම්මාගෙ සිහි නැති කරලා අරන් ගිහින් සොහොනක ගැටගහලා. ඒත් අර නැන්දම්මා ලේලිට විණ කටින්නවත් පවුල කඩන්නවත්, දිවි නහගන්න තැනට වැඩ සිද්ධ කරන්නවත් ගිහින් නෑ. ඒ වෙනුවට ඇය ලේලියව යහපත් අතට පත් කරන්න කියලා සක්‍ර දෙවියන්ගෙන් ඉල්ලලා. අම්මගේ දුක අහපු සක්‍ර දෙවියෝ ලේලියව යහපත් කාන්තාවක් කරලා. පස්සේ ලේලි සොහොනට ඇවිල්ලා නැන්දම්මව ආපිට ගෙදර එක්කරගෙන ගිහින්.

මම මේ කතා කිව්වෙ ලේලි ගහන්න ආවත් නැන්දම්මලා වැඳගෙන හිටපල්ලා කියන්න නෙවෙයි. අලුතින් දීග ආපු ලේලිලාට වඩා නැන්දම්මලාට ජීවිතේ ගැන අත්දැකීම් වැඩි නිසා බුද්ධිමත්ව කටයුතු කරන්න කියන්නයි.

■ ලිහිණි මධුෂිකා

# අදත් අමෘතය සින්ක් එකට හැලුවාද?



දෙවැනි ලෝක යුද්ධෙදි ලෝකේ පුරා ගොඩක් සෙබළුන් මැරුණා. තුවාල වෙච්ච් සෙබළුන්ගේ ඇඟපත දුර්වල වෙලා විජලනය වුණා. විජලනය වෙන සොල්දාදුවන් ප්‍රමාණය වැඩිවෙද්දි සේලයින් හිඟයක් ඇතිවුණා. මේ ප්‍රශ්නත් එක්ක ගොඩාක් සෙබළු මැරුණා. සේලයින් විදියට සෙබළුන්ට දෙන්න පුළුවන් විකල්පයක් තියෙනවාද කියලා ඔය අතරෙ ඇමරිකානු වෛද්‍යවරු පරීක්ෂණ කළා.

මැග්නීසියම්, කැල්සියම්, සින්ක්, පොටෑසියම් කියන ගුණ සේරම තියෙන නිසා සාමාන්‍ය වතුරවලට වඩා පොල්වතුරේ සජලන ගුණය වැඩියි කියලා දොස්තර මහත්තැන්ලා හොයාගත්තා. පස්සේ විජලනය වෙච්ච් සෙබළුන්ගේ නහරවලට සේලයින් වෙනුවට විද්දේ පිරිසුදු පොල්වතුර. දෙවැනි ලෝක යුද්ධෙදි පොල්වතුර නිසා පණ බේරුණු සෙබළු ගාණ කොච්චරද දන්නවද? 50,000ක්.

පොල්වතුර කියන්නේ ඇඟේ තෙතමනය වැඩි කරන්න පුළුවන් හොඳම බේත. ඕක දැනගත්තු ද ඉඳලා යුරෝපේ මිනිස්සු පොල්වතුර දකින්නේ අමෘතය ගාණට. ලෝකේ වටිනම ස්වභාවික පානය කොකනට් වෝටර් කියලයි සුද්දෙ කියන්නේ. හැබැයි වැඩේ කියන්නේ උන්දැලට පොල් ගස් නෑ. ඉතින් ඇමරිකාවේ පොල්වතුර ලීටරයක් ඩොලර් 10ක් විතර. ඒ කියන්නේ ලංකාවේ සල්ලිවලින් නම් තුන්දහස් ගාණක්. මේ අය ඕසෙට පොල්වතුර විකුණනවා. නිකන් නෙමේ ඇමරිකාවේ පොල්වතුර ඇඩ්වල ඉන්නේ රිහානා, මැඩෝනා වගේ ලෝකෙම දන්න සුපිරි ගායිකාවෝ. 2013දි ඇමරිකාව පොල්වතුරෙන් ඩොලර් මිලියන 395ක ලාබයක් ලබලා අලෙවි වාර්තාවක් පවා තිබ්බා.

ඒරොප්පේ කතාවලින් පස්සේ අපේ අහට එමු. අපේ ගෙවල්වලින් උදේම ඇහෙන්නේ 'ඩෝං' ගාලා පොල් බිඳින සද්දේ. ඊගාවට ඇහෙන්නේ පොල්වතුර ටික සින්ක් එකේ නැත්තම් කාණුව දිගේ පල්ලම් බහින සද්දේ. ලංකාවේ දවසකට පොල්වතුර ලීටර 650,000ක් විතර විසි කරනවා කියලා ගණන් බලලා තියෙනවා. අපේ අය රත්තරං ටිකට තියෙන පොල්වතුර විසි කරන්නේ එච්චයෙන් හමට, ඇඟට තියෙන ප්‍රයෝජන නොදැන වෙන්න ඇති. හැබැයි මේ ලිපිය කියෙව්වට පස්සේ කිසිම බවලතියක් පොල්වතුර අහක දන්න හිතන එකක් නෑ කියලා නම් සහතිකයි.

එංගලන්තේ චර්ම වෛද්‍යවරු පිරිසක් 2010දි පොල්වතුර ගැන පරීක්ෂණයක් කළා, කාන්තාවන් කිහිපදෙනෙක්ට එකදිගට මාස දෙකක් පොල්වතුර බොන්න දීලා. මාස දෙක අවසානෙදි මේ අයගේ සම පැහැපත් වෙලා සමේ තෙතමනය වැඩි වුණාලු. කුරුලෑ සහිත කාන්තාවන්ගේ කුරුලෑ පවා සුවවෙලා.

අර මුලින්ම කිව් පෝෂණ සංඝටකවලට අමතරව පොල්වතුරේ ප්‍රතිඔක්සිකාරක, ජලය, විටමින් C, D, B6 වගේ දේවලුත් තියෙනවා. ප්‍රතිඔක්සිකාරක වැඩි නිසා වැඩිපුර කොලැජන් නිෂ්පාදනය කරන්න පොල්වතුර සමට උදව් දෙනවා. සජලන ගුණ වැඩි නිසා සමේ තෙතමනයත් වැඩි කරනවා. සම තෙත වුණාම වයසට යන එක කොහොමත් පස්සට යනවා.

සමේ තෙල්ගතිය වැඩි අයට පොල්වතුර දිව ඔසුවක්. තෙල් ගතිය පාලනය කරලා කුරුලෑ අඩු කරන්නත් පොල්වතුරට පුළුවන්. අව්වෙන් පිච්චුණු සම හොඳ කරන්නත් පුංචි ලිඳේ වතුර යසයි. රූපලාවණ්‍ය කාරණාවලට අමතරව රුධිර පීඩනය අඩු කරන්න, අක්මා රෝග, ආමාශ රෝග, මුඛ රෝග ඇතිවීම පාලනේ කරන්නත් පොල්වතුර පංකාදුයි.

පොල්වතුර ප්‍රයෝජනේට ගන්න පුළුවන් විදි ගැන දැන් බලමු. මුල්ම දේ ගෙදර බිඳින පොල් ගෙඩියේ වතුර අහකට හලන්න එපා. පුළුවන් නම් එවෙලෙම බොන්න. නැත්තම් අරන් තියලා පස්සේ බොන්න. ඒක සමට වාසියක්.

සමහරු කඩෙන් අරන් ශක්තිජනක පාන වර්ග බොනවනේ. ලෝකේ තියෙන හොඳම ස්වභාවික ශක්තිජනක පානේ පොල්වතුර කියලයි හැබැයි වෛද්‍යවරුනම් කියන්නේ. ඉතින් ශක්තිය ගන්න සීනි දාපු කෘත්‍රිම පාන වර්ග බීලා සම රැලි ගස්සගන්නවට වඩා පොල්වතුර ටිකක් බොන එක නොවෑ හොඳ.

ටෝනර් එකක් විදියටත් පොල්වතුර පාවිච්චි කරන්න හැකි. පොල් බිඳින වෙලාවට පොල්වතුරෙන් මූණ සෝදන්න. පුළුන් කෑල්ලකට පොල් වතුර ටිකක් දාලා ඒකෙන් සම පිහිදාන්න. නැත්තම් බෝතලේකට දාලා සමට ස්ප්‍රේ කරලා සුළඟින් වේලෙන්න අරින්න.

පොල්වතුර, කහ එකට එක්කාසු කරලා ගාන්න. කෘත්‍රිම ආලේපවලින් හානිවෙච්ච් සමට මේ සත්කාරය අපූරුයි. මුල්තානි මිටිටිවලට පොල්වතුර එකතු කරලා ගාන්න. විනාඩි 20ක් තියලා සෝදන්න. මේ සත්කාරයෙන් සම පැහැපත් වෙනවා.

කඩල පිටි, මී කිරි, පොල්වතුරෙන් මිශ්‍ර කරලා ගාන්න. කස්තුරි කහ, වෙනිවැල් කුඩු, පොල් වතුර එකතු කරලා පැක් එකක් වගේ මුණේ ගාන්න. පොල්වතුරට ලෙමන් යුෂ එකතු කරලා ක්ලෙන්සර් එකක් ඒ කියන්නේ පිරිසුදුකාරකයක් විදියට පාවිච්චි කරන්නත් පුළුවන්.

පොල් කියන්නේ අපේ ගෙවල් වලසාමාන්‍යයෙන් පාවිච්චි කරන දෙයක්නේ. ඉතින් පොල්වතුරවලට ආය අමුතුවෙන් සල්ලි යනවා කියලායෑ. අද ඉඳලවත් අහක හලන පොල්වතුරෙන් ප්‍රයෝජනේ ගන්න. ඔය කොයි සුම්හිරි පානවලටත් වඩා වටින මේ සුම්හිරි පානේ ආයේ කවදාවත් විසි කරන්න නම් එපා.

**එංගලන්තේ චර්ම වෛද්‍යවරු පිරිසක් 2010දි මේ ගැන පරීක්ෂණයක් කළා, කාන්තාවන් කිහිපදෙනෙක්ට එකදිගට මාස දෙකක් පොල්වතුර බොන්න දීලා. මාස දෙක අවසානෙදි මේ අයගේ සම හිතාගන්න බැරිතරම් පැහැපත් වුණාලු**


■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

123 කොටස



## වැඩිය මොකුත් කරන්න ඕන නෑ කොහෙට හරි අරන් ගිහින් හොඳට බය කරන්න

තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රැගත් ජීප් රිය ඉගිලුණේ තේනුකගේ හිතේ ඔහු ගැන පැහැදීමක් ඇතිකරමිනි. ඒ නිසාම ඔහු වෙනද මෙන් නොව ජීප්රිය වාහන අතරට එකතුව නොපෙනී යනතුරුම එහි රැඳී සිටියේය.

"අපි වෙලාවක් දාගෙන ගෙදරදිම හම්බවෙමුකෝ... අම්මත් ඉන්නවනෙ එතකොට. ඔයා මං ගැන කියලත් නැති එකේ මේ කලබලේ මං කතා කරන එක හොඳ නෑ... ඔය ළමයා කලබල වෙයි..."

තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා කී කතාව හිතේ උඩම තබාගෙන තේනුක සැනසුම් සිතින් සාප්පුවට ගොඩවුයේ ඒ දවස ඉක්මනට උදකරගන්නට හිත තබා ගනිමිනි.

මේනක වැඩි කාලයක් ඇමති බංගලාවේ රැඳුණේ සෙනුකා නිසාදැයි චතුමිණී නිසාදැයි කියා සෙනෙහෙලතා මැණිකේට හිතාගන්නට නොහැකි වුණාය. මේ දින ටිකේම ඔහු වෙනද සේ එළියට නොගිය බව ඇයට මතකය. ඊටද තෙන්නකෝන් බණ්ඩාර අසනීප වූ ද පටන් ඔහු තුළ වෙනද නොවූ වෙනසක්ද ඇය අවබෝධ කරගෙන සිටියාය.

සෙනුකා සිම්බාව යාළු කරගන්නට හැදුවද ඒ යාළුකමට සිම්බා එතරම් ප්‍රිය නැතුවා සේය. වෙනදටත් වඩා සිම්බා සෙනෙහෙලතා මැණිකේගේ ඇගේ දැවටෙමින් ඈ ඉන්නේ කොතැනද එතැන රැඳී උන්නේය. සෙනුකා මුළුතැන්ගෙයට පැමිණ බලෙන්ම වාගේ සිම්බාව දෑතට මැදිකර ගත්තාය.

"මෙයාට ඔයා නැතුවම බෑ වගේ. මං කොච්චර යාළුකරගන්න හැදුවත් යාළුවෙන්නෙ නැනේ. ආඩම්බරකාරයා..."

දඟලා බිම පෙරළී ඇගේ දෑතේ ග්‍රහණයෙන් මිදුණ සිම්බා කුස්සියේ කෙළවරේ වූ පුටුවකට නැග ඇය දෙස බලා සිටියේ ළඟට ආවොත් පැන දුවන ඉරියව්වකිනි.

"කවුරු වුණත් රිද්දවනවට කැමති නෑ. ළඟට එන්න කැමති නැත්තෙ ඒකයි..."

සියල්ල දෙස නොදැක්කා බලා සිටි සෙනෙහෙලතා මැණිකේ කීවාය.

"ඉතින් මං ඔය ආදරේ කළා මිසක් රිද්දෙව්වද? සත්තුත් වෙලාවකට ළමයි වගේ... අම්මට කියන්න අපේ ලෝචන පුතත් ඔහොමයි. ඔහොමයි කියන්නේ මට වෙලාවකට බයත් හිතෙනවා ලෝචනට තියෙන්නේ ලොකු මල්ලිගෙ විදියද කියලා."

සෙනුකාගේ කටහඬ මදක් බිඳීගියේ ලෝචන මතක්වීමෙනි. ඔවුන්ගේ ඇසුරින් මිදී දින හතකි. වීඩියෝ තාක්ෂණය හරහා ළඟ සිටින්නාසේ කතා කළද දරුවන්ගේ ළඟ නැති අඩුව ඈ සිත ඒ මොහොතේ පෙලුවාය. භාවනා දියණිය නම් භාවනාවක් සේමය. විදෙස් රටක ජීවත් වුවද ඈ තුළ වූයේ බොහෝ නිවුනු ගතිය. ලෝචන තුළ වූයේ ඇට්ටර වැඩය.

"එක ලේ නේ. ඒත් ඔය කාලෙම හදගන්න. ලොකු පුතාට වුණේ අප්පච්චි හුරතල් කළා. වැරැද්දකටවත් ඒ කාලේ මට කතා කරන්න දුන්නෙ නෑ. කොල්ලො උපාසකයො වගේ හදලා වැඩක් නෑ කිව්වා. දැන් ඔය හැදිලා ඉන්නේ. සද්ද නැතුව ඉඳලා කරන වැඩවලින් හේදෙන්නේ අපේ සායම නෙවේ. අප්පච්චිලා පුතාලගෙම සායම..."

සෙනෙහෙලතා මැණිකේ කීවේ ඔසරිපොට කරකවා ඉණ වටේ ඔතා ගනිමිනි.

"මේ දවස්වල නම් හොඳට ඉන්නේ. වැඩිපුර එළියට ගියෙත් නෑ නේද?"

"ඒ ඔයා නිසා..."

"මං නිසාද, වෙන කවුරුත් නිසාද?"

සෙනෙහෙලතා මැණිකේ වහා දියණියගේ මුහුණ දෙස බැලුවාය. සෙනුකාගේ මුහුණේ වූයේ සරදම් සිනාවකි.

"ඇයි ඔයාට එහෙම මොනවහරි දැනුණාද?"

එතෙක් කතා කළාට වඩා හඬ අඩු කරමින් සෙනෙහෙලතා මැණිකේ ඇසුවේ කරමින් සිටි වැඩයද නවතාය.

"ඔයත් මාරයි... ගෙදරමයි ඉන්නේ. එහෙම අමුත්තක් දැනුණෙ නැද්ද..?"

"කොහොම අමුත්තක්ද?"

"ලොකු මල්ලි චතුට කැමැත්තක් තියෙනවා වගේ..."

සෙනෙහෙලතා මැණිකේ කලබල වෙනු වෙනුවට සන්සුන් සිනාවක් පෑවාය. සෙනුකා බිඳ තිබූ පොල් ගෙඩිය ගෙන මේසයේ සවිකර තිබූ හිරමණයෙන් ගාන්නට ගත්තාය. ඒ නිසා සෙනෙහෙලතා මැණිකේගේ සිනාව ඇය දුටුවේ නැත.

"අම්මේ..."

පොල් බෑව හිරමණයේ මැදෙන කර්කශ හඬ අතරින් සෙනුකා බණ්ඩාර තෙන්නකෝන් කතා කළාය.

"කියන්නකෝ..."

"ලොකු මල්ලි කැමති නම් අපි ලොකු මාමට කියලා චතුව එයාට බන්දලා දෙමු. එතකොට ඔය ප්‍රශ්න ඔක්කෝටම උත්තර එනවා."

ඊට උත්තරයක් දෙන්නට සෙනෙහෙලතා මැණිකේ ඉක්මන් වූයේ නැත. ඇය මුලින් ගෙළ හරවා දෙර දෙස බැලුවාය.

"කෝ සුදු මැණිකේ..?"

ඇයට චතුමිණී කොහේදැයි දැනගන්නට උවමනා වූවා සේය.

"මං මෙතෙන්ට එනකොට එයා ගෙදරත් එක්ක කෝල් එකක හිටියේ... අම්මේ... මට හිතෙන්නේ නැන්දම්මයි මාමයි දෙන්නම කැමැත්තෙන් ඉන්නේ මේ පවුලට චතු දෙන්න. ඒකනේ ඉතින් ඔය මෙහාට කරලා තියෙන්නේ..."

"ඔව්... ඒත් මං කිව්වෙ ඔයාට සුදු මැණිකෙ කැමති පොඩි පුතාට. පොඩි පුතා සුදු මැණිකෙට කැමති නෑ. ලොකු පුතා සුදු මැණිකෙට කැමතියි. ඒත් සුදු මැණිකෙ වගේම මල්ලියි නංගියි දෙන්නත් ලොක්කට කැමති නෑ..."

"මිනිස්සුන්ගෙ පෙර වැරදි තියෙනවා. ලොකු මල්ලිගෙ ඔය ගතිගුණ නැතිවෙන්නත් පුළුවන් මෙයා බැන්දෙත්... ඕන නම් ටික කාලයක් මේ දෙන්නව මං එහෙට ගන්නම්. පුළුවන් නම් අම්මා මාමට කතා කරන්න. අනික අම්මේ දැන් ලොකු මල්ලි බඳින වයස. ඔයාලා හැමෝම පොඩි එකාට හොයනවා, ලොකු අමතක කරලා..."

සෙනුකා කීවේ ඇත්තය. දැන් මේනකට විසිනවයත් ඉවරය. බාල සහෝදරයාට මඟුල් ප්‍රස්තා කතා කරන්නට පෙර වැඩිමලා කසාද බැන්දවීම අම්මා අප්පච්චිගේ යුතුකමකි.

"ප්‍රශ්න ගොඩාක් තියෙනවා පුතේ. දැන් ඔයා හරි ඉන්න හින්දෙ මෙහෙමවත් කතා කරනවා. නැත්තම් ඕවා මං කාත් එක්ක කතා කරන්නද?"

සෙනුකා පොල්ගෑම නවතා අම්මා දෙස බැලුවාය. ඇය කියන්නේ ඇත්ත කියා මුල්වරට සෙනුකාට සිතුණි. මෙතුවක් කාලයක් ඇයට අම්මා මේ නිවසේ හුදකලා වී ඇති බවක් හැඟුනේ නැත.

"මං මේ කොලු පැටියව අප්පච්චිට කියලා ගෙන්න ගත්තෙත් ඔන්න ඔය පාලුවට. මං දැන් සිම්බා පුතා එක්ක හරි කතා කරනවා..."

"අම්මට එහෙම කතා කරන්න ඕනි වුණාම මට කෝල් එකක් අරන් හරි කතා කරන්න. අනික ඔයා ලෙඩෙක්. ඔයා සතුටෙන් ඉන්න ඕනි කෙනෙක් අම්මා."

සෙනුකා කීවේ පෙඟුණ හදවතෙනි..

"දැන් නම් එහෙම ප්‍රශ්නයක් නෑ. සිම්බා පුතයි සුදු මැණිකෙයි දෙන්නම ඉන්නවනේ..."

"මෙහෙමයි. මං ලොකු මල්ලි එක්කත් කතා කරන්නම්. අප්පච්චි එක්කත් කතා කරන්නම්. ඕනි නම් චතු එක්කත් කතා කරන්නම්... මේවා දැන්වත් පිළිවෙලක් කරමු අම්මේ. එහෙම නොවුණොත් එන්න එන්නම ලොකු මල්ලි නරකට වැටෙයි..."

දියණිය කියන්නේ ඇත්ත බව සෙනෙහෙලතා මැණිකේ දන්නීය. ඇත්තටම මේනකට කපුවෙක් ලව්වා හරි මඟුලක් කතා කරන්න ඕනෑකම ඇයට තිබුණි. ඒත් ඒ ගැන තෙන්නකෝන් බණ්ඩාර ඇමති හා කතා කරන්නට හැදූ හැමවිටකම ඔහු ඒ ප්‍රශ්නය මගහැර ගියේය. මේනකද එසේය.

"ඔයා ඉස්සෙල්ලා ලොකු මල්ලි එක්ක කතා කරන්න. අපි දන්නෙ නෑනෙ එයාට කවුරුහරි ඉන්නවද කියලා. නොඉන්න නම් විදියක් නෑ. පහුගිය කාලේ වෙච්ච සිද්ධියකට දෙකකටමත් ගෑනු ළමයි සම්බන්ධ වෙලා හිටියෙ..."

සෙනෙහෙලතා මැණිකේ කීවේ දුකෙනි. දරුවන් හා තමන් කොතෙක් දුර දැයි සිතෙද්දී ඒ දුක වැඩියෙන් ඇයට දැනුණි.

"සුදු මැණිකෙ ලොකු පුතා එක්ක එකතුවුණාට මේ කෙල්ල මැරෙන්න හදන්නෙ පොඩි පුතා මත්තෙනෙ. මං දන්නෙ නෑ, මහ පටැලවිල්ලක් පුතේ ඕක."

සෙනුකා පොල් ගා අවසන් කර පරණ පුරුදු ලෙස දෑත් සෝදගෙන ඇඳ සිටි ගවුම දෙපැත්තේ පිස දමාගත්තාය. ඒ දුටු සෙනෙහෙලතා මැණිකේගේ දෙතොලේ පුළුල් සිනාවක් ඇඳුණි.

"ලංකාවෙන් ගිහින් අවුරුදු ගාණක් වුණත් පරණ පුරුදු තවම එහෙම්මයි..."

සෙනෙහෙලතා මැණිකේගේ දෙවුරෙන් ඇල්ලූ සෙනුකා ඒ වත යාන්තමින් සිඹ කුස්සියෙන් පිටව ගියේ ඒ මොහොතේම සහෝදරයා හා කතා කිරීමේ සිතිනි. ලංකාවෙන් යන්නට පෙර මේ අවුල් ලිහා හැමෝගේම හිතට සහනයක් දී යන්නට ඇය සිතා ගත්තේ තේනුකද මතක් වූ නිසාය.

චතුමිණී ඒ වනවිටත් සිටියේ දුරකතන ඇමතුමකය. මේනක තෙන්නකෝන් ඇමති බංගලාව තුළ නොසිටියෙන් හිතේ සැකයට ඇය ගෙළයනට ගියාය. ඔහු එහි තුරුවදුල යට සිමෙන්ති බංකුවේ ඉඳගෙන දුරකතන ඇමතුමක සිටිනු පෙනුණි. සෙනුකා දකිද්දී මේනක චංචලා හා කරමින් සිටි කතාව නැවතුවේය.

"කෙල්ලෙක්ද කතා කළේ, මං එනකොට කට් කළේ..?"

සෙනුකා ඔහුට ළංවුණේ එසේ අසාගෙනය.

"නෑ මේ යාළුවෙක් එක්ක පොඩි බිස්නස් වැඩක් කතා කළා අක්කා. එන්න..."

සෙනුකා ඔහු ආසන්නයෙන් ඉඳගත්තේ බර කතාවකට මුල පුරන්නටයි. මේනක ආයෙත් දුරකතනයට එබුණේ වට්සැප් මැසේජයක් ආ නිසාත් එය ආවේ තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගෙ දුරකතනයෙන් වීම නිසාත්ය. ඔහු සෙනුකාට නොපෙනෙන්නට ඒ පණිවිඩය දිගහළේය. තරුණියකගේ ඡායාරූපයක් සහ අකුරු දෙපේළියක් සැනින් පෙන්නුම් කළේය. ඡායාරූපය හොඳින් පෙනෙද්දී ඔහුට උන්හිටි තැන් අමතක විය. ඇගේ මූණ අමතක නොවී හදවතේ තැනෙක තිබූ නිසා මේ ඇයමයි කියා ඔහුට මතක් වුණේය. ඔහු අප්පච්චි ලියා එවූ අකුරු කියෙව්වේය.

"වැඩිය මොකුත් කරන්න ඕන නෑ. කොහෙට හරි අරන් ගිහින් හොඳට බය කරන්න ඕනි අපි කවුද කියලා කියා දීලා... විස්තර පස්සෙ කියන්නම්."

මේ කතාව මොකක්දැයි මේ මොහොතේම වහා දැනගැන්මේ උවමනාවක් ඔහුට ඇති වුණේය.

ලබන සතියට

# කොස්ස අතට ගත්තොත් මැරුම් කන්න වෙයිද?



සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

පාඩම් අංක 70

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

ගිය සතියේ ස්වයං රැකියා පාඩමෙන් අපි කතා කළේ ඉදල් හදන හැටි. ඒහි දිගුවක් විදියට කොසු හදන හැටි මේ සතියේ කතා කරනවා කියලා පහුගිය සතියේ අපි කිව්වා.

කොස්ස කියන්නෙත් ගෙදරක මූලික අවශ්‍යතාවක්. මොකද ගේක දොරක තියෙන කුණු අහක් කරන්න කොස්සක් නැතිව බෑනේ. ආරක්ෂාවට ඉදල් වගේම කොසු පාවිච්චි කරන බවලතියෝත් ඉන්නවා. ඡන්දේ ඉල්ලන්න උන්දැලා ගෙදරට ආපුවාම කොස්ස අතට ගන්න කියලා 2016 අවුරුද්දේ ඡන්ද කැම්පේන් එකකත් කිව්වා මතකයි.

ඒ කතා කොහොම වෙතත් අපි අද මෙහෙම කොස්ස අතට ගන්නේ ඇමරිකාවේ ලෙවී ඩික්සන් කියන මහත්තයා නිසා. බිරිඳ දෙකට නැවීගෙන ඉලපතකින් ගේදොර අස් කරනවා දැකලා බිරිඳ ගැන සෝතාප වෙලා මිට දපු උස කොස්සක් මුලින්ම හැදුවේ ඔහු.

කොස්ස කිව්වම, කාටත් මුලින්ම මතක් වෙන්නේ උල් තොප්පියක් දාගෙන කොස්සක් උඩ නැගලා යන නහය දිග බටකොළ ආච්චිව. හැරී පෝටර් කතා මාලාව බලපු කෙනෙක්ට නම් හැරීගේ 'නිම්බස් 2000' මායා කොස්සත් මතක් වේවි. මායා කොසු ගැන මුලින්ම ලියැවිලා තියෙන්නේ ක්‍රි.පූ. 931දී ලියැවිච්චි ආගමික පොතකලු. සාවුල් කියන රජතුමා පලස්තීනවරු පරාද කරන්න මායාකාරියකට කියලා නබිතුමාගේ ආත්මය කැඳවන්න උත්සාහ කළාලු. පොතේ තියෙන හැටියට ඒ මායාකාරිටත් මායා කොස්සක් තිබිලා.

මායාකාරියෝ කොසුවලට පදම් කළ මායා ආලේපන ගාලා ඒක උඩ යනවා කියලා ඒ කාලේ මිනිස්සු විශ්වාස කළාලු. ඇත්තටම මායාකාරියෝ ඉන්නවා කියලා හිතපු මිනිස්සු වර්ෂ 1500 ගණන්වලදී කාන්තාවන් 80,000ක් මරලා තියෙනවා. ඉතින් ඔය කාලේ ගෙවල්වල ගෑනු කොස්සක් අතින් අල්ලන්නත් බයයිලු.

"කොස්ස අතින් ගෙන අතුගාන්නට ඔබ ඉගෙනගත යුතුය. සුළං පාරක් විත් දූවිලි ඉවතට ගසාගෙන යාවි යැයි සිතීම නිශ්ඵලය."

මෙහෙම කියලා තියෙන්නේ මාවෝ සේතුං. පිටින් බැලුවහම ගේ අතුගාන එක ගැන කියනවා වගේ තේරුණාට ජීවිතේ ජයගන්න නම් උත්සාහය, කැපවීම තියෙන්න ඕනේය, කිසිම දෙයක් ඉබේට වෙන්නේ නැහැයි කියලයි සේතුං මහත්තයා ඒ කතාවෙන් කියලා තියෙන්නේ.

මේක කාටත් ආර්ථික වශයෙන් අමාරු කාලයක්නේ. ඉතින් ඒ අමාරුකම් ගැන සෝතාපන්න වුණාය කියලා ඉබේටම ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ඒ නිසා පුංචිවට ස්වයං රැකියාවක් පටන් අරන් ටිකෙන් ටික සාර්ථක වෙන්න කියන එකයි අපිත් හැමදාම ඔයාලට කියන්නේ.

හරි කතා නවත්තලා දැන් අපි කොසු හදන වැඩේට බහිමු.













මේ කලමණා ටික සපයාගන්න. කොහු 250g, ලී මිටක්, රවුම් ප්ලාස්ටික් කප් එකක්, දිගටි ප්ලාස්ටික් කප් එකක්, මේ ප්ලාස්ටික් කප් කොසු හදන අමුද්‍රව්‍ය තියෙන කඩේකින් ගන්න පුළුවන්. සැමන් ටින් එකක් නැත්නම් තහඩුවක් කපලත් මේ රවුම් හදාගන්න පුළුවන්. ඊට අමතරව අඟල් 1 ඇණ ටිකක්, අඟල් 1 1/4 ඇණ, මිටියක්, ලී කොටයක් අවශ්‍යයි.

මුලින්ම කොහු 250g අරගෙන එක මිටට ගැටගහන්න. ඒකට ලොකු කප් එක ඇතුල් කරන්න. කප් එක දැම්මහම හිරවෙන තරමට කොහු තියෙන්න ඕනේ. කප් එකට කොහු ටික දාලා අහක්වෙලා කොහු ටික දෙපැත්තට විහිදුවන්න.

අරගත්තු ලී මිට අගිස්සෙන් උල් කරන්න. දැන් කොහු දාගත්තු කප් එක මැදින් ලී මිට රිංගවන්න. මිට බිමට ගහන ගමන් මිටේ උල ඇතුළට තද කරන්න.

ලීයයි, කොහුයි අහුවෙන විදියට අඟලේ ඇණ කප් එක උඩිනුයි යටිනුයි ගහන්න. මේ විදියට අඟලේ ඇණ තුනක්වත් ගහගන්න ඕනේ.

ඊගාවට කොහු හොඳට දෙපැත්තට විහිදෙන විදියට කප් එකත් එක්කම මිටියෙන් තලන්න. පස්සේ දිග රවුම බස්සන්න. දිග රවුමේ යටට වදින විදියට අඟල් 1 1/4 ඇණ ගහන්න. ඇණ ගහද්දි ටිකක් ඇලවෙන්න ගහන්න. නැත්නම් යට කොටස අහු නොවෙන්න පුළුවන්. එක පැත්තකින් ගැහැව්ව ඇණ ඊගාව පැත්තෙන් නවාගන්න. රූපයේ පේනවා වගේ බ්ලොක් එකක් අරගෙන කොස්සේ කොහු ටික එක මට්ටමට කපාගන්න. මිට ගාව තියෙන කොහු එහෙමත් පිළිවෙලට කපලා හොඳ නිමාවක් ගන්න.

මෙහෙම හදාගත්තු කොස්සක් රුපියල් 300 ඉඳලා මිල කරන්න පුළුවන්. මේ ගැන තවත් විස්තර දැනගන්න 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

## ආදරය නිසා කදුළු සැලූ මට පිහිටවූ එකම තැන...

- පවුලේ ඇති වන සියලුම ගැටලුවලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා / පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- **රට රැකියා ප්‍රමාද වීම් වලට**
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට
- රැකියා ලබා ගැනීමට

(අදම අමතන්න)
ක්ෂණික ඇමතුම්
0777 444 908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම -සෙනසුරාදා-ඉරිදා
උදේ 8.00 සවස -3.00 දක්වා

ගමන් මාර්ගය - නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොල කුලියාපිටිය බසයක නැඟ හොරොම්බාව හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

Caretaker
"Guru Deva shanthi Services"
Post Code No 60181
Gurugalagoda, Molawatta,
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව
තැ.ස.අංකය 60181
ගුරුගල්ගොඩ, මෝලවත්ත
හොරොම්බාව



## ධරණී
## ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451



කිරිබත්ගොඩට නුදුරු ළමා නිවාසයකට සේවිකාවක් අවශ්‍යයි. දරුවන්ට ආදරයෙන් සැලකිය හැකි, පවුල් බරින් තොර වයස 40-60 ත් අතර ක්‍රියාශීලීව වැඩ කළ හැකි තමන්ගේ ගෙදර ලෙස සිටිය හැකි කාන්තාවක් අවශ්‍යයි.
විමසීම්: 077-8732773 / 077-6348005 / 011-2977437



ධරණී
පුවත්පත නිවසටම ගෙන්වාගන්න අමතන්න
076 1367 623



ලීසිං ඇති / නැති ඕනෑම වාහනයක් අත්පිට මුදලට මිලට ගනු ලැබේ.
කාර්, වෑන්, ජීප්, බයික්.
077 - 3 797 481



ගණිතය දුර්වල සිසුන් ලකුණු ලබන පන්තිය

## ගණිතය
6/7/8/9/10/11 ශ්‍රේණි සඳහා

O/L අසමත් හා නැවත කරන සිසුන්ට

Online පන්ති ද පවත්වනු ලැබේ.
ගම්පහ, කොළඹ නගරවල නිවසට පැමිණ දේශණ පැවැත්වේ.



හංසි ජයමාන්න
B.Com (University of Sri Jayawardanapura)
Dip in Teaching (Maths)

තේනුද - බණ්ඩාරවත්ත - ගම්පහ
Power Computer - රද්දොළුගම
TK INSTITUTE - සිරි කුරුස පාර - ගම්පහ

075 67 94 230



දැන්වීම් සඳහා අමතන්න
0112672 601
0112 672 603



A/L Physics & Chemistry
(Local/Edexcel/Cambridge)
Individual & Group Class

Online ක්‍රමයට. (දිවයින පුරා).
A සාමාර්ථයකට කෙටි ක්‍රම දෙමි.
කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා උපාධිධාරිණියකි.
(නුවන්ති ජයෝද මිස්).
සිසුාගාමී පුනරීක්ෂණ.
072 - 262 17 83




# සැමියා නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

## පවුලේ ඇති ගැටළුවට විසඳුම්

- ❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
- ❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
- ❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
- ❖ රැකියා ලබා ගැනීමට
- ❖ ව්‍යාපාර කඩා වැටීද?

ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්



පුරා දශක 4ක් ජනතාව දුකින් මුදවා ගත්,
## වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)

පුරාණ විහාරය වේරපිටිය
071-0 314 878

මාගේ දරුවාගේ විභාගයෙන් විශිෂ්ඨ ලෙස සමත් කරදුන් නිසා රත්නපුරයේ සමන්ති කුමාරි විසින් මෙම දැන්වීම පළ කරන ලදී



පාරම්පරික කැඩුම් බිඳුම් පාඨමාලාවට
## සිසුන් බඳවා ගැනීම

- ➢ කාලය අවුරුදු 01
- ➢ රජයේ විභාගයට යොමු වීමේදී ගුරු සහතිකය ලබා දීම

වෛද්‍ය ලේල්වල ගොඩකන්දේ
කේ. පුෂ්පිකා සුෂාන්ති
ටෙලි : 077 - 427 15 75



අපගේ රූපලාවන්‍යාගාරයට
(Unisex) පළපුරුදු කොණ්ඩා කැපීමේ ශිල්පීන් ශිල්පිනියන්, රූපලාවන්‍ය ශිල්පිනියන්/ශිල්පීන් අවශ්‍යයි.
වැටුප රු. 100,000 + කොමිස් (කොළඹ අවටින්)
Tony & dee
129, දුටුගැමුණු වීදිය, කොහුවල.
077 6614 539 / 077 1000 470



ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නොමිලේම සේවාවක් ඔබට ලබාදෙන රජයේ ලියාපදිංචි එකම ආයතනය

## ජයසිකුරු මංගල සේවය

නො. 130 C/D,
නුවර පාර,
මිරිස්වත්ත, ගම්පහ.

දැන්ම අමතා ලියාපදිංචි වන්න.
070 506 6555 / 076 336 33 96
033 221 57 61

ශ්‍රී ලාංකික ඔබ කුමන තරාතිරමක වුවද සහකරුවෙක් හෝ සහකාරියක් බලාපොරොත්තුවෙන් දිවයිනේ කොතනක හෝ දිවයිනෙන් බැහැරව විදේශගතව සිටියද ඔබට ගැලපෙන සහකරු හෝ සහකාරියගේ තොරතුරු ඡායාරූප සහිතව ඒ මොහොතේම ඔබට අතට ලබාදීමට අපි සූදානම්...

ලියාපදිංචිය නොමිලේ...
ඔබගේ විවාහ සිහිනය සැබෑවනු දැකීම අපගේ එකම පැතුමයි.

රජයේ ලියාපදිංචි අංකය WK16905



රු. 35000/- කට වැඩි ආදායමක්
විලාසිතා ඇත්පලඳනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955

එංගලන්තයේ ලන්ඩන් නුවර ශාන්ත ජෝන්වුඩ්හි පිහිටි 'ලෝඩ්ස්' ක්‍රීඩාංගණය හඳුන්වන්නේ ක්‍රිකට් ක්‍රීඩාවේ තිඹිරිගෙය නැතිනම් රන් දෙවොල ලෙසිනි. එනිසාම ලෝඩ්ස්හි ශතකයක් රැස්කිරීම, සෑම පිතිකරුවෙකුගේම සිහිනයකි.

ඒ 2011 ජූලි 03 වැනිදාය. එදා එම ක්‍රීඩාංගණයේ පැවැත්වෙමින් තිබුණේ සංචාරක ශ්‍රී ලංකාවත් එංගලන්තයත් අතර පැවති එක්දින තරඟමාලාවේ තුන්වැනි තීරණාත්මක තරඟයයි. එහිදී මුලින් පන්දුවට පහරදුන් එංගලන්තය පන්දුවාර 50ක් අවසානයේ කඩුලු 7කට ලකුණු 246ක් ලබාගත් අතර ලෝඩ්ස් පිටියේ එය හඹායෑමට අපහසු ඉලක්කයක් බවයි විස්තර විචාරකයින් පැවසුවේ. නමුත් ශ්‍රී ලංකා පිතිකරුවන් සාර්ථකව එකී ඉලක්කය හඹාගිය අතර එහිදී කාගේත් අවධානය යොමුවූයේ ලෝඩ්ස්හි සිය සිහින ශතකය ලබාගත් මුල්පෙළ පිතිකරු දිනේෂ් චන්දිමාල් වෙතය. ඔහු හයේ පහර 2ක් සහ හතරේ පහර 11ක් සමඟින් නොදැවී ලකුණු 105ක් ලබාගත් අතර කඩුලු හයකින් තරඟයේ ජයග්‍රහණයද ශ්‍රී ලංකාවට හිමිවිය. එදින තරඟයේ වීරයා වූයේද චන්දිමාල්ය. දහතුන් වසරකට වැඩි කාලයක් පුරාවට එවන් ජයග්‍රහණය රැසක්ම ශ්‍රී ලංකාවට අත්කරදුන් මේ සුපිරි පිතිකරුවා අදටත් ශ්‍රී ලංකා කණ්ඩායමේ කොඳුනාරටිය බවට පත්ව සිටියි. මේ ඔහුගේ ආදරණීය බිරිඳ වන ඉසිකා ජයසේකර සමඟ සිදුකළ සොඳුරු කතාබහකි.

# ක්‍රිකට් නොගැහුවනම් එයා නීතිඥයෙක් වෙන්න තිබුණා

## දිනේෂ් චන්දිමාල්ගේ බිරිඳ ඉසිකා ජයසේකර






## චන්දිමාල් මුලින්ම මට එයාගේ ආදරේ තරම පෙන්නුවේ 100ක් ගහලා

**ඉසිකා කියන්නේ ක්‍රිකට් පිටිය හොල්ලපු ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක්. ඉතින් ආඩම්බර නැද්ද?**

ඒ ගැන නම් ආඩම්බරයක් වගේම ලොකු සතුටකුත් තියෙනවා. ඒකට හේතුව එයා ක්‍රිකට් ක්‍රීඩකයෙක් වීමම නෙවෙයි. දිනේෂ් චන්දිමාල් කියන්නේ බිරිඳක් ප්‍රාර්ථනා කරන විදියේ සැමියෙක්. ඒ නිසා ඔහු වැනි පුද්ගලයෙකුගේ බිරිඳ වීමට ලැබීම වාසනාවක් කියලයි මට හිතෙන්නේ.

**ඔයාට චන්දිමාල් මුණගැහුනේ කොහොමද?**

2004 අවුරුද්දේ ලංකාවට ආපු සුනාමි ව්‍යසනයට අහුවෙලා චන්දිමාල්ගේ ගෙවල් එහෙමත් නැතිවුණා. එතකොට එයාට සාමාන්‍ය පෙළ ලියන්න පොඩි කාලයයි තිබුණේ. ඉතින් එයා පාඩම් කළේ අපේ අපේ නෑදෑ කෙනෙකුගේ ගෙදරක නැවතිලා. ඒ කාලේ තමයි මට චන්දිමාල් මුණගැහුනේ. ඒ 2005 අවුරුද්දේ.

**හැබැයි ඉතින් ඒ යාළුකම ආදරේකට පෙරළගන්න නම් චන්දිමාල්ට ලේසිවුණේ නැතිලු නේද?**

(සිනාසෙමින්) අපි මුණගැහුනේ 2005 අවුරුද්දේ වුණාට මං එයාට කැමතිවුණේ 2009 අවුරුද්දේ. ඒ විදියට අවුරුදු හතරක්ම අපි යාළුවෝ වගේ හිටියා. එහෙම ඉන්නකොට මං දැක්කා එයා අවංක, නිවුනු, තැන්පත් කෙනෙක් කියලා. එයාගේ ඒ ගතිගුණවලට තමයි මං කැමති වුණේ.

**හැබැයි අපිට ආරංචියි ඔයා එයාට සෑහෙන්න ගණන් ඉස්සුවා කියලා. ඒ කතා බොරුද?**

(සිනාසෙමින්) අපේ පවුල ගොඩාක් අධ්‍යාපනයට නැඹුරුවුණු පවුලක්. මගේ අම්මයි තාත්තයි දෙන්නම විදුහල්පතිවරු. ඉතින් මමත් අධ්‍යාපනයට මුල්තැන දීලා හිටියේ. ඒක නිසා ආදර සම්බන්ධයක් පටන්ගන්න තරම් හිතක් තිබුණේ නෑ. ඒකට බයක් තිබුණා. ඒකයි මුලින් චන්දිමාල්ට එහෙම අකමැතිවුණේ.

**ඔයා එයාට කැමති නොවුණොත් එයා ක්‍රිකට් අතාරිනවා කිව්වද?**

නෑ නෑ එයා කිව්වේ ක්‍රිකට් අතාරිනවා කියලා නෙවෙයි පුහුණුවීම්වලට යන්නෑ කියලා. ඒක එයා මං බය කරන්න කියපු කතාවක්. මොකද එයා ඉස්කෝලේ ක්‍රිකට් ගහපු විදියට මං දැනගෙන හිටියා මං අකමැති කිව්වත් චන්දිමාල් කීයටවත් ක්‍රිකට් නම් අතාරින්නේ නෑ කියලා. ඒ තරමට එයා ක්‍රිකට් එක්කමයි හිටියේ.

**හැබැයි ඔයා එයාට කැමැත්ත දීපු දවසේ චන්දිමාල් මැච් එකකදි සීයකුත් ගැහුවලු නේද?**

මං කැමැති වුණු දවසට පහුවදා ඉස්කෝලේ මැච් එකක් තිබුණා. එදා එයා එකසිය ගාණක් ගැහුවා. ඒ ගහලා ඇවිත් මට කිව්වා "ඔයා කැමති වුණු හින්දා තමයි මං සීයක් ගැහුවේ. දැන්වත් ඔයාට තේරෙනවා නේද මගේ ආදරේ තරම" කියලා.

**එතකොට දෙන්නගේ විවාහය සිද්ධවුණේ කොයි කාලෙද?**

අපි අවුරුදු හයක් ආදරේ කරලා 2015 අවුරුද්දේ විවාහ වුණා. හැබැයි විවාහ වෙන්න කලින්ම 2010 අවුරුද්දේ එයා ජාතික කණ්ඩායමට තේරුණා.

**එයා ජාතික කණ්ඩායමට තේරුණා කියන ආරංචිය දැනෙද්දි ඉසිකා මොකද කළේ?**

මට සතුට වැඩිකමට කරන්නේ මොනවද කියලා හිතාගන්න බැරිවුණා. එදා මං ඒ ආරංචිය දැනගත්තේ ප්‍රවෘත්තිවලට කියද්දි. ඊටපස්සේ මං චන්දිමාල්ට කතාකරලා සුබපැතුවා.

**දැන් ඉසිකා චන්දිමාල් එක්ක ගෙවන ජීවිතේ කොහොමද?**

අපි ඉතින් අද ඊයේ බැඳපු දෙන්නෙක් වගේ හරිම සතුටින් පවුල් ජීවිතේ ගතකරනවා. එයා කොච්චර කාර්යබහුල ජීවිතයක් ගතකළත් අපි ඒක ඒ සතුටට බාධාවක් කරගෙන නෑ.

**ගෙදර ඉන්නෙත් අපි මැච්වලදි දකින නිවුනු චන්දිමාල්මද?**

පිට්ටනියේ ගෙදර කියලා වෙනසක් නෑ එයා කොහැනදිත් එක විදියමයි. හැබැයි ඉතින් ගෙදරදි චූට්ටක් විතර තරහා යන වෙලාවලුත් තියෙනවා. ඒත් ඉතින් ඒකත් පොඩි වෙලාවයි. එයා පිනට දහමට ලැදි කෙනෙක්. පෝය දවසකට ගෙදර එහෙම හිටියොත් අනිවාර්යයෙන්ම එයා ගෙදර සිල් සමාදන් වෙනවා.

**චන්දිමාල් ක්‍රීඩා කරපු තරඟ අතරින් ඉසිකාට අමතකම නැති තරඟයක් තියෙනවද?**

එයා ක්‍රීඩා කරන හැම තරඟයක්ම මට විශේෂ තරඟයක්. ඒත් එයා මුලින්ම ශතකයක් ගහපු එක්දින තරඟය, එංගලන්තයේ ලෝඩ්ස් පිටියේ ශතකයක් ගහපු එක්දින තරඟය වගේම ගිය අවුරුද්දේ ද්විත්ව ශතකයක් ගහපු ටෙස්ට් තරඟය අමතක වෙන්නේ නෑ.

**දෙන්නත් එක්ක පාරතොටේ යද්දි චන්දිට ලැබෙන ප්‍රතිචාර එහෙම කොයි වගේද?**

ප්‍රතිචාර නම් තාමත් එදා වගේම තමයි. ලොකු පොඩි ගැහැනු පිරිමි කියලා වෙනසක් නැතුව හැමෝම චන්දිමාල්ට ආදරෙයි. එයා කොච්චර හදිස්සි ගමනක් යමින් හිටියත් කවුරු හරි කෙනෙක් ඇවිත් ෆොටෝ එකක් ගහමු කිව්වොත් ඒක ගහලම තමයි අර ගමන යන්නේ.

**ඉසිකාට නැන්දම්මා හරි ආදරෙයිලු නේද?**

(සිනාසෙමින්) අනේ ඔව්. එයාට ඉන්නේ පුතාලම පස්දෙනෙක්. මං තමයි විවාහ වෙලා ඒ ගෙදරට ආපු පළවැනි දුව. ඒක නිසා මට එයා හරිම ආදරෙයි. එයා විතරක් නෙවෙයි පවුලේ හැමෝම වගේ ආදරෙයි. මමත් එහෙමයි.

**චන්දිමාල් ඇරුණම ක්‍රිකට් ක්‍රීඩකයින් අතරින් ඔයා කැමතිම කාටද?**

මං කැමතියි ඉන්දියාවේ විරාත් කෝලිට.

**ටුවර් එකක් ගිහින් එද්දි එයා ඔයාට ගෙනාපු ලොකුම තෑග්ග මොකක්ද?**

එයා මුල්ම ටුවර් එක ගිහින් එද්දි මට ලැප්ටොප් එකක් ගෙනාවා. ඒ කාලේ හැටියට ඒක ගොඩාක් ලොකු තෑග්ගක්.

**එයා අදටත් දෙසැම්බර් 26 වැනිදට සුනාමිය ගැන මතක් කරනවද?**

එයාට ඒ දවස අමතක කරන්න බෑ. මොකද එයාට පළවැනි ටෙස්ට් තරඟය ක්‍රීඩා කරන්න ලැබුණොත් 2011 අවුරුද්දේ දෙසැම්බර් 26 දවසක.

**චන්දිමාල් ක්‍රිකට් නොගැහුවා නම් අද මොන වගේ තැනක ඉඳියිද?**

එයාට ඒ කාලේ ලොකු හීනයක් තිබුණා නීතිඥයෙක් වෙන්න. මං හිතන්නේ ක්‍රිකට් නොගැහුවා නම් එයා අනිවාර්යයෙන්ම නීතිඥයෙක් වෙන්න තිබුණා.

**එයා ක්‍රිකට්වලින් සමුගන්න කලින් ඉසිකා චන්දිමාල්ගේ පිත්තෙන් දකින්න ආසම ඉනිමක් එහෙම තියෙනවද?**

මං හිතන්නේ චන්දිමාල් අවුරුදු 13ක් ක්‍රිකට් පිටියේ හිටියත් එයා එයාගේ හොඳම ඉනිම තාමත් සෙල්ලම් කළේ නෑ. මං ගොඩාක් ආසාවෙන් ඉන්නවා ඒ ඉනිම එයාගෙන් බලන්න.

■ රුවන් එස්.සෙනවිරත්න

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.